**සාමය කරා මාවතේ දී**
**ජනවාර්ගික විවිධත්වය හා ගැටුම් වාර්තාකරණය : ශ්‍රී ලංකාවේ යහපත් ජනමාධ්‍ය භාවිතාව සඳහා වන සමීක්ෂණය හා මඟපෙන්වීම**

ISBN : 955-8037-86-9

**කර්තෘවරුන්** සුනන්ද දේශප්‍රිය සහ ජැකලින් පාර්ක්

**ස්තුතිය** අන්ජා කියුපර්ස්, කැතරින් මැක් මැහොන්, ජෝජියා රයිඩ්,
සංජන හත්තොටුව, ආචාර්ය පී. සරවනමුත්තු හා
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මාධ්‍ය අංශය

**සැලසුම** ලුයී සමර්ටන්, ග්ලැඩ්ෆ්ලයි මීඩියා

**ඡායාරූප** බුද්ධික වීරසිංහ, ශ්‍රියන්ත වල්පොල හා ගඩ්ෆයි මීඩියා

**කාටූන්** ජූඩ් හොරවෙක්

මෙම ලියවිල්ල සකස් කරන ලද්දේ එක්සත් ජනපද සාම ආයතනයේ (යූ. එස්. අයි. පී.) මූල්‍ය ආධාර මත ය. මෙහි අඩංගු අදහස් ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ වන අතර කිසිම අයුරකින් ඒවා එක්සත් ජනපද සාම ආයතනයේ නිල මතය ප්‍රකාශ වීමක් ලෙස සැලකිය යුතු නොවේ.

මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කවර ආකාරයකින් හෝ ප්‍රකාශකගේ ලිඛිත අවසරයකින් තොරව යළි ප්‍රකාශයට පත් නො කළ යුතු ය. මෙම ග්‍රන්ථයෙහි හිමිකම් කර්තෘවරුන් සතු වන අතර මෙහි අඩංගු ලිපි පරිහරණය කිරීමේ අයිතිය කර්තෘවරුන් වෙත පැවරේ.

# පටුන











හැඳින්වීම 3

ගැටුම හා ජනවාර්ගිකත්වය - වාද විෂයයන් 5
බෙදුණු අවශ්‍යතා
ජනමාධ්‍ය භූමිකාව
සත්‍යය, සාමය, සහ විෂය මූලිකත්වය

පර්යේෂණ වාර්තාව: මහා විභේදනය - ජනමාධ්‍යවේදීන් සිතන ආකාරය සහ ඔවුන් වාර්තා කරන ආකාරය 7
සිද්ධි අධ්‍යයන වාර්තාකරණය: ජනවාර්ගිකත්වය අවධාරණය කිරීම
ශ්‍රී ලංකාවේ අස්ථාවරභාවය: ගැටුමෙහි පසුබිම

අපගේ සදාචාරාත්මක රාමුව බැඳ තබන බැමි 11
ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ආචාරධර්ම පද්ධතිය පිළිබඳ ජ. ජා. ස. ප්‍රතිපත්ති ප්‍රකාශනය

නිරවද්‍යතාව, ඕපාදූප සහ සත්‍යය ප්‍රකාශ කරන්නන් 12

ඇසට පෙනෙනවාට වැඩි යමක් 13

ජනවාර්ගික බෙදීම 14
ජනවාර්ගිකත්වය යනු එදිරිවාදිකම නොවේ

සියලු ම පැති ආවරණය කිරීම 15
මාධ්‍ය නිරීක්ෂණය: “නිල” සුනාමි පුවත්

කතාව සම්පූර්ණ වන්නේ අදහස් ගණනාවකිනි 17
ස්ත්‍රීපුරුෂ සමාජ භාවය : ගැටුම් තත්ත්වයක දී
ප්‍රවෘත්ති කාමරයේ විවිධත්වය
පුවත් භාෂාව
ළමුන්ගේ හඬට සවන් දීම
වෙනත් කාණ්ඩවල ජනයා හා සම්මුඛ සාකච්ඡා කිරීමට උපදෙස්

මූලයෙන් ම ලබා ගැනීම 20
පක්ෂපාතිත්වය ගැන කටයුතු කිරීම
සංස්කාරක ස්වාධීනත්වය

ජ.ජා.ස. ගැටුම් වාර්තාකරණයට මග පෙන්වීම් 21

ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාකාරී ක්‍රියා කලාපය සඳහා ජාත්‍යන්තර නීතිරීති පද්ධතිය 22

ප්‍රයෝජනවත් මූලාශ්‍ර හා ආශ්‍රිත ග්‍රන්ථ නාම ලේඛනය 23

# හැඳින්වීම

ක්‍රෝධයේ පල්ලමෙහි අප ප්‍රීතියෙන් දුවන විට
නුදුටු ගලක් ලෙස ඔබ අප පා පැකිළී වට්ටනු ලබයි
අප විකාරයෙන් කොටුවී සිටින විට ම
දුරකථනයක් ලෙස ඔබ අපට බාධා පමුණුවයි

**ඩබ්. එච්. අවුඩන්**

සටන් විරාමය තවමත් පැවතුන ද, දීර්ඝකාලීන සාමය තවදුරටත් ශ්‍රී ලංකාව මගහරිමින් සිටී. 2004 වර්ෂයේ අග දී සුනාමිය කඩා වදින අවස්ථාව වන විට රට අන්තරායකාරී ලෙස නැවත යුද්ධයකට ඉතා ආසන්න තත්ත්වයක විය. සුනාමියේ බිහිසුනුකම හා ඉන් ඇති වූ විනාශය සමග ජනමාධ්‍යවේදීන් හට නව අභියෝග රැසක් ඇති විය. සුනාමිය හා බැඳුණු නොයෙකුත් පුවත් මෙන්ම, දැවැන්ත ප්‍රතිනිර්මාණ කටයුතු ආරම්භ වීමත් සමග බලධාරීන් එම කටයුතුවලට වගකීමට බැඳතැබීම වැනි කටයුතු විය.

සමාජයන් පීඩනයට පත් වී සිටින විට, ඔවුන්ට බලපාන ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රජාවට සත්‍ය තොරතුරු දැන ගැනීමට ඉඩ ප්‍රස්තා තිබීමේ වැදගත්කම අත්දැකීම් මගින් අප උගෙන ඇත.

බහු ජනවාර්ගික සමාජයන්හි එදිනෙදා සිද්ධීන් වාර්තාකරණයේදී ඇතැම් විට සමාජයේ පවතින ආතතිය ප්‍රකෝපකාරී වන අතර ඇතැම් විට සමනය වන බව ජනමාධ්‍යවේදීන් අත්විඳ ඇත. ප්‍රචණ්ඩකාරී ගැටුම් සහ දේශපාලන කැලඹීම් මගින් චිත්තවේග තියුණු වන අතර සිද්ධීන් තේරුම් ගැනීමේ හැකියාවට බාධක පමුණුවයි. කෙසේ වෙතත්, ජනමාධ්‍යවේදීන්ගේ කාර්යය වන්නේ එක් පැත්තකට හෝ අනිත් පැත්තට ආවැඩීම නොවේ.

අපගේ කාර්යය වන්නේ, අපගේ වාර්තාකරණය මගින් හා කරුණු එළිදරව් කිරීම මගින්, අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාගේ සංස්කෘතික, ආගමික, ජනවාර්ගික හෝ වෙනත් වෙනස්කම් තේරුම් ගැනීමට උදව් වීමයි. මෙයින් අදහස් වන්නේ කරුණු වසන් කිරීම හෝ මතබේද යටපත් කිරීම හෝ නොවේ. එයින් අදහස් වන්නේ කරුණුවල සංකීර්ණභාවය තේරුම් ගනිමින් වාර්තා කිරීමයි.

එනම්, මතුපිටින් දෘශ්‍යමාන වන දේට එපිටින් වඩා ගැඹුරට කිඳා බැස, සම්පූර්ණ සංසිද්ධිය අනාවරණය කර ගැනීමයි. ඉන් අදහස් වන්නේ නව මූලාශ්‍ර හා නව අදහස් සෙවීම මගින් විවිධත්වය ඉවසීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සඳහා නව අවස්ථා උදා කර ගැනීමයි.

ගැටුම හා සාමාන්‍ය පුරවැසියන් කෙරෙහි එහි බලපෑම තේරුම් ගැනීමට ඉඩ ලබාදීමෙන් හා ඊට විසඳුම් සෙවීමෙන්, අවිනිශ්චිතභාවය පහවීමට වැඩි ඉඩ ප්‍රස්තාවක් ලැබේ.

## වෘත්තීයමයභාවය

ප්‍රායෝගික වශයෙන් මින් අදහස් වන්නේ කුමක්ද?

අපට කළ හැකි මූලික ම හා වැදගත් ම දෙය සරල ව කියන්නේ නම්, අපේ රාජකාරිය වෘත්තීමය ලෙස, නිවැරදි ලෙස සහ ආචාර ධර්මානුකූල ව ඉටු කිරීමයි. මූලික දේවල් නිසියාකාර ව තේරුම් ගත යුතුයි.

## වගකිවයුතුභාවය

දෙවනු ව, අපගේ අයිතිවාසිකම් හා වගකීම් අභ්‍යාස කරමින්, ගැටුම් පවත්නා අවස්ථාවක නිදහස් සමාජයක් පවත්වාගෙන යෑම සඳහා අපගේ වෘත්තිය නිදහසේ හැසිරවීමේ වැදගත්කම අප විසින් වටහා ගත යුතු ය. අප මෙම අයිතිවාසිකම් ක්‍රියාවේ යොදවන්නේ අප විසින් සේවය සලසනු ලබන ප්‍රජාවේ නියෝජිතයින් ලෙස බවත්, ඔවුන් වෙනුවෙන් සාධාරණ ලෙස, නිවැරදි ව සහ අවංක ලෙස වාර්තාකරණය කිරීමට අපට වගකීමක් ඇති බවත් සෑම කල්හි ම අප සිහියේ තබාගත යුතු ය.

## සාමූහිකත්වය

තුන්වැනි කරුණ පුවත්පත් කලාවේදීන් අතර සාමූහිකත්වය හා අන්‍යෝන්‍ය ආධාරය ගොඩනැගීමයි.

සාමූහිකත්වය යනුවෙන්, අප සියලු දෙනා ම දේශපාලනික වශයෙන් එකඟවීමක් හෝ විවිධ රටවල සිටින පුවත්පත් කලාවේදීන් හෝ නොයෙකුත් කණ්ඩායම්වලට අයත් අය, විවිධ පුවත්පත්වලට අයත් අය හෝ ප්‍රතිවාදී චැනල්වලට අයත් අය අතර තරගකාරී බවක් නො තිබීම හෝ අදහස් නොවේ. සාමූහිකත්වය පදනම්වන්නේ අපගේ වෘත්තියේ වැදගත්කම පිළිබඳ පොදුවේ එකඟතාවයක් තිබීමත්,




1983 ඇරඹි යුද්ධයෙන් සියලුම ජන කොටස් අතර අභ්‍යන්තර කැළඹීම් ඇතිවිය.

හොඳහිත පවත්වා ගැනීමට කැපවීමත් සහ සතුරන් නොවී කිසියම් කරුණක් ගැන වෙනස් මත දැරීමේ අයිතිය පිළිගැනීමත් වේ. භාෂණයේ නිදහස යනු එකඟ නොවීමට ඇති අයිතියයි.

ඉතාමත්ම මූලික මට්ටමේ දී, ජනමාධ්‍යවේදීන් ඔවුන්ගේ කාර්යභාරය ආරක්ෂිත ලෙස ඉටු කිරීම සඳහා අන්‍යෝන්‍ය සහයෝගය ලබාදීමටත් ආචාරධර්ම පද්ධතියකට එකඟ වී එය තහවුරු කොට ඉදිරියට පවත්වාගෙන යෑමටත් ක්‍රියා කිරීම අවශ්‍ය වේ. ආචාරධර්ම පද්ධතියකට අනුකූල ව ක්‍රියාකරන වෘත්තීය ජනමාධ්‍යවේදීන්, භේද උපදවන අරගලයකදී වුව කලහකාරී වියයුතු නො වේ.

## ජ. ජා. ස. අත්දැකීම්.

ගැටුම් අවස්ථාවලදී ඔවුන්ගේ ක්‍රියා කලාපය සහ වගකීම් පිළිබඳ ව සාකච්ඡා හා වාද විවාද පැවැත්වීමේ බලවත් සම්ප්‍රදායක් ජනමාධ්‍යවේදීන් සතු වේ. මේවා ඔවුන්ගේ ජාතික සංගම් හා සංවිධාන තුළින් ද ජාත්‍යන්තර වශයෙන් ජ. ජා. ස. තුළින් ද කරනු ලැබේ. ජ. ජා. ස. අවුරුදු පහක සිට ජනමාධ්‍යවේදය සමග ගැටුමට හා සාමයට අදාළ ව ජනමාධ්‍යවේදය මුහුණදෙන අභියෝගයන් පිළිබඳ ව කටයුතු කරමින් සිටී.

පසුගිය මාස 18 තුළ, මෙමගින් ජනමාධ්‍යවේදීන් හා කර්තෘවරුන් ඇතුළත් සමීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක විය. පුවත් වාර්තාකරණය විමර්ශනය කිරීම, ගැටුම් සංවේදී ජනමාධ්‍යවේදීන්ගේ හා ජනමාධ්‍යවේදීන් පුහුණු කරන්නන්ගේ ජාලයක් ගොඩනැගීම ද මීට අයත් විය. දිවයින පුරා විසිරී සිටින ජනමාධ්‍යවේදීන් හා කර්තෘවරුන් සමග පුහුණුවීම් මූල සම්පත් වැඩි දියුණු කිරීම, වට මේස සාකච්ඡා, රැස්වීම් සහ පුහුණු වැඩමුළු පැවැත්වීම ඊට ඇතුළත් විය. තුන්සියයකට අධික ජනමාධ්‍යවේදීන් සමඟ කරන ලද සංවාද,, වාද විවාද සහ අත්දැකීම් මගින් ලත් කරුණු ද, මීට පෙර ශ්‍රී ලංකාවේ පවත්වන ලද වැඩසටහන් තුළින් මතු වූ කරුණු ද මෙම වාර්තාවට පදනම් විය.

ජ. ජා. ස. සහ ශ්‍රී ලංකාවේ සංවිධාන විසින් ඒකාබද්ධ ව පවත්වන ලද පර්යේෂණ හා සංසදවලට සහභාගී වූ බොහෝ දෙනෙකුගේ අදහස් මෙම කුඩා අත් පොතෙහි පිළිබිඹු වේ. එම සංවිධාන අතර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, දෙමළ මාධ්‍ය සන්ධානය සහ මුස්ලිම මාධ්‍ය සංසදය ද වේ.

ගැටුම්කාරී තත්වයන් වාර්තාකරන ජනමාධ්‍යවේදීන්ගේ හොඳම භාවිතයන් හා අභියෝගයන් තේරුම් ගැනීමට අයි. එෆ්. ජේ. ගෝලීය වැඩසටහන් මගින් ලද අත්දැකීම් හා සම්පත් මිල කළ නො හැකි ය. අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනමාධ්‍ය වැඩසටහනින් අප උකහා ගත් දෑ බොහෝ ය. එවකට වැඩ සටහන් අධ්‍යක්ෂක වූ ෂා පෝල් මාකෝස් විසින් මෙහෙයවනු ලැබූ මෙමගින්, විශේෂයෙන් ම ජනවාර්ගික ගැටුම්, වාර්තාකරණය, විවිධත්වය හා මානව අයිතිවාසිකම් ගැන ලබාගත් දැනුම් සම්භාරය බොහෝ ය. මෙම පොතේ අවසානයේ දී මෙම ප්‍රකාශනවල යොමුවක් දක්වා ඇත. ජ. ජා. ස. වෙබ් අඩවියෙන් ද මෙම විස්තර ලබාගත හැක.

## මෙම පොත භාවිතා කළ යුත්තේ කෙසේද?

මෙම පොතෙහි අඩංගු වන්නේ ගැටුම් වාර්තා කිරීමේදී ජනමාධ්‍යවේදීන්ගේ ආකල්ප හා අත්දැකීම් සම්බන්ධයෙන් කරනලද පර්යේෂණ මගින් සොයාගත් කරුණු ය. මාධ්‍ය නිරීක්ෂණ අභ්‍යාස දෙකක ප්‍රතිඵල ඊට අයත් වේ. පළමුවැන්න මාධ්‍ය විසින් ගැටුම් ආවරණය කළ අන්දම යි දෙවැන්න, සුනාමියෙන් පසු මාධ්‍ය ක්‍රියා කළ ආකාරය යි.

මාධ්‍යයන්හි ක්‍රියා කලාපය පැහැදිලි ලෙස දක්වන ගැටුම් වාර්තාකරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන වාර්තා කීපයක් ද මීට ඇතුළත් වේ. මෙය අපගේ වාර්තාකරණයේ බලපෑමේ සැබෑ තත්ත්වය පිළිබඳ ව වැදගත් පාඩම් කීපයක් ඉගෙනීමට ජනමාධ්‍යවේදීන්ට සහ අනිකුත් අයට උදව් වේ. ඒවා බැලීමෙන් වාර්තාකරණය තවදුරටත් වැඩි දියුණු කළ යුත්තේ කෙසේ දැ යි අපට විමසා බැලිය හැක. ජනමාධ්‍යවේදීන්ගේ පර්යේෂණ මගින් හුවා දක්වන ලද කරුණු පිළිබඳව කෙරුණු සාකච්ඡා වලින් පසුව ය මෙම සිද්ධි අධ්‍යයන සකස් කර ඇත්තේ. මෙමගින් අප වර්තමාන තත්ත්වය ගැන පැහැදිලි චිත්‍රයක් ලබා දෙන අතර, එය වැඩි දියුණු කළ හැකි ආකාර ගැන ද ඉඟියක් ලබා දෙයි.

මෙම පොතෙහි අභිප්‍රාය වන්නේ පුවත්පත් කලාවේදීන්ට ප්‍රායෝගික අත්පොතක් වශයෙන් භාවිතා කළ හැකි වීමයි. එබැවින්, යහපත් භාවිතය සඳහා පෙළඹවීමක් වශයෙන් සෑම අංශයක් අවසානයේදී ම ප්‍රශ්න කීපයක් ඇතුළත් කොට ඇත. සාකච්ඡා සඳහා අදාළ මෙම කරුණු, සිද්ධි අධ්‍යයන සමග ගත් කළ ප්‍රවෘත්ති කාමරයේ හෝ මාධ්‍ය රැස්වීමක සාකච්ඡා සඳහා උදව් වනු ඇත. එසේත් නැත්නම්, ජනමාධ්‍යවේදියකුට හෝ වේදිනියකට තමාගේ හෝ තම සගයන්ගේ වැඩ කටයුතු පිළිබඳ ව ආවර්ජනයක යෙදීමට යොදා ගත හැකි ය. පුහුණු කරන්නන්ට, පුද්ගලයින්ට හා සංවිධානවලට මෙම පොත භාවිතා කොට සාකච්ඡා සඳහා උනන්දු කළ හැකිවාක් මෙන්ම, ආචාරධර්මානුකූල වාර්තාකරණයන් ශක්තිමත් කිරීමට ද, මෙම වෘත්තියේ හා ආචාරධර්මානුකූල වාර්තාකරණයේ ඉහළ ම තලයට නැග ගැනීමට අපේක්ෂා කරන ජනමාධ්‍යවේදීන්ට හා අනිකුත් අයට ද මෙම පොත උපකාර වනු ඇත.

මෙම වාර්තාවේ පර්යේෂණ විෂය ගොඩනැගී ඇත්තේ, ඩෙන්මාර්ක් ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගීතාවේ ආධාර උපකාර ඇතිව, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් පිළියෙල කරන ලද, "ගැටුම් සංවේදී ජනමාධ්‍යවේදය" නමැති ප්‍රායෝගික අත්පොත මත ය. ජනමාධ්‍යවේදීන්ට වඩා හොඳ ගැටුම් වාර්තාකරණයක් සඳහා මෙම පොතේ අඩංගු ප්‍රායෝගික ඉඟි යොදාගත හැක. මේ පිළිබඳ ව කියවිය යුතු පොත් පත් උප ග්‍රන්ථයෙහි දක්වා ඇත. මෙම මූලාශ්‍ර බොහොමයක් ජ. ජා. ස. යේ ආසියා පැසිෆික් වෙබ් අඩවිය මගින් ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ගත හැක.

ඔබේ ප්‍රවෘත්ති කාමරයේ සාකච්ඡා ආරම්භ කිරීමට, ප්‍රාදේශිය පුවත්පත් කලාවේදීන්ගේ සංගම්, මාධ්‍ය සමාජ, වෘත්තීය සමිති මගින් වාද විෂයන් මතු කිරීමට හා වාර්තාකරණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට ද, ආවරණයේ විවිධත්වය සහ පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂාව ගැන ප්‍රාදේශීය ජන කොට්ඨාශ සමග සංවාදයක යෙදීමට ද මෙම අත්පොත භාවිතා කළ හැක.

අවසාන වශයෙන්, කර්තෘ මණ්ඩල ස්වාධීනත්වය හා මාධ්‍ය නිදහස පුවත්පත් කලාවේදීන් විසින් අතිශය වැදගත් කරුණක් ලෙස සලකනු ලබන්නේ මන්ද යන්න ගැන සැඟවුණු ඇත්ත දැන ගැනීම සඳහා දේශපාලනඥයින්ට හා මාධ්‍ය ආයතන අයිතිකරුවන්ට මෙම පොත ප්‍රයෝජනවත් මෙවලමක් විය හැක. එමෙන් ම, කල් පවතින යහපත් දේශපාලන නායකත්වයක් විසින් මාධ්‍යයේ විවිධත්වය උනන්දු කළ යුත්තේ හා ආණ්ඩුව පාරදෘශ්‍ය විය යුත්තේ මන්ද යන්න ගැනත්, පුවත්පත් කලාවේදීන් අතර නිදහස් ජීව ගුණයක් තිබීමත්, අවදානම් සහිත කටයුතුවලට ලැදිකමක් දැක්වීමත් තේරුම් ගැනීමට හැකිවනු ඇත.

## ජැකලයින් පාර්ක්

අධ්‍යක්‍ෂ
ජ. ජා. ස. ආසියා පැසිෆික්

# ගැටුම් සහ ජනවාර්ගිකත්වය - වාද විෂයයන්

## බෙදුණු අවශ්‍යතා

වෙනස් වීම් සිදුවන කාල පරිච්ඡේදයන්හි ගැටුම් ඇති වීම සාමාන්‍ය දෙයකි. කෙසේ නමුත් වෙනස් වීම් සියලු දෙනාටම සාධාරණ ලෙස සියලු දෙනාගේ ම ඕනෑ එපාකම්වලට අනුකූල වන සේ කළමනාකරණය නො කළ විට එම ගැටුම ප්‍රචණ්ඩ ස්වභාවයක් ගනී.

බලය සහ සම්පත් බෙදාහැරීමේදී සිදුවන අසමානකම් හේතුකොටගෙන සමාජයේ නොයෙකුත් කොටස් එකිනෙකාට එරෙහිව කඳවුරු බඳී. ජනවාර්ගික කණ්ඩායම් වැනි කණ්ඩායම් වශයෙන් ඔවුන් එකිනෙකාට විරුද්ධ ව කඳවුරු බැඳ, බලය හා සීමිත සම්පත් සඳහා තරඟ වදී.

ජනවාර්ගික, සංස්කෘතික හා ආගමික කණ්ඩායම් අතර සන්නිවේදනය බිඳවැටුණ විට හා පැරණි දුක්ගැනවිලි නොවිසඳී පවතිනවිට ගැටුම්කාරී තත්ත්වයන් ඇතිවිය හැක.

ජනවර්ගයක්, පොදු පාරම්පරික වංශයක්, ආගමක්, භාෂාවක්, ඉතිහාසයක්, සංස්කෘතියක් සහ සියල්ලට ම වඩා වැදගත් ව පොදු අනන්‍යතාවය පිළිබඳ හැඟීමක්, ආදියෙන් යුක්ත ය.

*ජනමාධ්‍යවේදීන්, ජනයාට බහුවිධ අනන්‍යතා ඇති බව මතක තබා ගත යුතු ය.*

ඔවුන් ඔවුන් ව දකින්නේ පුද්ගලයෙකු විධියට, පිරිමියෙකු හෝ ගැහැණියක ලෙසට, පවුලක කොටසක් හැටියට, රටක පුරවැසියෙකු වශයෙන් හෝ ඇතැම්විට ජනවාර්ගික කණ්ඩායමක කොටසක් ලෙස ය. ශ්‍රී ලංකාවේ නම් මෙය මුස්ලිම්, සිංහල හෝ දෙමළ විය හැක. ඔවුන්ගේ ජනවාර්ගික අනන්‍යතාවය අවධාරණය වන ප්‍රමාණය තීරණය වන්නේ ඓතිහාසික, දේශපාලනමය හා සමාජ අත්දැකීම් අනුව සහ ඔවුන් ජීවත්වන ප්‍රදේශයෙහි පවතින සමගිය හෝ අවිනිශ්චිතභාවය මත ය.

## ජනමාධ්‍යවේදයේ භූමිකාව

දීර්ඝ කාලයක් යුද වාර්තාකරුවකු ලෙස ක්‍රියා කළ ප්‍රවීණයෙකු වන ක්‍රිස් හෙජස්, මාධ්‍ය සහ රජය, යුද්ධය පිළිබඳ මිථ්‍යා ප්‍රබන්ධ පවත්වාගෙන යාමේ ප්‍රධාන සාධකයන් දෙකක් ලෙස හඳුනාගන්නා ලදී. ජනමාධ්‍යවේදීන්, විශේෂයෙන්ම, චිත්ත ධෛර්යය නොනැසී පවත්වාගෙන යෑම සිය මෙහෙවර ලෙස දකී. 'යුද්ධයේ බොරුව නම් සෑම විටක ම පාහේ පැහැර හැරීමේ බොරුවයි' යනුවෙන් හෙජස් පවසයි.

'අවසාන ජයග්‍රහණ  මාවතේ මං සලකුණු ලෙස පරාජයන් හඳුනාගනිමු. අප අපේ සතුරන් යක්ෂයින් බවට පත්කොට ඔවුන් තව දුරටත් මිනිසුන් බව ප්‍රතික්ෂේප කරමු. අපි, අපම සහ අපේ මිනිසුන්, අන්තිම යහපත් පුද්ගලයින් ලෙස හඳුන්වමු. එක් පැත්තක් අනිත් පැත්ත දකින්නේ දේවල් ලෙස ය - අවසානයේ මළමිනී ලෙස ය.' (හෙජස් - 2002)

*මිථ්‍යා ප්‍රබන්ධ මත පදනම් වූ යුද්ධයේ සංසිද්ධීන්වලට බොරු වටිනාකමක් ආරූඪ කරනු ලැබේ.*

ගැටුම් සමථයකට පත් කිරීම ජනමාධ්‍යවේදීන්ගේ කාර්යභාරය නො වුව ද, අවංක හා බහුවිධ දේශපාලන විවාදයක් ගොඩනැගීම සම්බන්ධයෙන් මාධ්‍යයට වැදගත් ක්‍රියා කලාපයක් පැවරේ. එමෙන් ම ප්‍රශ්නයට තුඩු දී ඇති කරුණු සම්බන්ධයෙන් හා අවිනිශ්චිත බව ලිහිල් කරන ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැපයීම සඳහා සාධාරණ වර්ධනයක් සඳහා අවශ්‍ය කොන්දේසි නිර්මාණය කිරීම, සහ සමාජයේ වෛරය හා විරුද්ධවාදීකම් වර්ධනය වීමට හේතුවන නූගත්කම හා බිය සමනය කිරීම, මාධ්‍ය මගින් ඉටු කළ හැක.

මෙය කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් විසින් ගැටුමේ මූලාරම්භය හා ඊට හේතු පාදක වූ කරුණු පරීක්ෂා කර බැලිය යුතුය. ප්‍රශ්න නිරාකරණය සඳහා වන ප්‍රායෝගික යෝජනා පිළිබඳ ව ප්‍රබල ලෙස වාර්තා කිරීමට හැකි වන්නේ එවිට ය. ගැටුම් පවතින කාලයන් හි වාර්තාකරණයේ යෙදෙන ජනමාධ්‍යවේදීන්ට, යුද්ධය හා සාමය පිළිබඳ වාර්තාකරණ ආයතයනය විසින් වගකීම් හයක් නිර්දේශ කරයි.

*ගැටුම්වල ස්වභාවය තේරුම් ගැනීම* - ඒවා වර්ධනය වන්නේ කෙසේද යන්න සහ ඒවාට විසඳුම් මතුවන ආකාරය.

*සාධාරණව වාර්තාකරණය* - සියලු ම කණ්ඩායම්වල සංකීර්ණත්වය සහ ඔවුන්ගේ අදහස් වාර්තා කිරීම සහ අපගේ කිසියම් පක්ෂපාතිත්වයක් ඇත්නම්, ඒ බව පැහැදිලි ව පාඨකයින්ට සහ නරඹන්නන්ට ඉදිරිපත් කිරීම.

*ගැටුමට හේතු හා එහි පසුතලය වාර්තා කිරීම* - සියලු පාර්ශ්වයන්ගේ නීත්‍යානුකූල මෙන්ම කල්පිත දුක් ගැනවිලි නිවැරදිව නියෝජනය කිරීම සහ කල්පිත දුක්ගැනවිලි පවා ගැටුම් ඉදිරියට පවත්වාගෙන යෑමටත් එම ගැටුම් නිරාකරණයටත් වැදගත් බව පාඨකයිනට සිහිපත් කරදීම.

*මානුෂීය අංශය ඉදිරිපත් කිරීම* - ගැටුමින් විපතට පත්වූවන්ගේ චිත්තවේගී කම්පන සහ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ විස්තර, සමබරව, වෘත්තීය මට්ටමින් සහ ඒවායින් වාසියක් නොලබන ලෙස ඉදිරිපත් කිරීම. මෙය එම පුද්ගලයින්ට මෙන්ම අපේ පාඨකයින්ට ද ඉටු විය යුතු වගකීමකි.

*සාමය සඳහා කෙරෙන උත්සාහයන් වාර්තා කිරීම* - සෑම විට ම සෑම තන්හි ම සාමය හා සමාදානය සඳහා වෙහෙසෙන අය මෙන් ම, ගැටුම කුපිත කරවීමට කැසකවන අය පිළිබඳව ද මූලික මල්ලවයන්ට අතිරේක ව නව මූලාශ්‍ර සෙවීම, වාර්තා කිරීම.

*අපගේ බලපෑම ගැන අවබෝධයෙන් සිටීම* - අපගේ වාර්තාකරණය ගැටුමට සහ ඊට මැදි වූ ජනයාට කුමන ආකාරයට බලපාන්නේ ද යන්න ගැන වැටහීමක්.

## සත්‍යය, සාමය සහ විෂය මූලිකත්වය

*"මාධ්‍යයට අයත්වන ජනමාධ්‍යවේදීන්, ප්‍රකාශකයින් සහ කර්තෘවරුන් සමාජයෙන් වෙන් වූ අය නොවෙති. සමාජයේ පවතින බෙදීම්, විරුද්ධවාදීකම් හා පක්ෂපාතීකම් වලට ඔවුහු ද කොටස්කරුවෝ වෙත්. තමන් වෙත පැවරී ඇති කාර්යභාරයේ බලවත්කම ගැන හැඟීමක් ඇති ඔව්හු, ඔවුන් අයත් පාර්ශ්වයේ ඕනෑ එපාකම් වෙනුවෙන් උනන්දුව ක්‍රියා කරනු දැකිය හැක"*

ජෙහාන් පෙරේරා, නිතර නිතර ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ව 'ඩේලි මිරර්' පත්‍රයට ලිපි සපයන්නෙකි.

ජනමාධ්‍යවේදියකුට සාමය සඳහා වන න්‍යාය පත්‍රයක් අනුගමනය කරමින්, ඒ හා සමගාමී ව සත්‍යය හා විෂය මූලිකත්වය සඳහා කැපවීමක් තිබිය හැකිද?

විෂය මූලිකත්වයේ නියම වටිනාකම වන්නේ එමගින් නිල ප්‍රකාශනවල අඩංගු දේ මතුපිටින් පෙනෙනාකාරයට ම පිළි නොගැනීමට ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටීමයි. එය මතවාද විශාල ප්‍රමාණයකට බල කරයි. බොහෝ ජනමාධ්‍යවේදීන් එක් නිල මූලාශ්‍රයක් කෙරෙහි තොරතුරු සඳහා විශ්වාසය තබා ඇති ශ්‍රී ලාංකික සන්දර්භය තුළ, සමබර වාර්තාකරණයක් සඳහා බොහෝ අදහස් ලබාගැනීම වැදගත් වේ.

විෂය මූලිකත්වය පදනම් වූ ජනමාධ්‍යවේදය මගින් සත්‍යය වාර්තා නො වන බව ඇතැම් විට යෝජනා වී තිබේ. මෙය විශේෂයෙන් ම අන්තරායකාරී වන්නේ කිසියම් කරුණක් සම්බන්ධයෙන් ලබාගත් කරුණු විෂය මූලිකත්වය පදනම් කොටගෙන සමබර වන සේ ඉදිරිපත් කොට පාඨකයාට තීන්දු කිරීමට ඉඩ තැබීමයි. මෙල්බෝන් විශ්ව විද්‍යාලයේ ආචාර ධර්ම විද්‍යාඥ නීල් ලෙවී ට අනුව මෙහි ඇති භයානකකම නම් "අවිචාරවත් ව සමබර වාර්තාකරණයෙන් සිදුවන්නේ විෂ්‍ය මූලිකත්වයක් නොව, සත්‍යය සම්පූර්ණයෙන් ම විකෘති වීමයි." (ලෙවි 2004)




එක් වාද විෂයයක් නම්, විශේෂයෙන් ම ගැටුම්වලදී, සෑම ස්ථාවරයක් ම එක හා සමාන වැදගත්කමක් නො උසුලන බවයි. එබැවින් එක් එක් ස්ථාවරයේ අදාළ වැදගත්කම ගැන ජනමාධ්‍යවේදියා විසින් තක්සේරු කොට, ඒවා සාධාරණව හා තමන්ගේ හෘද සාක්ෂියට එකඟ ව වාර්තා කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන්, බොහෝ දෙනා පිළිගනු ලබන පිරිදි, ළමා සොල්දාදුවන් බලහත්කාරයෙන් බඳවා ගැනීම වරදක් නම්, එසේ බඳවා ගන්නා අය කෙරෙහි විශ්වාසයක් ඇති වන පරිදි අපගේ වාර්තාකරණය සාධාරණ නොකළ යුතු ය.

කෙසේ වෙතත්, මෙයින් ප්‍රචාරක වාසි ලබාගැනීම සඳහා අවස්ථාවක් ලබා නොදිය යුතු ය. පුවත්පත් කලාවේදීන්ට තමන්ගේ පක්ෂග්‍රාහීභාවය අවම කොට ගෙන විවිධ මත සාධාරණ ලෙස වාර්තා කිරීමට යුතුකමක් තිබෙන බව ලෙවි මතක් කර සිටියි.

ජනමාධ්‍යවේදීන්ගේ, සත්‍යයට ඇති බැඳීම හා වගකීම සාධාරණය සඳහා ඇති බැඳීම හා වගකීම සමග පෑහෙන ලෙස සකස් කර ගැනීම අවශ්‍ය වේ. දෙපැත්තේ ම අදහස් ලබා ගැනීමෙන් පමණක් සත්‍යයේ අරමුණු ඉටු නොවේ. විෂය මූලිකව ඉදිරිපත් කළ ද, නිල සත්‍යයෙන් ඔබ්බට, එහි නියම ආනිසංස තේරුම් ගැනීම සඳහා ජනයා කැඳවාගෙන යා හැකිවන්නේ කෙසේ දැ යි සොයා බැලිය යුතු ය.

කතාවක් තව දුරටත් ඉදිරියට ගෙන යෑම සඳහා අප විසින් විෂය මූලිකත්වය ඉක්මවා ගවේෂණය කළ යුතුය. එහි සත්‍ය-අසත්‍යභාවය එළිදරව් වනතෙක්, විශ්ලේෂණය කිරීම, පැහැදිලි කිරීම හා ප්‍රවෘත්තිය සන්ධර්භගත කිරීම සඳහා එය අවශ්‍ය වේ. දැනටමත් නොමැති වාද විෂයයන් ප්‍රවෘත්ති බවට පත් කිරීමට විෂය මූලිකත්වය නිදහසට කරුණක් නොවන බැවින් ජනමාධ්‍යවේදීන් ඒ පිළිබඳවත් ප්‍රවේශම් විය යුතු ය. (කනිංහැම් 2004)

## යුද්ධය ගැන

ඉරාක යුද්ධය ආවරණය කළ ආකාරය පිළිබඳව නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතෙහි ක්‍රිස් හෙජස් නමැති ජනමාධ්‍යවේදියා විසින් නිව්යෝර්ක් පොත් විචාරයෙහිදී අවධාරණයෙන් කියා සිටින්නේ යුද්ධය තේරුම් ගන්නේත් එහි සත්‍ය තත්ත්වය දන්නේත් එයින් දරුණු විපාක විඳි අය මිස, දේශපාලන නායකයන් හෝ ප්‍රභූන් නො වන බව යි. යුද්ධය ගැන සත්‍ය තොරතුරු ඊට කලකට පසුව හෙළිවන ආකාරයත් ඔහු අවධාරණය කරයි.

පරාජිතයෝ යුද්ධය ගැන දනිති. යුද්ධයෙන් තුවාල ලැබූවන්ගේ ළතෝනි, නිරර්ථක මිනිස් ඝාතන, යුද්ධයෙන් බඩ වඩා ගැනීම සහ නළලෙහි අත්ගසා වැලපීම් ආදිය තිරයකින් මුවාකොට කීර්තිය, ගරුත්වය සහ දේශමාමකත්වය වැනි වියුක්ත වදන් භාවිතා කරන යුද්ධ ප්‍රතිපත්ති අනුදන්නවුන් විනිවිද දැකීමට ඔවුන්ට පුළුවන. ජයග්‍රාහකයින් බොහෝ විට පිළිනොගන්නා අමූලික බොරු ඔව්හු දනිති. ගරු ගාම්භීර යුද්ධ ස්මාරක හා මිථ්‍යා යුධ වෘත්තාන්තයන්ගෙන් සහ නිර්භීතකම හා සහෝදරත්වය හුවාදක්වන කථාන්තර වලින් ආවරණය කොට ඇති බොරුව සහ අසත්‍යය ඔවුහු දනිති. නිරාචාර රාජ්‍ය තාන්ත්‍රිකයින් විසින් රචිත ඝනකම් මතක සටහන් පොත්වල අඩංගු විනිවිද පෙනෙන අසත්‍යය ඔව්හු දකිති. එම රාජ්‍ය තාන්ත්‍රිකයන් යුද්ධ නිර්මාණය කළ ද ඔවුන් යුද්ධය නො දන්නේ ය. පරාජිතයෝ යුද්ධයේ සාරය කුමක් දැ යි දනිති. එ නම් මරණයයි. යුද්ධය යනු මළමිනී පිළිබඳ ආශාව බව ඔව්හු දනිති. යුද්ධය යනු පරිපූර්ණ පව්කාර තත්ත්වයක් බවත් එහි පරමාර්ථය ක්‍රෝධය හා විනාශය බවත් ඔව්හු දනිති. යුද්ධය වෙන්වීම පෝෂණය කරන බවත්, අනිවාර්යයෙන් එය ශූන්‍යවාදය කරා යන බවත්, එය ජීවිතයේ පැවැත්ම හා පූජනීයත්වය ආපස්සට හැරවීමක් බවත් ඔව්හු දනිති. යුද්ධය පිළිබඳ සියලු ම වෘත්තාන්ත ප්‍රචණ්ඩත්වට පෙළඹවීමක් හා වශීවීමකි. එමෙන්ම එය දඬුවමකින් තොර මරන්නට බලය ලත් දේව බලයක් වැනි ආකර්ෂණීය වරමකි.

එහෙත් පරාජිතයාගේ කථාව එන්නේ යුද්ධයෙන් බොහෝ කල් ඉකුත් වී ය. වියපත් පිරිමි සහ ගැහැනු ඔවුන් බාල ළමා වියේ සිටියදී ලැබූ අත්දැකීම් හෙළිකරන විටදී ය. ඔවුන්ගේ මව හෝ පියා හෝ ඝාතනය කරන විටදී හෝ පැහැරගෙන යන විටදී කුමන හැඟීම් ඇතිවීණි ද, එසේත් නැතිනම් ඔවුන්ගේ ගේ දොර අහිමිවීම, ජන කොට්ඨාශය අහිමි වීම, ආරක්ෂාව අහිමිවීම සහ මිනිස් කසළ සේ බැහැරලීම දරා සිටියේ කෙසේද? ආදී වශයෙන් ඔවුන් අත්දැකීම් හෙළි කරන විට ය. එහෙත් මේ වන විට කවුරුවත් ඇහුම්කන් දෙන්නේ නැත. යුද්ධය ගැන සත්‍ය තොරතුරු ඉදිරිපත් වුවත්, හැමවිට ම මෙන් එය ප්‍රමාද වැඩි ය. ජාතිය විසින් උත්සවාකාරයෙන් ආරම්භ කිරීමට නියමිත මහා ව්‍යවසායක ප්‍රාරම්භය හා සමග මෙවැනි කථාවල කිසිදු සම්බන්ධයක් නැති බැව් යුද්ධයේ නිර්මාතෘවරුන් විසින් අපට සහතික වනු ඇත. යුද්ධයේ මිථ්‍යාව කෑදර ලෙස උරා බොමින් එහි බලයෙන් මත් ව, අපි නො දුටු සේ සිටිමු.

**සමීක්ෂණ ප්‍රතිඵල**

# මහා බෙදීම - ජනමාධ්‍යවේදීන් සිතන්නේ කෙසේද?, වාර්තා කරන්නේ කෙසේද?

ගැටුම්කාරී තත්ත්වයන් තුළ මාධ්‍යයේ ක්‍රියා කලාපය ගැන බොහෝ විග්‍රහයන් කෙරී ඇති අතර, ඉන් වැඩි හරියක් අවධානය යොමු කර ඇත්තේ සත්‍ය වශයෙන් සිදුවූ ආවරණය කෙරෙහි ය. ජනමාධ්‍යවේදීන් මුහුණ දුන් අභියෝගයන් මොනවා ද? ඔවුන් මුහුණ දෙන බාධාවන් මොනවා ද? ඔවුනට අවශ්‍ය ආධාර උපකාර ලැබී තිබේ ද? වඩාත් ම වැදගත් ලෙස, ඔවුන්ගේ වෘත්තිය ආචාර ධර්මානුකූලව පවත්වාගෙන යෑම සඳහා කුමන සම්පත් ඔවුනට අවශ්‍ය ය යි ඔවුන් සිතන්නේ ද යන්න ගැන විශ්ලේශකයන් අසා තිබේ ද?

ජ. ජා. ස. ඔවුන්ගේ ශ්‍රී ලංකා හවුල්කරුවන් හා එක්ව ජනමාධ්‍යවේදීන් 100 දෙනෙකු සමඟ ඔවුන්ගේ ආකල්ප හා අත්දැකීම් පිළිබඳ ව සම්මුඛ පරීක්ෂණයන් පවත්වා, තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ යෝජනා පිළිබඳ ව විමසන ලදී.

පර්යේෂණය සමීක්ෂණ පදනමේ සිදු වූ අතර, තොරතුරු බොහෝ ප්‍රමාණයක් වාර්තාගත කරන ලද්දේ සම්මුඛ සාකච්ඡා වලදී ය.

එසේ ලබාගත් දත්ත මගින් ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේදීන් වැඩ කරන තත්ත්වයන් පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගත හැක. එමෙන්ම ඔවුන් ප්‍රවෘත්ති ලබා ගැනීමට භාවිතා කරන ක්‍රමවේද සහ ගැටුම් වාර්තාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ අත්දැකීම් ද මෙමගින් හෙළිදරව් වේ.

සම්පත් දුබලතාවය, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ තොරතුරු මූලාශ්‍ර, භාෂාව බාධකයක් වීම, අනෙකුත් ජන කණ්ඩායම් මාධ්‍යයේ නියෝජනය වීම මදකම ආදිය වර්තමානයේ ගැටුම ආවරණය වන ආකාරය තුළ දැකිය හැකි මූලික ගැටලු කිහිපයකි.

ප්‍රශ්න මාලාවට ප්‍රතිචාර දැක්වූ ජනමාධ්‍යවේදීන් සිය දෙනාගෙන් 88% වැඩ කරන්නේ මුද්‍රිත මාධ්‍යයේ වන අතර සමීක්ෂණ ප්‍රතිචාර වලදී ඉංග්‍රීසි, දෙමළ හා සිංහල මාධ්‍යයන්හි සමාන නියෝජනයක් විය.

## මාධ්‍ය නිරීක්ෂණය

පුවත්පත් කලාවේදීන්ගේ අදහස් පිළිබඳ සමීක්ෂණයට ඌණ පූරකයක් වශයෙන්, සියලු ම ප්‍රධාන පෙළේ දෛනික පුවත්පත් 2004 ජුනි 01 සිට 14 දින දක්වා නිරීක්ෂණය කරන ලදී. එම කාලයේදී ශ්‍රී ලංකා ආණ්ඩුව හා එල්ටීටීඊය අතර සටන් විරාම ගිවිසුම අවුරුදු දෙකකට අධික කාලයක් ක්‍රියාත්මක ව පැවති නමුදු, සාම සාකච්ඡා අවුරුද්දකට වැඩි කාලයක් අත්හිටවනු ලැබ තිබිණ.

සාම සාකච්ඡා යළි ආරම්භ කිරීම මෙම වකවානුවේදී ප්‍රධාන ප්‍රශ්නයක් ව පැවැතිණි. ඒ අනුව සාම ක්‍රියාවලිය සහ ඒ හා බැඳුණු වාද විෂයන් දෙස නිරීක්ෂණය යොමු වූ අතර, එම වාද විෂයන් ආවරණය වූ පුවත් අයිතමයන් 422 ක් කෙරෙහි අවධානය යොමු කෙරිණ. (ඉංග්‍රීසි 132, සිංහල 166 සහ දෙමළ 144)

- ප්‍රතිඵලය පෙන්නුම් කරන ලද්දේ ගැටුම සහ සාම ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රවෘත්ති ආවරණය ඒක පාර්ශවීය, අවුළුවනසුලු, එක් මූලාශ්‍රයක් පමණක් මත පදනම් වූ, (විශේෂයෙන් ම සිංහල සහ දෙමළ පුවත්පත් හි) ඒවා බව ය.
- සිංහල හා දෙමළ භාෂා පුවත්පත් මගින් ඔවුන්ගේ පාඨකයින් වෙත දෙනු ලැබුවේ එකිනෙකට වෙනස් වූ පණිවුඩ බව තහවුරු විය.

සාම ක්‍රියාවලිය හා සාම සාකච්ඡා යළි ආරම්භ කිරීම සම්බන්ධ ප්‍රශ්න ගැන ලියැවුණු ප්‍රවෘත්ති පළ කළ ස්ථානය ද, ඒවා පළකිරීමේ දී තිබූ වැදගත්කම ද හා ගුණාත්මකභාවය ද නිරීක්ෂණය කරන ලදී.

- ප්‍රවෘත්ති 72 ක් මගින් දෙමළ භාෂා පුවත්පත් සාම ක්‍රියාවලිය පිළිබඳව සැහෙන විශාල ආවරණයක් දී තිබුණි. ඒ වාගේ ම මුල් පිටෙහි  වැදගත් තැන්හි එම ප්‍රවෘත්ති පළ කොට තිබූ අතර, රජය මගින් පාලනය වන පුවත්පත් වලට වඩා සාම ක්‍රියාවලිය පිළිබඳ ධනාත්මකභාවයක් පෙන්නුම් කොට තිබිණ.
- ඉංග්‍රීසි දෛනික පුවත්පතක් වන 'දි අයිලන්ඩ්' සාම ක්‍රියාවලියට එරෙහි ව ප්‍රවෘත්ති 26 ක් පළ කොට තිබූ අතර, සාම ක්‍රියාවලියට පක්ෂ ව පළ කොට තිබුණේ ප්‍රවෘත්ති 7 ක් පමණි. එමෙන් ම සිංහල දිනපතා පුවත්පත වන දිවයින සාම ක්‍රියාවලියට එරෙහි ව ප්‍රවෘත්ති 15 ක් ද පක්ෂ ව ප්‍රවෘත්ති 3 ක් ද පළ කොට තිබුණි.

  සිංහල පුවත්පත් එල්ටීටීඊ ය සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීම කෙරෙහි වඩා අවධානයක් යොමුකළ අතර ඒ සම්බන්ධ වාර්තා 42 ක් පළ කළ ද ආණ්ඩුවේ හමුදාවන්ගේ කඩකිරීම් වාර්තා කරන ලද්දේ 11 ක් පමණි.
- සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් වල පළ වී ඇති එල්ටීටීඊ මිලිටරි ක්‍රියා හා සම්බන්ධ ප්‍රවෘත්තිවල 70% කට වඩා එකම මූලාශ්‍රය ලෙස යොදා ඇත්තේ නිර්නාමික පොලිස් හා හමුදා අංශ වන අතර ප්‍රචණ්ඩත්වය ගැන වාර්තාකරණයේ දී දෙමළ මාධ්‍යය ඔවුන්ගේ ප්‍රධාන මූලාශ්‍රය ලෙස යොදාගෙන ඇත්තේ එල්ටීටීඊය හෝ ඊට අනුබද්ධ මූලාශ්‍ර යි.
- සිංහල පුවත් ආවරණය පොදුවේ ගත්කල පක්ෂග්‍රාහී මෙන්ම අවුළුවනසුලු ද වේ. සිංහල මාධ්‍යයෙන් පළවූ ප්‍රවෘත්ති 74 ක් එක්කෝ ඒක පාර්ශවීය හෝ නැත්නම් අවුළුවනසුලු ද විය. ඊට සංසන්දනාත්මක ව ප්‍රවෘත්ති 47 ක් එක් මතයකට වැඩි ප්‍රමාණයක් වාර්තා කොට තිබුණි.
- සිංහල මාධ්‍යයේ ගැටුම හා ආශ්‍රිත ප්‍රශ්න ගැන ලියැවුණු ප්‍රවෘත්ති වලින් 50% ක් ම, නිර්නාමික හෝ නම් කරන ලද එකම මූලාශ්‍රයක් පදනම් කොට ගෙන තිබිණි.
- එල්ටීටීඊය විවේචනය කළ කිසිදු දේශපාලන මතයක් කිසිදු දෙමළ පුවත්පතක පළ නොවීම, එල්ටීටීඊ ප්‍රවෘත්ති සම්බන්ධයෙන් දෙමළ පුවත්පත් ස්වයං වාරණයක් පනවාගෙන ඇතැ යි යන්න සනාථ වන්නකි.

මෙම මාධ්‍ය නිරීක්ෂණය මගින් පෙන්නුම් කරනුයේ ගැටුමට සාමකාමී විසඳුමක් ලබා ගැනීම සඳහා මහජනයා වෙත සමබර, අපක්ෂපාතී දැනුවත්භාවයක් ලබාදෙන මාධ්‍යයක් වෙනුවට භාෂා හා ජනවාර්ගිකත්වය මත බෙදුණු හා ඔවුන්ගේ පාඨකයින් වෙත වෙනස් පණිවිඩ ලබා දෙන්නා වූ මාධ්‍යයක් ඇති බව යි.

## වාර්තාකරණය - අපගේ භූමිකාව

සමීක්ෂණයට සහභාගී වූ ජනමාධ්‍යවේදීන් හා කර්තෘවරුන්ට අනුව ශ්‍රී ලංකාවේ මාධ්‍යයේ භූමිකාව වන්නේ ගැටුම් නිරාකරණයට පහසුකම් සැපයීම සහ විෂයබද්ධව සහ ස්ථාවරයක් නොගෙන සිටීම යි.

එසේ වුවත්, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් දෙකෙන් පංගුවට වඩා වැඩි කොටසකගේ අදහස වූයේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම ගැන වාර්තාකරණයේදී මාධ්‍යය විසින් දෙපැත්තේ ම කරුණු ඉදිරිපත් නො කරන බවයි.

මෙයින් අදහස් වන්නේ ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේදීන්ගේ වැඩි සංඛ්‍යාවක් මාධ්‍යයේ වගකීම වටහාගෙන ඇති බව ය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 87% පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකා මාධ්‍යය, පවතින ගැටුම පිළිබඳ ව නිවැරදි, සමබර සහ අපක්ෂපාතී තොරතුරු ලබාදීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමට අසමත් වී සිටින බවයි.

ප්‍රතිචාර දැක්වූ පස් දෙනෙකුගෙන් හතර දෙනෙකුගේ ම අදහස වූයේ මෙම වරද සිදුවන්නේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යය නිශ්චිත ජනවාර්ගික කණ්ඩායම් කෙරෙහි ඇති පක්ෂග්‍රාහීභාවය නිසා බවයි. මෙයින් ගම්‍ය වන තවත් කරුණක් නම්, යහපත් මාධ්‍යවේදයක් හා එහි සත්‍ය ක්‍රියාකාරීත්වය අතර පවතින පරතරයයි.

## ප්‍රවෘත්ති ලබාගැනීම

සමීක්ෂණය හා මාධ්‍ය නිරීක්ෂණය මගින් සොයාගත් දෙයක් නම්, සමබර වාර්තාකරණයක් සඳහා පුවත්පත් කලාවේදීන්ට ඇති ප්‍රධාන ම බාධකය මූලාශ්‍ර බවයි. ඒවා මූලික වශයෙන් ම පක්ෂග්‍රාහී හා සීමිත වන අතර මූලාශ්‍ර වැඩි සංඛ්‍යාවකට ප්‍රවේශ වීමට නොහැකි වීම යි.

- ගැටුම් ආවරණයේ දී ඉතාමත් ම සුලබ මූලාශ්‍රය ලෙස සමීක්ෂණ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් තුනෙන් එකකටත් වැඩි දෙනෙක් නම්

කරනු ලැබුවේ පොලිසියයි. වෙනත් මූලාශ්‍ර අතර මහජනයා, දේශපාලනඥයින්, රාජ්‍ය නො වන සංවිධාන, ආයුධ සන්නද්ධ කණ්ඩායම් සහ හමුදා විය.

- ගැටුම ආවරණය කිරීමේදී අවම ප්‍රයෝජනයක් ඇති මූලාශ්‍රය ලෙස නම් කරනු ලැබුවේ ශ්‍රී ලංකා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි.
- ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් දෙකකට වඩා වැඩි දෙනෙක් රාජ්‍ය ආයතන මගින් ලබා දෙන ප්‍රවෘත්ති කෙරෙහි අප්‍රසාදය පළ කර සිටිය හ. එම ප්‍රවෘත්ති සීමිත මෙන් ම පක්ෂග්‍රාහී බවත්, ප්‍රතිචාර දැක්වූ පස්දෙනෙකුගෙන් හතරදෙනෙක් ම එම ප්‍රවෘත්ති නිවැරදි හෝ විශ්වසනීය බවින් තොර ලෙසත් සලකනු ලැබීය.
- ගැටුම් පිළිබඳ වාර්තාකණයේ දී අවම වශයෙන් මූලාශ්‍ර දෙකක්වත් යොදා ගැනීමට උත්සුක වන බැව් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 96% ක් ම පවසා සිටිය මුත්, මාධ්‍ය නිරීක්ෂණ අභ්‍යාසය මගින් පෙන්නුම් කරන ලද්දේ ප්‍රකාශයට පත් කරන ලද වාර්තා වලින් 50% ක් ම භාවිතා කර තිබුණේ, නම් කරන ලද හෝ නිර්නාමික එක් මූලාශ්‍රයක් බවයි.
- භාෂාව පිළිබඳ බාධක සහ ප්‍රවෘත්ති කාමරයේ විවිධත්වයේ හා තේරුම් ගැනීමේ අඩුපාඩුකම් විවිධ වූ මූලාශ්‍ර වැඩි ගණනකට ප්‍රවේශ වීමට නො හැකි වූ ප්‍රධාන හේතු විය.

## වාරණය

සමීක්ෂණයෙන් හා මාධ්‍ය නිරීක්ෂණයෙන් පැහැදිලි වන කරුණක් නම්, තෙවසරක සටන් විරාම ගිවිසුමෙන් පසුවත්, නිල වශයෙන් ප්‍රකාශයට පත් වූ වාරණයක් නොමැති තත්වයක් යටතේ වුවත්, ශ්‍රී ලංකා මාධ්‍යයේ වාරණය පිළිබඳ පැහැදිලි සම්ප්‍රදායක් තිබෙන බවයි.

යුද්ධය හා සාමය යන කරුණු දෙක ම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව ශ්‍රී ලංකාවේ ගැටුම පිළිබඳ විවෘත ආවරණයක් කිරීම අනියම් ලෙස වළකා ඇත.

මාධ්‍ය නිරීක්ෂණ අභ්‍යාසය මගින්, දෙමළ පුවත්පත්වල එල්ටීටීඊය විවේචනය වන මත වාරණයට ලක් කෙරෙන බවත්, රජය මගින් පාලනය කෙරෙන මාධ්‍ය බලයේ සිටින දේශපාලන පක්ෂයේ ස්ථාවරයේ රැඳී සිටින බවත්, සිංහල පුවත්පත් යුද කලාපීය වාර්තා සම්බන්ධයෙන් හමුදා ආධිපත්‍යය ප්‍රශ්න නො කරන බවත් පැහැදිලි ය. මිලිටේරිය කිසියම් ප්‍රකාශයක් කළ විට එය වෙනත් මූලාශ්‍රයකින් සනාථ කර ගැනීමක් සිදු නොවේ.

## ආචාර ධර්ම පද්ධතිය

ශ්‍රී ලංකාවේ මාධ්‍යයේ තත්ත්වය නංවාලීම සඳහා වැදගත් පියවරක් වන්නේ පුළුල් පිළිගැනීමක් ඇති ආචාර ධර්ම පද්ධතියක් ආයතනගත කිරීමයි.

- ජනමාධ්‍යවේදීන්ගෙන් හරි අඩක් පමණක් වෘත්තීමය ආචාර ධර්ම පද්ධතියක් ගැන දැනුවත් වී සිටි අතර එහි පිටපතක් හෝ ඒ ගැන පුහුණුවක් ලබා තිබුණේ ඉන් සියයට දහයටත් අඩු සංඛ්‍යාවකි.
- සමීක්ෂණයට භාජනය වූ ජනමාධ්‍යවේදීන්ගෙන් අඩකට යාන්තමින් වැඩි කොටසක් ඔවුන්ගේ මාධ්‍ය ආයතන පුවත්පත් පැමිණිලි කොමිසමේ ශ්‍රී ලංකා ආචාර ධර්ම පද්ධතිය පිළිගෙන ඇති බව දැන සිටි අතර, එහි පිටපතක් සතුව තිබුණේ ඉන් 11% කට පමණකි. ඔවුනතුරින් තුනෙන් දෙකොටසක් ඊට අදාළ පුහුණුවක් ලබා ඇත.
- ඊටත් අමතර ව, 56% ජනමාධ්‍යවේදීන් අයත්වන, ආචාර ධර්ම පද්ධතිය වැළඳගත් ආයතනවලින් තුනෙන් එකක් පමණක් ජනවාර්ගික / ආගමික ගැටුම් වාර්තාකරණය සම්බන්ධයෙන් මගපෙන්වීම් පද්ධතිය තුළට අන්තර්ගත කොට තිබුණි. ඉන් 71% ක් පද්ධතිය හා මගපෙන්වීම් ගැන පුහුණුවක් ලබා තිබුණි.



බුද්ධික වීරසිංහ

*පක්ෂපාතිත්වය සහ විශ්වාස කළ නොහැකි තොරතුරු මූලාශ්‍ර හා භාෂාව ගැටුම් වාර්තාකරණයේ දී මතුවන මූලික ප්‍රශ්න වේ.*

ගැටුම් වාර්තාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මාධ්‍යයේ විශේෂිත වගකීම් හඳුනා ඇති ආයතන, එම වගකීම් පිළිබඳ ඔවුන්ගේ ජනමාධ්‍යවේදීන් දැනුවත් කරනු ඇතැ යි මෙමගින් යෝජනා කෙරේ.

## පුහුණුවීම්

ජනවාර්ගික ගැටුම වාර්තාකරන ජනමාධ්‍යවේදීන්ට පුහුණුවීම්, අධ්‍යාපනය සහ සම්පත් ලබාදීමේ පොදු අවශ්‍යතාවය සමීක්ෂණය මගින් ඉස්මතු වේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් දෙකක් ම ගැටුම් වාර්තාකරණය සම්බන්ධයෙන් මොනයම් ම ආකාරයක හෝ පුහුණුවක් නො ලැබූ බව කියා සිටියහ. 69% ක් කියා සිටියේ ආගමික හා ජනවාර්ගික ගැටුම් වාර්තාකරණය සම්බන්ධයෙන් පළවී ඇති කිසි දු අධ්‍යයන සම්පතක් පිළිබඳව ගැන ඔවුන් දැන නොසිටි බව ය.

## දියුණු කළ හැක්කේ කෙසේ ද?

මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන්නේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි පිරිසක් ශ්‍රී ලංකාවේ මාධ්‍යයේ භූමිකාව තේරුම් ගෙන ඇති බවයි. ඔවුනතුරෙන් කීප දෙනෙක් එම වගකීම ඉෂ්ඨ කරන බවත් වෘත්තිය හෝ ආචාර ධර්ම මට්ටමින් දායකත්වයන් ලබාදීමට ඔවුන්ට දැනුම හා සම්පත් ඇති බවත් විශ්වාස කරති.

දියුණු කරන ලද වාර්තාකරණයක් පෝෂණය වන්නේ;

- සියලු ම මාධ්‍ය ආයතන ආචාර ධර්ම පද්ධතිය ක්‍රියාවේ යෙදවීම.
- පුහුණුවේ මට්ටම ඉහළ නැංවීම.
- ගැටුම් වාර්තාකරණයට අදාළ මගපෙන්වීම් සකස් කිරීම.
- ප්‍රවෘත්ති කාර්යාලයේ විවිධත්වය සහතික කිරීම.
- මහත් කලබල ඇති කරන හා අවුළුවනසුලු භාෂාව හා ශීර්ෂ පාඨ යොදා නොගැනීම ආදියෙනි.

සමීක්ෂණය පෙන්නුම් කරනුයේ සුළුතර කණ්ඩායම් පිළිබඳ බොහෝ මාධ්‍ය ආවරණ යුද්ධය හා ත්‍රස්තවාදය සම්බන්ධ ඒවා බව යි. සුළුතර ජනවර්ගයන්ට අදාළ වන්නාවූ සමාජ හා සංස්කෘතික වාද විෂයන් හඳුනා ගැනීමේ අවශ්‍යතාවය මෙමගින් මතක් කර දේ. දෙමළ ජනයා සතුව පොහොසත් සංස්කෘතියක් ඇති අතර බොහෝ අංශවල පිළිගැනීමක් ඇති ලෝක මට්ටමේ වෘත්තීයවේදීන් බිහිකොට ඇත. යුද්ධය මගින් නිර්මාණය කර තිබෙන සංජානනය වෙනස් කිරීම සඳහා මෙවැනි සාධක වාර්තා කිරීම අවශ්‍ය වේ.

## සිද්ධි අධ්‍යයනය : ජනවාර්ගිකත්වය අවධාරණය කිරීම

ජනමාධ්‍යවේදියෙක් තම වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය ගැන අවබෝධයක් ඇතුව හෝ නැතිව, ජනවාර්ගික ගැටුම් වාර්තාකරණය පිළිබඳ පුහුණුවක් ලබා හෝ නො ලබා, කිසියම් ගැටුම් අවස්ථාවකට මුහුණ දී ඒ ගැන ඉක්මණින් අපක්ෂපාතී ව හා නිවැරදිව වාර්තා කිරීමට සිදුවුවහොත්, අභියෝග රැසකට මුහුණ පානු ඇත.

මෙහි පහත දැක්වෙන්නේ පුවත්පත් කීපයක් විසින් ආවරණය කරන ලද ගැටුම් අවස්ථාවක සිද්ධි අධ්‍යයනයක් පිළිබඳ උදාහරණයකි. මෙහිදී, කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කර ගනු පිණිස අදාළ හා ප්‍රමාණවත් මූලාශ්‍ර භාවිතා කිරීමට කිසිදු උත්සාහයක් දරා නැත. කිසියම් උත්සාහයක් දරා ඇත්නම් එය ඉතා අල්ප වූවකි. එමෙන් ම ජනමාධ්‍යයේ වෘත්තීය ආචාර ධර්ම පද්ධතියට අනුකූල වීමට හෝ අපක්ෂපාතී ව හෝ මධ්‍යස්ථ ව වාර්තාකිරීමට හෝ අපොහොසත් විය. මෙම වාර්තාකරණයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස මෙම සිද්ධියට අදාළ කරුණු හා අවස්ථා සාවද්‍ය ලෙස නියෝජනය වූ අතර, එමගින් ගැටුම සමනය වීමට වඩා ප්‍රකෝපකාර වීමට හේතු විය.

### කඳවුරේ සංහාරය

*තිලක් ජයරත්න විසිනි.*

ත්‍රස්තවාදීන් ලෙස සැකකෙරුණ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම සඳහා පිහිටුවනු ලැබූ කඳවුරක් වූ බිඳුණුවැව සංහාරය සිදුවූයේ 2000 ඔක්තෝබර් මස 25 වෙනි දින ය. මෙහිදී රැඳවියන් 24 දෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ.

ඔක්තෝබර් මස 24 සන්ධ්‍යාවෙහි සාමාන්‍ය පරිදි රැස්වීමක් පවත්වා ඇත. මෙම රැස්වීමේ දී ඇතැම් රැඳවියන් ඔවුන් ව මුදා හැරීමට ප්‍රමාද වීම හේතු කොටගෙන කෝප වී රැස්වීමේ දී ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමට පටන් ගෙන ඇත. ඉන්පසු ව ඔවුන් බලහත්කාරයෙන් ගබඩා කාමරයට ඇතුළු වී අනතුරු ව පොලිස් මාර්ග බාධකයට ඇතුළු වී, යකඩ පොලු හා වෙනත් ආයුධ මගින් ගොඩනැගිලිවලට අලාභ හානි සිදු කොට ඇත.

පසු දා උදෑසන, 700 ක් පමණ ගම්වැසියන් කඳවුර අසලට එක් වූහ. ප්‍රකෝප ව සිටි ජනයා යකඩ පොලු, කඩු සහ පොරෝ වලින් සන්නද්ධ ව සිටියහ. පොලීසියේ ආයාචනාවලට ඇහුම්කන් නො දුන් ජනයා කඳවුර තුළට කඩා පාන රැඳවියන් 24 දෙනෙකු ඝාතනය කරන ලදී. අනතුරු ව මළ කඳන් ලැගුම්හල දෙසට විසිකර ඒවාට ගිනිතබන ලදී.

ඊට මාස එකහමාරකට පසුව, දෙසැම්බර් 5 වෙනි දින, සිදුවූයේ කුමක්ද යන්න ගැන මානව හිමිකම් කොමිසමේ වාර්තාව ලංකාදීප පත්‍රයෙහි පළවිය.

"අපට ලැබුණු සියලු තොරතුරු අනුව, සිද්ධිය වූ අවස්ථාවේදී එතැන සිටි පොලිස් නිලධාරීන් 60 දෙනා, මෙම ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට ඉදිරිපත් නොවීමෙන්, රාජකාරි පැහැර හැරීමේ කරුණ මත වරදකරුවෝ වෙති. රැස්ව සිටි පිරිස් අත ගිනි අවි නො තිබිණි. පූර්ණ ආයුධ සන්නද්ධ ව සිටි පොලිස් පිරිස රැස් ව සිටි සෙනග පාලනය කිරීමට අසමත් වූවා පමණක් නොව, එම සෙනගට නායකත්වය දුන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට ද අපොහොසත් වූහ."

කෙසේ වෙතත්, මෙම ම්ලේච්ඡ ක්‍රියාවෙන් පසු දිනවලදී පුවත්පත් හි පළ වූ සිරස්තල, වාර්තා හා කතුවැකි මගින් පෙන්නුම් කරන ලද්දේ මීට හාත්පසින් ම වෙනස් වූ චිත්‍රයකි.

'ගැමියන් හා කොටි අතර ගැටුමින් 25 ක් මරුට' (ඩේලි නිව්ස්)

'කොටි සැක කරුවන් 25 ක් මරුට, 18 ක් තුවාල ලබති' (අයිලන්ඩ්)

'බිඳුණුවැව පුනරුත්ථාපන කඳවුරට පහරදීමෙන් 27 ක් මරුට, කොටි සැකකරුවන් විසින් කඳවුර භාර කපිතාන් ප්‍රාණ ඇපයට ගනී' (ලංකාදීප)

'ගැමියන් සමග සටනේදී කොටි සැකකරුවන් මරුමුවට' (ලක්බිම)

ප්‍රධාන ධාරාවේ ඉංග්‍රීසි හා සිංහල පුවත්පත් වල අඩංගු වූ වාර්තා කරුණු සොයා බැලීමකින් තොර ව පළ කොට තිබුණි. සිද්ධිය සෘජු ව වාර්තා කිරීම වෙනුවට, සිද්ධියෙන් ස්වාධීන ව, ඔවුන්ගේ හිතලු අනුව




වාර්තා සැපයිණි. මාධ්‍ය විසින් ඔවුන්ගේ වීරයින් හා ද්‍රෝහීන් නිර්මාණය කරගන්නා ලදී. ද්‍රෝහීන් වූයේ එල්ටීටීඊ රැඳවියන්, ත්‍රස්තවාදීන් සහ දෙමළ ත්‍රස්තවාදීන් ය. ගැමියන් වීරයින් බවට පත් කරන ලදී.

ජනාධිපතිනිය විසින් සිද්ධිය හෙළාදැකීමෙන් පසුව වුව ද, මෙම පරිකල්පිත අඛ්‍යානය වර්ධනය කරන ලදී. රැඳවියන් කඳවුර තුළ සිටිමින් භයානක අවි ආයුධ තනා ඇති බවත් පුනරුත්ථාපන කඳවුරෙහි සේවය කරන නිලධාරීන් ආරක්ෂා කර ගැනීමට ගම්මු පැමිණි බවත් එම කථාවලට ඇතුළත් විය.

ගම්මුන් විසින් රැඳවියන් ඝාතනය කළ බැව් වාර්තා කිරීමට අසමත් විය. ඒ වෙනුවට 'එල්ටීටීඊ පෙරළිකරුවන්' එකිනෙකාට පහර දී මරුමුවට පත් වූ බවට අදහසක් ඉදිරිපත් කරන ලදී. භාවිතා කළ භාෂාව ජනවාර්ගික ස්ථාපිත ආදර්ශ තහවුරු කළේ ය. ගැමියන්, පොලිසියේ සහ කඳවුරේ නිලධාරීන්, එල්ටීටීඊ නො වන පිරිස නිරායුධ, හික්මුණු, පක්ෂපාතී, කීකරු, යහපත්, ශක්තිමත්, ශීලාචාර හා වීරත්වය ඇති පුද්ගලයින් ලෙස නිරූපණය කෙරේ. රැඳවියන් එල්ටීටීඊ සාමාජිකයන් වන අතර, ඔවුන් ත්‍රස්තවාදීන්, ප්‍රචණ්ඩ, ආයුධ සන්නද්ධ, හික්මීමකින් තොර , කළහකාරී, කුමන්ත්‍රණකාරී, අකීකරු, ම්ලේච්ඡ, අයහපත්, දුර්වල හා දුෂ්ට ලෙස ප්‍රතිරූපණය කෙරේ.

'ඩේලි නිව්ස්' හැරුණු විට, අන් සියලු ම පුවත්පත් ගොතන ලද අසත්‍යයන්, එකතුකිරීම් හා අඩුකිරීම් සහිත ව පළ කරන ලදී. වඩාත් ම විකෘති කරන ලද පුවත් පළවූයේ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක් වන 'දි අයිලන්ඩ්' හි ය. ගැටුමට හේතු වූයේ කොටි සැකකරුවන් විසින් කඳවුරේ සේවය කරන සොල්දාදුවෙකුට පහර දී මරා දැමීම බව සිරස්තලයක් සහිත ව පළ කරන ලදී. කඳවුරේ රැඳවියන් විසින් කිසිවකු මරා දමා නො තිබුණි.

සිද්ධිය පිළිබඳ ලියැවුණු කතුවැකි සම්බන්ධයෙන් ද කිව හැක්කේ ඒවා මගින් බිඳුණුවැව සිද්ධයට හේතු වූයේ රැඳවියන්ගේ විරෝධතා ව්‍යාපාරය සහ ඔවුන්ගේ නොමනා ක්‍රියා කලාපය බවට වන අදහස ශක්තිමත් කිරීමට සමත්වූ බව ය. තව දුරටත් එල්ටීටීඊ සංවිධානය මෙම සිද්ධිය පිටුපස සිටි බවටත්, ඔවුන් ඝාතනයට ලක්වූයේ ඔවුන්ගේ ම අනවශ්‍ය හා නොහික්මුණු ක්‍රියා නිසා බවත් දැක්විණ. ඔවුන්ට ලැබීමට සුදුසු දේ ඔවුන්ට ලැබුණ සෙයකි.

සිද්ධියෙන් දින 5 කට පසුව, එනම් 2000 ඔක්තෝබර් 30 වන දින සියලු ම පුවත්පත් කියා සිටියේ එල්ටීටීඊ මීට වරදකරුවන් බව ය.

'බිඳුණුවැව උද්ඝෝෂණය එල්ටීටීඊ සැලසුමකි' (දිවයින 30-10-2000)

'බිඳුණුවැව' සංහාරය ගැන එල්ටීටීඊ උදම් අනයි. (ලක්බිම 30-10-2000)

බිඳුණුවැව සිද්ධිය පිළිබඳ මාධ්‍ය ආවරණය මගින් එම ප්‍රදේශයේ ජීවත්වන වෙනස් ජන සමූහයන් අතර ඔවුනොවුන් කෙරෙහි ප්‍රතිරෝධයක් පවතී ය යන මතය ශක්තිමත් කිරීමටත් ඉවහල් විය.

සිද්ධිය පිළිබඳ වාර්තාකරණයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස, ප්‍රදේශයේ දේපළ විනාශවීම්, ගිනිතැබීම් හා මිනිස් ඝාතනයන් සිදුවිය.

# ශ්‍රී ලංකාවේ අස්ථාවරත්වය - ගැටුමේ පසුබිම

පී. සරවනමුත්තු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

යුද්ධයත් නැති සාමයත් නැති තත්ත්වයක් සහ ශ්‍රී ලංකා ආණ්ඩුව හා දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට අතර අත්හිටවූ සාම සාකච්ඡා ක්‍රියාවලියක් හා සැහැසිකම් සිදුවත්දීත් වසර තුනක් පවත්වාගෙන ගොස් ඇති සටන් විරාම ගිවිසුමක් තිබේ. මේවා ශ්‍රී ලංකාවේ ගැටුම් විපරිවර්තන ක්‍රියාවලිය අභියෝගයක් වේ. සුනාමි ව්‍යසනයෙන් පසුව ආධාර සහ නැවත ගොඩනැගීම සඳහා දෙපාර්ශ්වය අතර ගිවිසුමක් සඳහා මාස තුනක් තිස්සේ සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන අතර එයට ආණ්ඩුව තුළම සහ සිංහල දකුණේ ආධිපත්‍ය විසින් දේශපාලන විරුද්ධත්වයක් පෙන්වා තිබේ. යුද්ධය පටන්ගත් 1983 සිට 2002 වසරේ සටන් විරාම ගිවිසුම දක්වා එල්ටීටීඊය විසින් ආයුධ සන්නද්ධව වෙන්වීමේ තර්ජනය ඉදිරිපත් කර ඇත. දකුණේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ආයුධ සන්නද්ධ කැරැල්ලක් දියත් කර තිබුණි. දැන් ආණ්ඩුවේ කොටස් කරුවෙකු වන ජවිපෙ එල්ටීටීඊය සමඟ වන ඕනෑම ආයතනගත යාන්ත්‍රණයකට විරෝධය දක්වා තිබේ. 1987 ඉන්දියානු සාම සාධක හමුදාව එවීම මඟින් කලාපීය බල ආධිපත්‍යයේ බාහිර බලපෑමක් ද සිදු විය.

ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර දෙමළ කතා කරන ජනයා සඳහා ෆෙඩරල් මාදිලියේ අභ්‍යන්තර ස්වයං පාලනයක් සඳහා වන විසඳුමක් සෙවීම පිණිස 2002 ඔක්තෝබර් මස ඔස්ලෝ නුවර දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එල්ටීටීඊ සංවිධානය එකඟ විය. එම අවස්ථාවේ දෙපාර්ශවය ප්‍රකාශ කළේ එම විසඳුම රටේ සියලුම ජන කොටස්වලට පිළිගත හැකි රටේ එක්සත් බව රැකෙන්නක් විය යුතු බව ය. මෙම ප්‍රකාශය මඟින් පිළිගනු ලැබුවේමෙහි ජනවාර්ගික ගැටුමක් ඇති බවක් සහ ඒ සඳහා යුදමය විසඳුමක් තිබිය නොහැකි බවත්, ඒකීය රාජ්‍ය රාමුවක් තුළ මෙය විසඳිය නොහැකි බවත් ය. මෙය ෆෙඩරල් විසඳුමක් සඳහා වන එකඟත්වයක් විය.

**ජනවාර්ගික ආතතිය - පාර්ලිමේන්තු අවධිය**

නිදහස් ශ්‍රී ලංකාවේ සිංහල හා දෙමළ ජාතීන් අතර පැවැති ආතතිය පිළිබඳ ඔවුන්ගේ ස්ථාවර, සර්වජන ඡන්ද බලය හිමි වූ 1931 දක්වා දිවයයි. දෙමළ ජනයා දැක්වූ බිය නම්, අධ්‍යාපන දක්ෂතාවයෙන් සහ යටත් විජිත ප්‍රතිපත්ති හේතු කොට ගෙන ඔවුන් නිලධාරී තන්ත්‍රය තුළ ලබා සිටි සාපේක්ෂ වාසි සහගත තත්ත්වය, බහුතර සිංහල පාලනය යටතේ නැවත ලබාගත නොහැකි ලෙස අනතුරට පත්වේය යන්න ය. සිංහලයින් මීට ප්‍රතිපක්ෂව තමන් බහුතර ජාතිය ලෙස ලැබී ඇති තත්ත්වය ලබා ගැනීමට උනන්දුවකින් සහ දෙමළ ජනයාගේ දකුණු ඉන්දියාව සමඟ ඇති සම්බන්ධතාවන්ට පටහැනිව තමන්ගේ සංස්කෘතික හා ආගමික විනාශ වීමේ තර්ජනයක් පිළිබඳ බියකින් පසු විය.

1948 දී නිදහසට පූවේශයක් ලෙස දෙමළ ජනයාගේ ඉල්ලීම වූයේ ජනවාර්ගික පදනමක් මත මැතිවරණ කොට්ඨාශ ඇති කරන ලෙස ය. එනමුත් මෙය ප්‍රදානය නොකළ අතර ජනගහන ව්‍යාප්තිය මත, වෙස්ට්මිනිස්ටර් ඡන්ද කොට්ඨාශ ක්‍රමය මත, ජනවාර්ගිකත්වය මත දේශපාලනය ධ්‍රැවීකරණය වෙමින් සිංහල පක්ෂ දකුණේ ද, දෙමළ පක්ෂ උතුරේ ද ආධිපත්‍ය දරන තත්ත්වයට පත්වී තිබේ. මධ්‍යයෙන් ආන්තිකකරණය වීම පිළිබඳව ද දෙමළ ජනයාට තිබූ බිය සිංහල ආධිපත්‍ය දරන ආණ්ඩු විසින් තහවුරු කෙරිණි.

ඒ කෙසේ වතුදු, නිදහසෙන් පසු දෙමළ නායකයෝ පාර්ලිමේන්තු ක්‍රියාදාමයට කැප වූහ. සුළු ජනකොටස්වල වුවමනාවන් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමයක් සඳහා ආණ්ඩුවට සහභාගි වීමේ හා සහයෝගය දීමේ උපාය මාර්ගයක් විය. එමෙන්ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව අන්තර් වාර්ගික ප්‍රභූ පැළැන්තියේ පොදු එකඟතාවයට ද දිවයිනේ නිදහස් ව්‍යාපාරයේ ව්‍යවස්ථාදායක වාදී ආකල්පවලට ද සහතිකයක් විය. නමුත් දේශපාලන ඉඩ ප්‍රස්ථා සලසාදීමේදී ප්‍රතිපත්තියක් ලෙස දායක වුව ද, ආණ්ඩුවේ ප්‍රතිපත්ති හේතු කොට ගෙන එය ප්‍රායෝගික ව පූර්ණ වශයෙන් පිළිබිඹු නො වීය. වතුකරයේ ඡන්ද අහිමි කිරීම ද රජයේ අනුග්‍රහයෙන් දෙමළ ප්‍රදේශවල සිංහලයින් පදිංචි කරවීම ද ඇතුළු නොසලකා හැරීම් පැවතිය ද වතුකරයේ ඡන්ද අහිමි පොදු එකඟතාවය 70 ගණන්වලදී සෝදා පාළු ව තෙක් පැවතිණි.

සමාජමය ආතතිය පාලනය කිරීම සඳහා දේශපාලන ඉඩ ප්‍රස්ථා සලසා දීම හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය පිළිගැනීම දුර්වල වූයේ ප්‍රභූ පැළැන්තිය තුළ පක්ෂපාතිත්වයේ වාසි ලබාගැනීම සඳහා ජනවාර්ගික ජනප්‍රියවාදය උපයෝගී කරගැනීමේ හේතුවෙනි. මැතිවරණ ජයග්‍රහණය සඳහා ජනවාර්ගික ජනප්‍රියතාව සමග පැහැදිලි ලෙස අනන්‍යගත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස සලකනු ලැබීමත් සමග, දේශපාලන බල ව්‍යුහයේ අත්‍යන්ත සම්පත ලෙස අනන්‍යතාවයේ පැරණි හා බෙදුම්වාදී පදනම් නීත්‍යනුකූලතාවයට පත් වූ අතර, එම පදනම් එකට බැඳ තබමින් කල් පවතින ජාතික අනන්‍යතාවක් ගොඩනැගීමට ප්‍රභූ පැළැන්තියට වූ නොහැකියාව ද ප්‍රදර්ශනය කළේ ය. 1956 මැතිවරණයේ වැදගත්කම රඳා පවතින්නේ ද මෙම කරුණ මත ය. මධ්‍යස්ථ වාමාංශික සිංහල ජනප්‍රිය බලවේගවල සභාගය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ, එස්. ඩබ්, ආර්. ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන්, දකුණේ ජයග්‍රහණය කරන ලද අතර, දෙමළ උතුරේ පෙඩරල් පක්ෂය ජය ලැබී ය.

ආණ්ඩුව පිහිටුවීමෙන් පසු, 1956 දී බණ්ඩාරනායක තම මැතිවරණ පොරොන්දුවක් වූ සිංහල රාජ්‍ය භාෂාව කිරීම ක්‍රියාත්මක කරමින්, දෙමළ ජනයාගේ වික්ෂිප්තභාවයේ හදවත වැනි වූ අධ්‍යාපනය හා රැකී රක්ෂා මඟින් දියුණුවීමේ හැකියාවට පහර එල්ල කළේ ය. ඊටත් වඩා බරපතළ ලෙස, ඔහු ව බලයට පත්කළ සිංහල බෞද්ධ සභාගය, ජනවාර්ගික සහයෝගීතාවට තව තවත් හානි පමුණුවන ස්ථාවරයන්ට ඔහු ව තල්ලු කළේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, භාෂා ප්‍රතිපත්තිය නිසා දෙමළ ජනයා ට විඳින්නට සිදු වූ අපහසුතාවයට පිළියම් යෙදීමක් වශයෙන් 1957 දී දෙමළ භාෂා විශේෂ විධි විධාන පනත හා රට සභා මඟින් බලය විමධ්‍යගත කිරීම අරභයා ෆෙඩරල් පක්ෂ නායක චෙල්වනායගම් සමග ඇතිකරගත් ගිවිසුමට සිංහල ඡන්ද කොට්ඨාශයේ සහජ ජාතිවාදය සහ එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන අවස්ථාවාදය විසින් බාධා පමුණුවන ලදී. 1956 දී හා 1958 දී ස්වාධීන ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ප්‍රචණ්ඩකාරී සිංහල දෙමළ කෝලාහල ඇති වූ අතර, 1983 දී එම තත්වයේ උග්‍රවීම පෙන්නුම් වන්නේ, මිනිස් ඝාතන ප්‍රමාණය ඉක්මවා යාමෙනි.

මීළඟ දශකය පුරාවට ම ජනවාර්ගික කොටස් අතර සම්බන්ධතාව තව දුරටත් පිරිහීම එසේ තිබියදීත් දෙමළ නායකත්වය දිගටම පාර්ලිමේනත්තුව නියෝජනය කළේය. බණ්ඩාරනායක ගේ වැන්දඹුව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රථම ආණ්ඩු සමයේ දී (1960-1964) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය වඩා සක්‍රිය ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ අතර, බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමේ අඩංගුවී තිබූ බලය විමධ්‍යගත කිරීමේ යෝජනා ක්‍රියාත්මක කරන බවට දෙන ලද පොරොන්දුව ද කඩ කෙරිණි. බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමේ වගන්ති ක්‍රියාත්මක කරන බවට දුන් සහතිකයක් මත එක්සත් ජාතික පක්ෂය සමග ගිවිසුමකට එළැඹි ෆෙඩරල් පක්ෂය, 1965 පිහිට වූ එ.ජා.ප.ය ට වැඩි බලයක් හිමි ජාතික ආණ්ඩුවට සම්බන්ධ විය. දෙමළ භාෂා විශේෂ විධි විධාන පනත සම්මත කරනු ලැබුව ද, බලය විමධ්‍යගත කිරීමට අදාළ කොටස ක්‍රියාත්මක නොවූ හෙයින් 1969 මැද භාගයේ දී ෆෙඩරල් පක්ෂය ආණ්ඩුවෙන් ඉවත් විය.

ශ්‍රීලනිපය හා එජාපය අතිමහත් බහුතරයක් පාර්ලිමේන්තුව තුළ ලබා ගනිමින් තමන්ගේම ව්‍යවස්ථා සකස් කිරීමට මඟ පෑදූ 70 දශකය තීරණාත්මක විය. 1972 හා 78 යන ව්‍යවස්ථා දෙකම සිංහල රාජ්‍ය භාෂාව හා බහුතරයේ ආගම වූ බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් දුන් ඒකීය රාජ්‍ය තත්ත්වය අත්පත් කරන නියමයන් අඩංගු ඒවා විය. 1978 එජාප ව්‍යවස්ථාව තවදුරටත් කේන්ද්‍රය මත බලය ඒකරාශී කරන විධායක ජනාධිපති ක්‍රමයක් ස්ථාපිත කළේය.

ආයුධ සන්නද්ධ තරුණයින් සමඟ දේහපාලන සම්මුතියකට පැමිණීම එජාප හා ශ්‍රීලනිප දේශපාලන අවස්ථාවදය විසින් වැළැක්විණි. 71 ජවිපෙ කැරැල්ලේ ආදර්ශය මඟින් උදක් ආයුධ ගත් දෙමළ කණ්ඩායම් ඇති වීම දෙමළ සමාජය දක්නා ලද්දේ සාම්ප්‍රදායික දේශපාලන නායකත්වයේ විතැන් වීමක් ලෙස ය. 1970-77 ශ්‍රීලනිප ආණ්ඩුවේ අසාධාරණ අධ්‍යාපන ප්‍රතිපත්තියත් 1977-88 ත්‍රස්තවාදයට විරුද්ධව එජාප ප්‍රතිපත්තියත් 80 ගණන් වලදී උතුරු-නැගෙනහිර යුධ තත්ත්වයක් ඇති කරන්නට හේතු විය. වෙන්වීම අවසාන විසඳුම ලෙස ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ 76 දී දෙමළ නියෝජිතයන්ගේ වඩුක්කොඩෙයි සම්මේලනයේ දී කළ යෝජනාව සම්මත විය. මෙය දේශපාලන සම්මුතියක එළඹීමට නොහැකි වීමේ ප්‍රතිඵලය විය.

# අපගේ ආචාර ධර්ම රාමුව - එකට බැඳ තබන බැමි

ජනමාධ්‍යවේදීන් වශයෙන් සෑම දිනකම අපට සදාචාරාත්මක තීරණ ගැනීමට සිදුවේ. එහෙත් ගැටුම් අවස්ථාවලදී අපේ ආචාර විධි පද්ධතිය මගින් අපට සලසන්නා වූ ආරක්ෂාව ඉතා වැදගත් ය. මන්දයත් තත්වය සෑම විට ම පාහේ පැහැදිලි නැති බැවින් හා විවිධ පාර්ශවයන් බොහෝ විට ඔවුන්ගේ න්‍යාය පත්‍රයන් ඉදිරියට තල්ලු කිරීමට උත්සාහ ගන්නා බැවිනි.

ජනමාධ්‍යවේදීන්ට ස්වාධීන ව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් තිබේ. සිරස්තලය කුමක් විය යුතු ද, සම්මුඛ සාකච්ඡා පවත්වන්නේ කා සමග ද, අවශ්‍ය ඡායාරූප මොනවා ද, උපුටා දැක්වීම් මොනවා ද, භාවිතා කරන භාෂා ශෛලිය කුමක්ද යනාදිය මෙන් ම අප කුමන ප්‍රවාදයන් ආවරණය කරන්නේ ද සහ එසේ කරන්නේ මන්ද යනාදී වූ මූලික කරුණු ගැන තීරණ ගැනීමට සිදුවේ.

### ගැටුම් අවස්ථාවලදී වාර්තාකරණය සඳහා ජනමාධ්‍යවේදීන්ට මගපෙන්වීම් අවශ්‍ය වන්නේ ඇයි?

- අප ස්වාධින ව වැඩ කරන නිසා
- ප්‍රවෘත්ති ආයතනවල ඇතුළතින් හා ඉන් පරිබාහිර ව සිදුවන බලපෑම් හා පීඩනයෙන් මිදීම සඳහා
- ප්‍රවෘත්ති කාමරය තුළ සහ ජන සමාජය තුළ අපේ වැඩ කටයුතු ආරක්ෂා කර ගැනීම සඳහා
- ආචාරධාර්මික ප්‍රශ්න හා උභතෝකෝටික ප්‍රශ්න විසඳගැනීමට ඉවහල් වීම

යහපත් පැවැත්මෙන්, කල් ක්‍රියාවෙන් සහ ස්වයං පාලනයක් මගින්, වෘත්තියට හා සමාජයට හානිකර ක්‍රියාකාරීකම්වල යෙදෙන්නන් සහ අරමුණු ඇති අය හෙළිදරව් කිරීම අප සහෝදර පුවත්පත් කලාවේදීන්ගේ වගකීම වේ.

තමන්ගේ වැඩ කටයුතු කරගෙන යන ආකාරය ගැන පිටස්තර බලවේග විසින් උපදෙස් දීම ජනමාධ්‍යවේදීන් විසින් පොදුවේ විරෝධය දක්වනු ලැබුව ද, එය සෑම විටකදීම සරළ කටයුත්තක් නොවේ.

බොහෝවිට උපරිම පීඩනය පැමිණෙනු ඇත්තේ අපගේ ම මාධ්‍ය ආයතනය තුළින් ම විය හැක. මෙයින් අදහස් වන්නේ ඔවුන්ගේ වෘත්තීයමය ආචාර ධර්මයන්ට පටහැනි වන ලෙස උපදෙස් ලැබිය හැකි බව ය. එමෙන් ම ඔවුන්ගේ ලියවිලි, ඒවායේ ඒකාග්‍රතාවයට හානිවන පරිදි උග්‍ර සංස්කරණයකට භාජනය කළ හැකි ය.




බුද්ධික වීරසිංහ

*වෘත්තියට සහ සමාජයට හානි සිදු කරන පුද්ගලයන් හෙළිදරව් කිරීම ජනමාධ්‍යවේදීන්ගේ වගකීමකි.*

හොඳම මග පෙන්වීම් කළයුතු හා නො යුතු දෑ දැක්වෙන ලේඛනයන් නොවේ. හොඳ මාර්ගෝපදේශනයක් ආචාර ධාර්මික වාද විෂයන් ගැන සිතන්නට යොමුවන අදහස් ගොනුවකි. එවිට ඔවුන්ට මතුවන පරස්පර විරෝධී ගැටලු කෙරෙහි ජනමාධ්‍යවේදීන්ට විශ්වාසයකින් යුක්ත ව අවධානය යොමු කළ හැක.

තමන්ගේ ලියවිලි අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම හෝ සංස්කරණ ක්‍රියාවලිය මගින් ඒවා විනාශ කිරීම අභියෝගයට ලක් කිරීමට, මග පෙන්වීම් ජනමාධ්‍යවේදීන්ට පදනමක් කරගත හැකිවාක් මෙන් ම, ජනමාධ්‍යවේදීන්ගේ වැඩ කටයුතු හසුරුවන අයට ද උපකාර විය හැක.

අවසාන වශයෙන්, ජනමාධ්‍යවේදීන් ඔවුන්ගේ වැඩකටයුතුවලට ප්‍රවේශ වන්නේ කෙසේද කියා මහජනතාව දැනුවත් කිරීම සඳහා මඟපෙන්වීම් ප්‍රයෝජනවත් වන අතර, පුවත්පත් කලාවේදීන්ට ඔවුන්ගේ තීරණ ප්‍රසිද්ධියේ ආරක්ෂා කර ගැනීමට ද උපකාරී වේ.

## ජනමාධ්‍යවේදීන්ගේ ආචාර ධර්ම පිළිබඳ ව ජ. ජා. ස. ප්‍රතිපත්ති ප්‍රකාශනය

සිද්ධීන් විස්තර කිරීමේදී ප්‍රවෘත්ති එකතුකර ගැනීමේ දී, විකාශනය කිරීමේ දී, බෙදා හැරීමේ දී සහ පුවත් සහ තොරතුරු ගැන අදහස් දැක්වීමේ දී ජනමාධ්‍යවේදීන් විසින් පවත්වාගතයුතු පිළිගත් වෘත්තීයමය ආචාර ධර්ම මෙම ජාත්‍යන්තර ප්‍රකාශනය මගින් ප්‍රකාශ වේ.

1. පුවත්පත් කලාවේදියකුගේ මූලික වගකීම වන්නේ මහජනතාවගේ සත්‍යය දැන ගැනීමේ අයිතිවාසිකමට හා සත්‍යයට ගරු කිරීමයි.
2. මෙම යුතුකම ඉටු කිරීමේදී, පුවත්පත් කලාවේදීන් විසින් සෑම විට ම නිදහස් ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමටත් අවංක ව ප්‍රවෘත්ති එකතු කිරීමට හා ප්‍රකාශයට පත් කිරීමටත්, සාධාරණ අදහස් ප්‍රකාශනයටත් විවේචනයටත් ඇති අයිතීන් ආරක්ෂා කළ යුතුය.
3. පුවත්පත් කලාවේදීන් විසින් වාර්තා කළ යුත්තේ ඔහු හෝ ඇය විසින් මූලාරම්භය දන්නා කරුණු අනුව පමණි.
4. පුවත්, ඡායාරූප හෝ ලියකියවිලි ලබාගැනීම සඳහා පුවත්පත් කලාවේදියා විසින් අනුගමනය කළ යුත්තේ සාධාරණ ක්‍රියාමාර්ග පමණකි.
5. ප්‍රකාශයට පත් කරන ලද තොරතුරක කිසියම් හානිදායක වැරැද්දක් සිදුවී ඇත්නම් එය නිවැරදි කිරීමට තමන්ට හැකි සෑම දෙයක්ම පුවත්පත් කලාවේදියා ඉටු කළ යුතු ය.
6. රහස්‍යභාවය මත ලබාගත් තොරතුරු මූලාශ්‍ර හෙළි නො කිරීමේ වෘත්තීමය රහස්‍යභාවය පුවත්පත් කලාවේදියා විසින් රැකිය යුතුය.
7. මාධ්‍ය විසින් අසාධාරණ සාධක මත වෙනස්කම් කිරීමේ භයානක කම ගැන දැනුවත් වියයුතු අතර, වෙනත් කරුණුවලට අමතර ව, ජාතිය, ලිංගය, ලිංගික චර්යාව, භාෂාව, ආගම, දේශපාලන හා වෙනත් අදහස් සහ ජාතික හා සමාජ ප්‍රභවය මත පදනම් වූ සාධක මත වෙනස්කම් කිරීම වළක්වාලීම සඳහා කළ හැකි සෑම දෙයක් ම කළ යුතු ය.
8. පහත දැක්වෙන කරුණු බරපතළ වෘත්තීමය අපචාරයන් ලෙස පුවත්පත් කලාවේදීන් සැලකිය යුතු ය. අන්‍යයෙකු ගේ අදහස් හෝ මත තමන්ගේ ලෙස ප්‍රකාශ කිරීම, ද්වේශ සහගත ලෙස සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම, අයුතු චෝදනා, නින්දා, අපහාස සහ පදනම් විරහිත චෝදනා හා කිසියම් තොරතුරක් ප්‍රකාශයට පත්කිරීම සඳහා හෝ පත්කිරීම වළක්වාලීම සඳහා හෝ කුමන ආකාරයක හෝ අල්ලසක් ලබාගැනීම.
9. පුවත්පත් කලාවේදී යන නාමයෙහි ගෞරවය ආරක්ෂා කරන අයෙක් වෙත්නම් ඔවුන්ගේ වගකීම වන්නේ ඉහත දැක්වෙන ප්‍රතිපත්ති විශ්වාසවන්ත ව අනුගමනය කිරීම යි. සෑම රටක ම පොදු නීතියට යටත් ව, වෘත්තීමය ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පුවත්පත් කලාවේදීන් විසින් පිළිගත යුත්තේ සහෝදර පුවත්පත් කලාවේදීන්ගේ අධිකරණ බලය පමණි. ආණ්ඩුවල හෝ වෙනත් මැදිහත්වීම් ප්‍රතික්ෂේප වේ.

(1954 ජ. ජා. ස. ලෝක සම්මේලනය මගින් පිළිගන්නා ලදී. 1986 ලෝක සම්මේලනයේ දී සංශෝධනය කරන ලදී.)

# නිරවද්‍යතාව, ඕපාදූප සහ සත්‍යය ප්‍රකාශ කරන්නෝ

ඕනෑකමින් ම විකෘති නො කරන ලද හා වසන් නො කරන ලද ප්‍රවෘත්ති, අවංක ව නිවැරදි ව හා විශ්වාසවන්ත ලෙස වාර්තා කිරීමට ආචාර ධර්මීය, සදාචාරමය හා වෘත්තීයමය වගකීමක් මාධ්‍යයට ඇත. ජනතාවට ප්‍රවෘත්ති මාධ්‍යය කෙරෙහි විශ්වාසයක් ඇතිවීමත්. ඔවුන් මාධ්‍ය මගින් කියවන හා දකින දෑ සත්‍ය, සාධාරණ හා සමබර පුවත් බවට හැඟීමක් ඇතිවීමත්, ජනමාධ්‍යයට මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයේ යහපත් ක්‍රියාකාරීත්වයට ද වැදගත් වේ. ගැටුම් පිළිබඳ වාර්තා කරන ජනමාධ්‍යවේදීන් මුහුණදෙන ප්‍රධාන ගැටලුවක් නම්, සත්‍ය සමග විවිධ කතා තරඟ වැදීම ආදිය ඉදිරියේ නිරවද්‍යතාව සහතික කිරීම ය. බොහෝ විට වාසිය තකා ප්‍රවෘත්ති හැසිරවීම හෝ ප්‍රවෘත්ති බලධරයකු විසින් සමීක්ෂණයට අනුව සාවද්‍ය වාර්තාකරණය සඳහා හේතුවන ප්‍රධාන සාධකයක් නම් විශ්වාසයක් තැබිය නොහැකි මූලාශ්‍ර යි. මේ සම්බන්ධයෙන් නරක ම වැරදිකරුවන් වන්නේ රාජ්‍ය බලධාරීන් ය.

භාෂා බාධක සහ වෙනත් භාෂා කණ්ඩායම්වලින් නිවැරදි ප්‍රවෘත්ති ලබාගැනීමේ අපහසුතාවය වාර්තාකරණයේ දී නිවැරදිභාවය රැකීමේ බාධක ලෙස සමීක්ෂණය මගින් ඉස්මතු කොට තිබේ.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට ලැබී ඇති පැමිණිලිවලින් බහුතරයක් කරුණු අතින් සාවද්‍ය වාර්තා සම්බන්ධ පැමිණිලි වීම වැදගත් ය.

ප්‍රවෘත්ති වාර්තාවේ පසුබිම වැදගත් වුව ද, ප්‍රවෘත්ති වාර්තාවක් යනු කිසියම් මතයක් ඉදිරිපත් කරන කතුවැකියක් හෝ විශේෂාංග ලිපියක් නො වන බව පුවත්පත් කලාවේදීන්ට පැහැදිලි විය යුතු ය. ප්‍රවෘත්ති වාර්තා සෑම පැතිකඩක් ම වාර්තා කළ යුතු වේ. කිසියම් දෙයක් අත්හැරීම හෝ වෙනත් දෙයක් එකතු කිරීම වංචා කිරීමකි. පුවත්පත් කලාවේදියෙකු ප්‍රවෘත්ති වංචා කළ විට, (විශේෂයෙන් ගැටුම් සම්බන්ධ ප්‍රවෘත්ති) විශ්වාසය කඩවන අතර ජීවිත හානියට ද මග පෑදිය හැක.

කිසියම් ප්‍රවෘත්තියක් සාවද්‍ය බව පසුව දැනගතහොත්, මහජනයා සමග විශ්වාසය පවත්වාගෙන යෑම සඳහා, මුලින් ම කළ යුතු වන්නේ නිවැරදි කිරීමක් කොට වරද සිදු වූ ආකාරය හා අවස්ථාව පැහැදිලි කර දීමයි.

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ වූ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 20 ඡේදය යටතේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ යෝජනාව අනුව ‘වෛර කථනය’ නිර්වචනය වන්නේ මෙසේ ය.

“1. යුද්ධය සඳහා වන ඕනෑ ම ප්‍රචාරණයක් නීතියෙන් තහනම් විය යුතු ය. 2. ජාතිය, වර්ගය හෝ ආගම අනුව වෛරව වෙනස්කම් කිරීම, එදිරිවාදිකම් කිරීමට හෝ ප්‍රචණ්ඩ ක්‍රියා කිරීම නීතියෙන් තහනම් විය යුතු යුතු ය.”

නො සැලකිලිමත් හා ද්වේශසහගත වාර්තාකරණය මගින් ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය උසිගන්වනු ලැබීමට පුවත්පත් කලාවේදින් දඩමීමා කර ගැනීමට ඉඩ නො තැබිය යුතු බවට ඔවුන් අතර පොදු සම්මුතියක් තිබේ. දේශපාලන නායකයින් සමාජයේ විශේෂිත කොටසකට හෝ කණ්ඩායමකට ගැටුම් ඇතිවන ආකාරයකට කථාවෙන් පහර දෙන විට මෙය උභතෝකෝටික ප්‍රශ්නයක් වෙයි.

පුවත්පත් කලාවේදීන් ඔවුන් ගේ වැඩ කටයුතු කිරීමේ දී, සංවේදී හා ප්‍රවේසම් විය යුතු නමුදු, ඔවුන්ගේ ප්‍රමුඛතාවය වන්නේ වාර්තාකිරීම යි. සමාජයට සත්‍ය ප්‍රකාශ කරන්නකු ලෙස ඇති වගකීමයි. ස්වයං වාරණයක් පනවාගෙන වාර්තා නො කර සිටීමෙන් ඕපාදූප පැතිරීමට ඉඩකඩ සැලසෙන අතර, වාර්තාකරණයට පාදක වන සිද්ධියේ හෝ ප්‍රවාදයේ පසුබිම හා සන්දර්භය සමග නිවැරදි ව වාර්තා කිරීමට වඩා වැඩි හානියක සෑම විට ම සිදු විය හැක.

වෘත්තීය හා දේශපාලන කැපවීම් අතර ඇති ආතතිය ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේදීන් අතර ඇති වූ ඉතාමත් ම සජීව සංවාදයක් වූ අතර, ආතතිය තව දුරටත් අවුස්සාලිය හැකි කරුණු වාර්තා කළ යුත්තේ කෙසේ ද යන්න සඳහා විවිධ මත පළ විය. ඇතැමෙකු ගේ මතය වූයේ සමාදානය පවත්වාගෙන යෑම කෙරෙහි ප්‍රමුඛතාව දියයුතු බව වුව ද, අන් අයගේ මතය වූයේ වැඩි ප්‍රමුඛතාවක් දැක්විය යුත්තේ වාර්තාකරණයට බවයි. සමාන ගැටුම්වලට මුහුණදුන් සමාජයන් හි අත්දැකීම්, උදා: අප්‍රිකාව, මෙහි දී ප්‍රතිබිම්බනය විය.

බොහෝ දෙනාගේ තර්කය වූයේ එය වාර්තා කරනවා ද නැද්ද නොව වාර්තා කරන්නේ කෙසේ ද යන්න ය.

### නිරවද්‍යතාවය සඳහා පිරික්සුම් ලේඛනය ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍ර වෙන් වෙන් ව හඳුනා ගැනීම.

- සෑම විට ම කීර්තිමත් මූලාශ්‍ර භාවිතා කළ යුතු වීම. හැකි සෑම විට ම ප්‍රාථමික තොරතුරු භාවිතා කරන්න.
- ප්‍රශ්න ගැන හා සිද්ධීන් ගැන විශේෂඥ ප්‍රාථමික තොරතුරු සැපයිය හැකි පැතුරුණු මූලාශ්‍ර ජාලයක් වගාකර ගැනීම. විශේෂයෙන් ම අන්‍ය ජනවාර්ගික කොටස්වලින් සහ භාෂා කොටස් අතරින්.
- අපරාධ වාර්තාකරණයේ දී සැකරුවන්ගේ පැත්තෙන් ද තොරතුරු ලබා ගැනීම.
- පුද්ගල නාම සහ ස්ථාන නාම නිවැරදි ව ලියා ඇති බව තහවුරු කිරීම.
- කිසියම් වරදක් වූවා නම් එය නිවැරදි කිරීමට ක්‍රියා කිරීම.
- හරි වැරදි බැලීම අපහසු තැන්හි දී මරණ සංඛ්‍යාව දැක්වීම මග හරින්න.
- සිද්ධි අධ්‍යයනය: වචන ප්‍රවේශමෙන් තේරීම

## සිද්ධි අධ්‍යයනය : වාද විෂයය මගහැරීම/දුර්මත පැතිරීමෙන් වන විනාශය ගණන් බැලීම

2004 ජුනි මස දී, සිංහල පුවත්පත් දෙකක් නාට්‍යානුසාරයෙන් වාර්තාකරන ලද්දේ ප්‍රභාකරන් හා කරුණා පාර්ශව අතර තොප්පිගල කැලෑවේ ඇති වූ ගැටුමකින් සටන් කරුවන් 75 ක් මරුමුවට පත් වූ බව සහ 100 කට අධික සංඛ්‍යාවක් තුවාල ලැබූ බවත් ය.

සිරස්තල අතර මේවා විය.

*ප්‍රභාගේ 80 ක් සහ කරුණාගේ 11 ක් ගතවූ දින 3 ඇතුළත මිය යති. ඊයේ දවල් වන විටත් දරුණු සටන්.*

*‘තොප්පිගල අල්ලන්න ප්‍රභා - කරුණා අතර ඇඩි සටන්. අරුල් රාජ් කඳවුර විනාශයි. මිය ගිය ගණන 75 ට වැඩියි: 100 කට වඩා තුවාලයි.’ ප්‍රභා සහ කරුණා කල්ලි අතර තොප්පිගල ගැටුම උග්‍ර වෙයි. දෙපැත්තේම මියගිය ගණන සියයකට ආසන්නයි.*

*විකාශනය වූ ප්‍රවෘත්ති වාර්තාවකින් ද කියවුණේ ‘100 කට අධික සංඛ්‍යාවක් මිය ගොස් ඇති බවයි.’*

කෙසේ වුව ද අනෙකුත් සිංහල පුවත්පත් ඊළඟ දිනයේ දී මේ සිද්ධිය පිළිබඳ ව කෙටි පුවත් පළ කළ අතර, කොළඹ පළ කෙරෙන දෙමළ දෛනික පුවත්පත් මෙන්, අනිත් සිංහල පුවත්පත් ද මේ ගැන කිසිවක් වාර්තා නො කළ හ. ශ්‍රී ලංකා යුද හමුදාව හෝ නැගෙනහිර හමුදා අණදෙන නිලධාරියා හෝ මෙ වැනි සටනක් සිදු වූ බවට වාර්තා නො කළේ ය.. එල්ටීටීඊ වෙබ් අඩවියකින් කියා සිටියේ මෙය ආණ්ඩුව විසින් ගෙතූ කථාවක් බව ය. අවසානයේ දී, බෝම්බයක් පිපිරීමෙන් එල්ටීටීඊ ක්‍රියාකාරීන් 8 දෙනෙක් මියගිය බවට යුද හමුදා බලධාරීන් ප්‍රකාශ කළ විට සත්‍යය පැහැදිලි විය. එනම්, ඔවුන්ගේ සිංහල පාඨකයින් සඳහා පුවත්පත් විසින් මෙම කථාව ගොතා පළකළ බවයි.

මේ පුවත්පත් වාර්තා සඳහා මූලාශ්‍ර සඳහන් කර තිබුණේ නැතුවාක් මෙන් ම, කිසිදු මාධ්‍ය ප්‍රකාශනයක් මෙම වාර්තා නිවැරදි කිරීමට පියවර ගත්තේ ද නැත. එමගින් සත්‍යය දැන ගැනීමට ඇති වගකීම අපකීර්තියට පත්කළා පමණක් නොව, රට වැසියනට සත්‍යය දැන ගැනීමට ඇති අයිතීන් ද කෙළෙසනු ලැබී ය. මෙ වැනි ජනමාධ්‍යවේදයක් මගින් පාඨකයින් මුළා වන අතර, ඔවුන් සහ මාධ්‍ය අතර පවතින විශ්වාසය බිඳ වැටීමට ද හේතු වනවාක් මෙන් ම අනාගතයේ වාර්තා කෙරෙන දේවල්වල සත්‍යතාවය ප්‍රශ්න කිරීමට ද පෙළඹෙනු ඇත.

# ඇසට පෙනෙනවාට වැඩි යමක්

බොහෝ උදාහරණ මගින් සාකච්ඡා කර ඇත්තේ ප්‍රචණ්ඩත්වය හෝ ඇත්ත ගැටුම් දෙපාර්ශ්වයේ ම ජනවාර්ගිකත්වය සමග කිසිම සම්බන්ධයක් නොමැති එහෙත් ආර්ථික කරුණු ඒවාට හේතු වන බවය.

ජනවාර්ගිකත්වයට සිද්ධීන් ලඝු කිරීම තුළින් භයානක තත්ත්වයන් ඇති විය හැකි ය. සන්දර්භය සහ පසුබිම ජනමාධ්‍යවේදීන් විසින් හෙළිදරව් කළ යුත්තේ එහෙයිනි. මේවා ප්‍රජාවන් නොදන්නා තරමට ම දේශපාලන ව්‍යාජ චිත්‍රයන්ට ලෙහෙසියෙන් හසු වේ.

## යහපත් භාවිතය සඳහා ප්‍රශ්න

1. කිසියම් දේශපාලන නායකයෙක් නිරන්තර ව එක් ජාතිවාදී කණ්ඩායමකට හෝ ජනවාර්ගික කණ්ඩායමකට පහර දෙමින් කථා පවත්වන්නේ නම්, එම කථා ප්‍රවෘත්ති සේ සැලකිය හැකි ද?
2. එවැනි කථාවක් වාර්තා කරන්නේ නම්, එහි අඩංගු චෝදනා පරීක්ෂාවට ලක්වී ද යන්න හා ඉන් දෝෂාරෝපණයට පත් වූ අයට ඒවා ට පිළිතුරු දීමට හෝ එම චෝදනා ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ප්‍රස්තා ලබා දුන්නේ ද?
3. ජනවාර්ගික ගැටුම් පිළිබඳ වාර්තා ඔබගේ ප්‍රකාශනය විසින් රඳවා තබා ගන්නේ ද? කරුණු සහ ඒවායේ සන්දර්භය ලබා දී, දේශපාලන වාසිය තකා ජනවාර්ගික ගැටුම් පාවිච්චි කරන අය විමසා වඩාත් හොඳ වාර්තාවක් ලබාදිය හැකි ද?
4. අපරාධ සම්බන්ධයෙන් චූදිත පුද්ගලයින්ගේ ජනවාර්ගිකභාවය හෝ ආගමික කොට්ඨාශය සෑම විට ම සඳහන් කරන්නේ ද යන්න හෝ එසේත් නැතිනම් ඇතැම් ජනවාර්ගික කොටස් හෝ ආගමික කොටස් සම්බන්ධයෙන් පමණක් ද?
5. අපරාධ වැනි කරුණු සම්බන්ධයෙන් අතිකුත් කොටස්වලට වඩා එක්තරා ජනවාර්ගික කොටසක් නම් කිරීමේ පුරුද්දක් ඔබේ ප්‍රකාශනයට තිබේද? ඔබේ ප්‍රවාදයන් හි එක් ජනවාර්ගික කොටසක් හෝ සුළු ජන කොටසක් වෙනත් එවැනි කොටසක් සමග පොරට යෙදවීමට ඔබ කිසි විටෙක ක්‍රියා කොට තිබේද?
6. යථා තත්වය එතරම් ගැටුම්කාරී හා ප්‍රචණ්ඩ නො වන අවස්ථාවලදී, එවැනි පොරට යෙදවීමක් මගින් වඩා හැඟීම් අවුස්සනසුලු හා වඩා කියවීමට යොමුවන ප්‍රවාදයන් බිහි කිරීමට උත්සාහ ගෙන තිබේද?
7. කිසියම් වාර්තාවක් සාවද්‍ය බව වැටහුණ විට, එය නිවැරදි කිරීමට ඔබේ සංවිධානය ගන්නා පියවර කවරේ ද? නිවැරදි කිරීම් ප්‍රසිද්ධ කිරීමේ ප්‍රතිපත්තියක් ඔබේ සංවිධානයට තිබේ ද? මෙම සදාචාර කරුණු පිළිබඳ ව ඔබේ ප්‍රවෘත්ති කාමරයෙ ජනමාධ්‍යවේදීන් අතර සාකච්ඡා සඳහා පෙළඹවීමට ඔබ අදහස් කරන්නේ කෙසේ ද?

### සමබරතාවය සඳහා පිරික්සුම් ලැයිස්තුව

- එක් පාර්ශවයකට ඔල්වරසන් දීමෙන් වළකින්න.
- වෙනස් ස්ථාවරයෙන් තහවුරු කොටගෙන ඒවා නිසි ගරුත්වයෙන් හා නිවැරදි ලෙස ඉදිරිපත් කෙරෙන බවට වග බලාගන්න.
- මෙම මත පවතින සන්දර්භය සිහියේ තබා ගන්න. ඇතැම් අදහස් දරන්නේ අන්තවාදී බහුතරයක්ද? අන් අයගේ අදහස් තමන්ගේ වචනවලින් නො ලියා, හැකි සෑම විට ම, කෙළින් ම ඔවුන් ව උපුටා දක්වන්න.
- ඔබ ලියා ඇති ප්‍රවාදය ඇති සැටියෙන් ආගමික, ජාතිවාදී හෝ ජනවාර්ගික සංවේදීතාවයට හානිකර හෝ උත්සන්න වේ ද යන්න ඔබ ඔබෙන් ම විමසා සිටිය යුතු ය.
- ව්‍යාජ සමබරතාවයක් නිර්මාණය කිරීමෙන් වළකින්න. සියලු පාර්ශ්වයන් ට සමාන කුසලතා දීම සමබරතාවය නොවේ.
- ඔබ වාර්තාකරන්නේ මුළුමහත් ජන සමූහයට ම බව මතක තබා ගන්න. ඔබේ ජනවාර්ගික කොටසට පමණක් නොවේ.

### සිද්ධි අධ්‍යයනය : වචන ප්‍රවේශමෙන් තේරීම

පහත සඳහන් සිද්ධි අධ්‍යයනය පෙන්නුම් කරනුයේ අගතිගාමීත්වය හා පක්ෂග්‍රාහිත්වය මඟින් සත්‍යය විකෘති කළ හැක්කේ කෙසේ ද යන්න ය.

සමබරව කරුණු ඉදිරිපත් කිරීම සඳහා සන්දර්භය ඉදිරිපත් කරනු වෙනුවට ප්‍රජාවන් අතර බෙදීමක් නිර්මාණය වන ලෙස කරන ලද වාර්තාකරණය හේතුවෙන් අන් සියල්ලටම ඉහළින් වාර්ගිකත්වය ඉස්මතු කර තිබේ.

කඳපොළ ජනවාර්ගික කලකෝලාහලවලදී පොලිස් වෙඩි පහරින් දෙමළ සේවකයින් දෙදෙනෙක් මිය ගිය විට, සිංහල දෛනික පුවත්පතක ප්‍රධාන සිරස්තලය වූයේ 'වෙඩි කා නසිති' යන්න ය.

මෙම පුවත්පත් ආවරණයේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන්, කඩසාප්පු අසූවක් විනාශ කළ අතර නගරය දවස් තුනක් තිස්සේ වසා දැමිණ. සිංහල හා දෙමළ ජනයා අතර සම්බන්ධතා පිරිහීමට ලක්විය. (කඳපොළ නගරයේ බහුතරය දෙමළ ජනයා වෙති.)

'වෙඩි කා නසිති' යන කියමනෙන් අදහස් වන්නේ මරණයට පත්වූ අය විසින් වෙඩි තැබූවන් ප්‍රකෝප කළ බවකි. එය 'වෙඩි වැදී නසිති' යනුවෙන් තිබුණේ නම් එහි තේරුම හා අන්තර්ගතය වෙනස් ස්වරූපයක් ගනී.

මෙම මිනිස් ඝාතනයන් ගැන මෙ වැනි මුල් පිටුවේ සිරස්තලයක් යෙදීමට පුවත්පතේ කර්තෘවරයා තීරණය කළේ ඝාතන ගැන විධිමත් පරීක්ෂණයකින් පසුව ද? මෙම සිද්ධියට ගොදුරු වූයේ සිංහල දෙදෙනෙක් නම් කතුවරයා සිරස්තලය වෙනස් ලෙස යොදයි ද?

ජනවාර්ගික කෝළාහල වාර්තාකිරීමේ දී, පුවත්පත් කලාවේදීන් විසින් තම වාර්තා තුළ සියලු ම පාර්ශවයන් සමබර හා සාධාරණ ලෙස නිරූපිත ව ඇත්දැ යි තමන්ගෙන් ම විමසා බැලීම සුදුසු ය. එසේ කිරීමට අසමත් වුවහොත් ඔවුන්ගේ වාර්තාකරණය මගින් ප්‍රචණ්ඩත්වය තවත් ප්‍රකෝපකාරී වීමට ඉඩ තිබේ.

කඳපොළ සිද්ධිය සම්බන්ධයෙන් සිංහල හා දෙමළ පුවත්පත් වල පළ වූ වාර්තා එකිනෙකට බොහෝ සෙයින් වෙනස් වේ.

දෙමළ පුවත්පත් වාර්තා කළේ කඩ සාප්පු 52 කට හානි වූ බවයි. එයින් ගම්‍ය වූයේ වැඩි හානියක් සිදු වී ඇත්තේ දෙමළ ජන කොටසට බව පෙන්වීම ය.

සිංහල පුවත්පත් හැඟවීමට උත්සාහ කළේ දෙමළ වතු කම්කරුවන් විසින් ඇති කරන ලද කැරැල්ලක් මෙම සිදුවීම්වලට මුල් වූ බවයි.

මීට අමතර ව, සියලු ම සිංහල පුවත්පත් සිද්ධිය වීමට ආසන්නතම හේතුව වශයෙන් දක්වන ලද ත්‍රිරෝද රථයක් සහ බස් රථයක් ගැටීම, ආපසු බැලීමේ දී බෙහෙවින් ම අතිශයෝක්තියක් බව ඔප්පු විය.

මාධ්‍යයේ ප්‍රධාන වගකීම වන්නේ සත්‍යය, සත්‍යය සහ සත්‍යය දැන ගැනීමට මහජනයාට ඇති අයිතියට ගරු කිරීම නම්, සිංහල හා දෙමළ ජනයාට වාර්තාකරන ලද සිද්ධීන්ගේ මෙතරම් වෙනස් වීමක් කෙසේ සිදුවිණි ද?

### සන්ධර්භය සඳහා පිරික්සුම් ලැයිස්තුව:

- ගැටුමේ ඉතිහාසය පිළිබඳව පර්යේෂණ කරන්න.
- පුද්ගලයින්ගේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් මඟහරිමින් පුළුල් චිත්‍රයක් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්න.
- එක් එක් පාර්ශවය ලබාගන්නේ හෝ එයට අහිමි වන්නේ කුමක් ද යන්න පිළිබඳව විමසිලිමත් වන්න.
- බලපෑමට ගොදුරු වූ සාමාන්‍ය ජනයාගේ අදහස් ඉදිරිපත් කරන්න.

# ජනවාර්ගික බෙදීම

කිසියම් තැනක මතබේදයක් හෝ ප්‍රචණ්ඩත්වයක් ඇති වූ විට, පුවත්පත් කලාවේදියකුගේ කාර්යය වන්නේ සිදු වූ දේ වාර්තා කිරීමත් එය සිදුවීමට හේතුව සොයා බැලීමත් ය. එහෙත්, සැම සිදුවීමක් ම ජනවාර්ගික පදනමෙහි පිහිටා සිදු වූ බවට උපකල්පනය නොකළ යුතු ය.

සටන් විරාම ගිවිසුමට අට මසක් ගෙවුණු 2002 ඔක්තෝබර් මාසයේ දී, අම්පාර දිස්ත්‍රික්කයේ මුස්ලිම් බහුතරයක් සිටින අක්කරෙයිපත්තු නගරයේ මහා පරිමාණ ජනවාර්ගික කලබලයක් පැන නැගිණ. මුස්ලිම් කණ්ඩායම් පාරවල් හරස් කොට, ටයර් ගිනි තබා කඩ සාප්පු වසා දමන ලෙස බලකර සිටිය හ. හේතුව වූයේ - දෙමළ පුවත්පත් හැරෙන්නට - සියලු ම ප්‍රධාන පෙළේ මාධ්‍ය මගින් මෑතදී අතුරුදහන් වූ මුස්ලිම් තරුණයෙකු, එල්ටීටීඊය විසින් පැහැරගෙන ඇති බවට හා ඔහුව නිදහස් කිරීම සඳහා රුපියල් 50 ලක්ෂයක් කප්පම් වශයෙන් ඉල්ලා සිටින බවට වාර්තා වීම ය.

මාධ්‍ය විසින් මෙම කරුණුවල සත්‍යතාවය ප්‍රශ්න නො කරන ලද අතර තත්වය අරාජිකභාවයකට පත්වෙමින් තිබුණි. එල්ටීටීඊය මෙම පැහැරගැනීම ප්‍රතික්ෂේප කළ නමුදු මාධ්‍ය විසින් දිගින් දිගට ම එල්ටීටීඊය පැහැරගත් බවට වාර්තා කිරීම හේතුවෙන් කෝලාහලය ඇවිළවීමට පරිසරය සැකසුණි.

දින තුනක් තිස්සේ පාලනය කරගත නො හැකි තත්වයක් තිබූ අතර, තරුණයා ස්වේච්ඡාවෙන් ම ආපසු පැමිණියේ ය. ඔහු සැඟවී සිටි බව පිළිගත්තේ ය. ඔහු ව පැහැරගෙන ගිය බවටත්, නිදහස් කිරීම සඳහා කප්පමක් හෙවිය යුතු බවටත් කියන ලෙස ඔහු විසින් තම මිතුරෙකුට පවසා ඇත. මෙම කප්පම් මුදල විදේශගතවීමට යොදා ගැනීම අරමුණ විය.

මේ අවස්ථාවේදී කරුණුවල නිවැරදිතාවය හෝ මූලාශ්‍ර තහවුරු කොට නො ගෙන වාර්තා කිරීමෙන් මාධ්‍ය විසින් ප්‍රචණ්ඩ ජනවාර්ගික ගැටුමක් ඇවිළවීමට නිශ්චිත භූමිකාවක් රඟපා ඇත. සත්‍ය කරුණු හෙළිදරව් වීමෙන් පසුව, (එය මාධ්‍ය විසින් කරනලද ගවේශණයක ප්‍රතිඵලයක් ලෙසින් නොව, තරුණයාගේ පාපොච්චාරණය හේතුවෙනි.) කිසිදු සමාවක් ගැනීමක් හෝ කලින් ප්‍රකාශ කළ දේවල් වැරදි බවට පිළිගැනීමක් හෝ සිදු නො වී ය.

මාධ්‍යයේ පැහැදිලි වගකීම වන්නේ, සත්‍ය වාර්තාකිරීම බව මෙවැනි සිදුවීම් මගින් නැවත නැවතත් සිහිපත් කරන අතර සත්‍ය වාර්තා කළ නො හැකි වූ විට එමගින් සිදුවන්නේ අවිනිශ්චිත බව වැඩි වී ප්‍රචණ්ඩත්වය වැඩි වීම සහ ජාතියක් පිළිබඳ වැරදි අදහසක් වර්ධනය වීම ය.

ජනවාර්ගික ගැටුම් නිතර ම පාහේ සිදුවන, අවිශ්වාසය හා බිය නිතර ම පවතින ජනවාර්ගික විවිධත්වයක් ඇති අම්පාර නගරයෙහි පවත්වන ලද වැඩමුළුවක දී ජනමාධ්‍ය විසින් ඔවුන්ගේ ජනමාධ්‍ය භාවිතාවේ ඇතිවන බලපෑම් තේරුම් ගැනීමේ වැදගත්කම ගැන වාද විවාද කළ හ. මෙම ප්‍රවෘත්තිය මීට වඩා හොඳින් වාර්තා කළ හැකි අයුරු ඔවුන් සාකච්ඡා කළ හ.

වාර්තාකරණය මගින් ප්‍රවෘත්තිය ප්‍රථමයෙන් ම ජනවාර්ගික නොසන්සුන් බවක් ඇති රාමුවකට දැමුවේ ය. ගැටුම් සම්බන්ධ වාර්තාකරණයේදී ජනමාධ්‍යවේදීන්ට තෝරා ගැනීමක් ඇති බැව් ඔව්හු තේරුම් ගත්හ. (එනම් ගැටුම හා සම්බන්ධ ප්‍රවෘත්තිය හා එය මැඩ පැවැත්වීමට උත්සාහ කරන අයගේ ප්‍රවෘත්තිය ලෙස) එමෙන්ම ශීර්ෂපාඨ සාතන පිළිබඳව හෝ සාම ප්‍රයත්නය පිළිබඳව හෝ විය හැක.

## සිද්ධි අධ්‍යයනය : අපරාධ හා ජනවාර්ගිකත්වය

සිංහල පුවත්පතක 3 වෙනි පිටුවේ සිරස්තලයක් මෙසේ විය.

"ගෙදර වැඩට උදව් වීමට ගෙනා දැරියක් අවුරුදු හතරක් තිස්සේ සෙල්ලක්කාර තරුණයින්ට විකුණා ඇත. සැකකාර මුස්ලිම් යුවළක් රිමාන්ඩ් භාරයට."

යුවළගේ ආගම සිරස්තලය මගින් දැක්වීම හේතුවෙන් එය එ සැණින් ම ජාතිවාදී අගතියකට ලක් වේ. එහෙත් මෙම අපචාරය හා ජනවාර්ගිකත්වය අතර ඇති සම්බන්ධය කුමක්ද?

ශ්‍රී ලංකාවේ සිංහල මාධ්‍ය සංස්කෘතියට අනුව, සුළු ජන ජනවාර්ගික කණ්ඩායමකට අයත් පුද්ගලයෙකු කිසියම් වරදකට සැකකරුවෙකු වූ විට, ජනවාර්ගිකභාවය එම වරදට සම්බන්ධ කෙරේ.

කර්තෘ සංසදයේ ආචාර ධර්ම පද්ධතිය මෙසේ දක්වයි.
"පුද්ගලයෙකුගේ වර්ගය, වර්ණය, ආගම, ලිංගිකත්වය පිළිබඳවත්, ශාරීරික හෝ මානසික රෝග හෝ ආබාධ පිළිබඳවත් අගති සහගත හා අවඥා
සහගත කරුණු සඳහන් කිරීමෙන් පුවත්පත වැළකී සිටිය යුත්තේ ය.

## ජනවාර්ගිකත්වය යනු එදිරිවාදිකමක් නොවේ.

යහපත් ජනමාධ්‍යවේදීන් ජනවාර්ගික ප්‍රභවය වාර්තා කරන්නේ එය තමන්ගේ ප්‍රවෘත්තියට අදාළ වන විට පමණි.

දේශපාලනඥයෙක් හෝ ජනවාර්ගික දේශපාලන නායකයෙක් කිසියම් අදහසක් ඉදිරියට තල්ලු කිරීමට වෑයම් කරන විට එයට ඇත්ත වශයෙන් ප්‍රවෘත්ති වටිනාකමක් තිබේ ද යන්න හෝ එසේත් නැත්නම් එමඟින් ජනවාර්ගික ප්‍රකෝප කිරීම සඳහා මාධ්‍යය පාවිච්චි කිරීමට උත්සාහ දරනවා ද යන්න ගැන තක්සේරු කර දැනගත යුතු ය.

ස්ථාපිත ආදර්ශයන් ශක්තිමත් වන ලෙස කෙනෙකුගේ වාර්ගිකත්වය සඳහන් කිරීම මඟින් වරදක් කිරීමට මාධ්‍යවේදියකු පෙළඹිය හැක. එසේ කිරීමෙන් ඒ ඒ ජනවාර්ගික කොටස් කෙරෙහි ඇති පූර්ව විනිශ්චයන් ශක්තිමත් කෙරේ. මුස්ලිම්වරුන් වංචනිකයන් ලෙස, දෙමළ - කොටි ලෙස, සිංහල - ජාතිවාදීන් ලෙස යනාදී වශයෙනි.

ජනමාධ්‍යවේදීන් ජාතිය හෝ වර්ගය පිළිබඳ අපැහැදිලි ස්ථාවරයන් භාවිතා නොකළ යුතු ය. ඒමඟින් ජාති, ආගම් හෝ වාර්ගික සිතැඟි නොදැනුවත්ව ශක්තිමත් විය හැක.

වාර්ගික සමතුලනය අවුල්වන ආකාරයේ කර්තෘවරයකු තීරණ හෝ වාර්තාකරණයෙන් වැළකීම පිළිබඳව සාකච්ඡා කරන විට ජනමාධ්‍යවේදීන් බොහෝ දෙනෙකු තමන්ගේ ප්‍රථම යුතුකම සත්‍ය වාර්තා කිරීම හා මාධ්‍ය නිදහස ය යන්න පිළිබඳව එකඟ විය.

එක් ජනවාර්ගික කණ්ඩායමක් කෙරෙහි දක්වන දේශපාලන පක්ෂපාතභාවය රැකීම වෙනුවට වාර්ගික වුවමනාවන් හා තර්ජන සඳහා මාධ්‍ය යොදා ගැනීමට උත්සාහ කරන දේශපාලන නායකයින් වෙනුවෙන් පාවිච්චි නොවීමට ප්‍රවේශම් විය යුතු බවට සැවොම එකඟ වූහ.

වැඩ සටහන තුළ වඩාත්ම සජීවී සාකච්ඡාවක් පැවතියේ ජනවාර්ගික ස්ථාපිත ආදර්ශ හා ආචාර ධර්ම සම්බන්ධයෙනි. ස්ථිරව සියලු ජනමාධ්‍යවේදීන් සඳහා පවත්නා වෘත්තීය ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබුණි.

## ජනවාර්ගිකත්වය සඳහා පිරික්සුම් ලැයිස්තුව

- පුද්ගලයකුගේ ජනවාර්ගිත්වය, ජාතිය හෝ ආගම සඳහන් කිරීමෙන් වළකින්න.
- පුද්ගලයකුගේ ජනවාර්ගිකත්වය, ජාතිය හෝ ආගම සඳහන් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒවායේ නිවැරදිභාවය සහතික කිරීම සඳහා එම විස්තර අදාළ පුද්ගලයා මගින් සනාථ කරගන්න.
- අනිකුත් ප්‍රවෘත්ති මූලාශ්‍ර අනවශ්‍ය ලෙස ජනවාර්ගිකත්වය හේතුවක් ලෙස සලකන විට, සත්‍ය හේතූන් ගැන පාඨකයින් දැනුවත් කොට ජනවාර්ගිකත්වය සාධකයක් නො වන බව පෙන්වා දෙන්න.
- ඔබගේ පක්ෂපාතීත්වයන් ගැන අවබෝධයක් තිබීම වැදගත් වන අතර, ප්‍රවෘත්ති වාර්තා තෝරා ගැනීමේ දී හා සකස් කිරීමේ දී ඒ ගැන සිත් හි තබා ගන්න.
- වරදට පොළඹවන විස්තර සැපයීමෙන් මඟහැරීම සඳහා ඡායාරූප යොදා ගැනීම ප්‍රයෝජනවත් මඟකි. තොරතුරු සපයන්නන් ඔවුන්ව හඳුන්වනවා දැකීමට කැමති කෙසේ දැ යි ඔවුන්ගෙන් විමසන්න. උදා: ඔවුන්ගේ ජාතිය, ආගම හෝ ජනවාර්ගිකත්වය පිළිබඳව.

# සියලු පැති ආවරණය කිරීම

ජනමාධ්‍යවේදීන්ට ආතතිය සැහැල්ලු කිරීමට දායක විය හැකි එක් මගක් නම් ඔවුන්ගේ ප්‍රජාවන්ට වැදගත් වන කතා පැවසීමයි. සිද්ධීන්වලට හා නිවේදනවලට සරළ ව ප්‍රතික්‍රියා දක්වනු වෙනුවට ජනමාධ්‍යවේදීන් විසින් තමන්ගේ ප්‍රවෘත්ති කාමර වලින් ඉවත්ව ප්‍රවෘත්ති සොයා ගොස්, ගවේෂණ මගින් කරුණු අනාවරණය කොටගෙන ඒ ඒ ප්‍රජාවන්ගේ ඕනෑකම්, ඒවා ප්‍රචණ්ඩත්වයට ළඟා වීමට පෙර වාර්තා කළ යුතු ය.

කථාවක් කීමේදී සුවිශේෂි හා රසවත් ශෛලියක් අනුගමනය කරන්නේ නම් වැඩි දෙනෙක් එම කරුණ කෙරෙහි උනන්දු වන අතර ඵලදායී ලෙස දැනුවත් ව එම විවාද වලට සම්බන්ධ වනු ඇත. කථාවක් රසවත් ලෙස ඉදිරිපත් කිරීම ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයමය වගකීමකි. මේ සඳහා ඇතැම්විට අවතැන් වූවකු හෝ නිවසක් නොමැති කෙනෙකු සමග දිනක් ගතකිරීමට සිදුවනු ඇත. එමගින් යම් සිද්ධියක් හෝ ප්‍රශ්නයක් ඔවුන්ට බලපාන්නේ කෙසේද යන්න සොයාගත හැකිවන අතර, සියල්ලටමත් වඩා බොහෝවිට අසන්නට නො ලැබෙන හඬක් ඒත්තු ගැන්වීමට හැකි වේ. මෙ වැනි වාර්තාකරණ මගින් ඔවුන්ගේ සමාජයේ විවිධ ප්‍රජාවන් සම්බන්ධව ඇති ස්ථාපිත ආදර්ශයන් පරීක්ෂා කිරීමට ද අවස්ථාවක් ලැබෙයි.

ඕනෑම තත්ත්වයකදී, විශේෂයෙන් ම ගැටුම්කාරී අවස්ථාවලදී, වෘත්තාන්ත විශාල ප්‍රමාණයක් ලබාගත හැක. තත්ත්වය ළමුන්ට, ස්ත්‍රීන්ට හා පවුලට බලපාන ආකාරය පිළිබඳ තමන්ගේම ගවේශණයක් කිරීම මගින් ප්‍රචණ්ඩ සිද්ධීන් හෝ ආණ්ඩුවේ ප්‍රකාශන වාර්තා කිරීමේ ප්‍රවෘත්තිමය වටිනාකම ප්‍රශ්න කිරීමෙන් සාම න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට ජනමාධ්‍යවේදීන්ට හැකි ය.

සුනාමියෙන් පසු කඳවුරුවල හා ප්‍රජාවන් තුළ ඉන් විපතට පත් මිනිසුන් නැවත තම ජීවිතය ගොඩනගා ගැනීමට දරන උත්සාහයන් පිළිබඳ අප්‍රමාණ වෘත්තාන්ත තිබේ. එහෙත්, මාධ්‍යයන්හි සුනාමි ආවරණය විමසා බැලූ සමීක්ෂණයෙන් හෙළි වූයේ වෘත්තාන්ත වලින් වැඩි කොටසක් ආණ්ඩුවේ මැදිහත්වීම් සම්බන්ධයෙන් බව ය.

සත්‍ය වාර්තාකරණයෙන් සාමාන්‍ය මහජනයා ජීවත්වන්නේ කෙසේ ද? සහ ඔවුන්ගේ ජීවිතවල ස්වභාවය සහ මානව හිමිකම් තත්වය අවධාරණය කිරීම මගින් මහජනයාට ඔවුන් අන්‍යෝන්‍ය වශයෙන් වටහා ගැනීමට මාධ්‍යයට උදව් විය හැක.

එහෙත්, ජනමාධ්‍යවේදීන්, ඔවුන්ගේ ස්වාධීනත්වය හා මුරපල්ලාගේ කාර්යභාරය අනතුරකට පත් කරමින්, දේශපාලන අරමුණුවලට හා ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට ගැට ගැනීමේ උත්සාහයක් වන ඊනියා'සංවර්ධන ජනමාධ්‍යවේදයෙන්' ආරක්ෂා වීමට වග බලාගත යුතු ය. සුනාමියෙන් පසු, සහන සැලසීම සහ ප්‍රතිනිර්මාණ කටයුතු පිළිබඳ විවේචනය නිහඬ කරවීමට සමහරුන් උත්සාහ දරා ඇති අතර, නිශේධනාත්මක වාර්තාකරණය රජයේ මාධ්‍ය මඟින් දේශද්‍රෝහී ලෙස හංවඩු ගසන ලද අවස්ථා ද විය. (ජ. ජා. ස. 2005)

## මාධ්‍ය නිරීක්ෂණය


ශ්‍රියන්ත වල්පොළ

### 'නිල' සුනාමි පුවත්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2004 සුනාමියෙන් පසු ඉදිරිපත් කරන ලද වාර්තාවක් මගින් 2005 ජනවාරි 1 සහ 7 වෙනිදා අතර කාලයෙහි රජයේ පාලනය යටතේ පවතින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් විකාශනය කරන ලද ප්‍රවෘත්ති මෙම ව්‍යසනයේ සියලු පැතිකඩ ආවරණය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කරන ලදී.

මෙම වාර්තාව සැකසීමට පෙර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සුනාමියෙන් සිදු වූ මහා ව්‍යසනය සම්බන්ධයෙන් ආණ්ඩුව හා විරුද්ධ පක්ෂ එකමුතු ව කටයුතු කළ යුතු බවට පොදු සම්මුතියක් ඇති කොට තිබුණි.

පශ්චාත් සුනාමි ආවරණයට අදාළ ප්‍රවෘත්ති ප්‍රභේද 13 ක් මෙම වාර්තාව නිරීක්ෂණය කොට තිබුණි. මෙම ප්‍රභේදවලට මේවා අයත් විය: ජාතික ප්‍රතිනිර්මාණය, ආණ්ඩුවේ මැදිහත්වීම්, විදේශ ආධාර, සුනාමියට ගොදුරු වූවන්, නැවත ගොඩනැගීමේ සාමූහික සහභාගිත්වය, සහනාධාර බෙදා හැරීම සහ සුනාමියට ගොදුරු වූ දරුවන්.

නිරීක්ෂණය කරන ලද ප්‍රභේද 13 න් වඩාත් ම වාර ගණනක් විකාශය වූයේ ආණ්ඩුවේ මැදිහත්වීම් ය. ඒවා මෙම දින හතේ කාල පරිච්ඡේදය තුළ වාර 42 ක් විකාශය විය. ඊට ඉතා ආසන්න ව ජාතික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගැන වාර 41 ක් ද විදේශ ආධාර පරිත්‍යාග ගැන වාර්තා 32 ක් ද විය.

මෙම දින 7 පුරා ම සුනාමියට ගොදුරුවූවන් ගැන පුවත් ආවරණය 9 වතාවකට සීමා විය. සහනාධාර බෙදාහැරීමේ වැඩ පිළිවෙළ ගැන 8 වතාවක් ද සුනාමියෙන් විපතට පත් දරුවන් පිළිබඳ ව 6 වතාවක් පමණක් ද වාර්තා විය.

තවත් වැදගත් කරුණක් නම් වාර්තාකිරීමට ගතවූ කාලය සළකා බැලීමේදී විකාශය කෙරුණු වාර ගණන හා වෙන් කළ කාලය අතර මනා සහසම්බන්ධතාවයක් තිබීම ය. සොයාගත් කරුණු අනුව ජාතික ප්‍රතිනිර්මාණය ආවරණය සඳහා මෙම සතියක කාලය තුළ විනාඩි 46 ගතකර තිබූ අතර, සුනාමියෙන් විපතට පත්වූවන් සඳහා වෙන් වූ කාලය වූයේ විනාඩි 7 ක් පමණි. (වාර්තාවේ නිගමනය වූයේ පශ්චාත් සුනාමි ප්‍රවෘත්ති ආවරණයේ දී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආණ්ඩුවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ ගත් අතර, සුනාමියෙන් විපතට පත්වූවන්ට ඔවුන්ගේ අවශ්‍යතා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් ඉඩප්‍රස්තා ලබා නො දුන් බවයි. තවදුරටත් දිවයිනේ උතුරු ප්‍රදේශයේ ආවරණය සංසන්දනාත්මක ව සලකා බලන කළ පහළ මට්ටමක පැවති බව ය.

වාර්තාව මගින් පෙන්නුම් කෙරෙන්නේ සුනාමියෙන් විපතට පත් ජනතාවට ඔවුන්ගේ එදිනෙදා ජීවිතවලට සුනාමියෙන් සිදුවූ බලපෑම ඵලදායී ලෙස පිරික්සීමට ප්‍රවෘත්ති ආවරණය අසමත් ව ඇති බවයි.

'මානුෂික අංශය' කෙරෙහි අවධානය දැක්වීම මගින් ප්‍රශ්නය සන්දර්භගත කිරීමෙන් සහන වැඩ පිළිවෙළ සඳහා මහජනතාවගේ සහයෝගය ලබා ගැනීමට ඔවුන් කෙරෙහි පෙළඹවීමක් ඇති කෙරේ.

# අගතිගාමීත්වය සමඟ කටයුතු කිරීම

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන් අතර වඩාත් ම ප්‍රකට සංවාද වූයේ ස්වාධීන ජනමාධ්‍යවේදයක අවශ්‍යතාවය සහ ඔවුන්ගේ 'ජාති වාදී අරගලයට' හෝ ඔවුන් අයත් වන ජනවාර්ගික කොටසට ඇති පක්ෂපාතීත්වය යි. බොහෝ ජනමාධ්‍යවේදීහු ඔවුන් වාර්තා කරන ජන කොට්ඨාශයන්ට හා කණ්ඩායම්වලට ඇති ඇල්ම ගැන සහ එහි ඇති වෘත්තීමය හා ආචාර ධර්මීය අභියෝගයන් පිළිබඳව ගැන විවෘත ව හා අවංක ව අදහස් ප්‍රකාශ කළ හ. යාපනයේ එක් පුවත්පත් කලාවේදියෙකු ප්‍රකාශ කළ පරිදි, "අපි යන්ත්‍ර නොවෙයි මිනිස්සු."

පක්ෂ භජනය මුළුමනින් ම ඉවත්කිරීම බෙහෙවින් ම දුෂ්කර කාර්යයක් වන අතර සමහර විට එසේ වීම එතරම් නරක දෙයකුත් නොවේ. "දේශපාලන හා සමාජ දර්ශන පථය තේරුම් ගැනීමට නම්, වැදගත් කරුණු මොනවා ද හා එම කරුණු වැදගත් වන්නේ කුමක් නිසා ද යන වැටහීමක් තිබිය යුතු ය. පක්ෂපාතීත්වය අවම කර ගැනීමට නුපුළුවන් ය යන්න මින් කිසිසේත් ම අදහස් නොවේ. එය තමන් තුළ අවම කර ගැනීම පුවත්පත් කලාවේදීන්ගේ පැහැර හැරිය නො හැකි වගකීමකි" (ලෙවි 2004)

පැහැදිලිව ම, තම ප්‍රජාවගේ සමාජයීය, දේශපාලන සංකල්ප, ආර්ථික අවස්ථා සහ ජනවාර්ගික පක්ෂපාතීත්වයට පිටස්තර ව තමන්ට පැවැත්මක් නැතැ යි පිළිගන්නා පුවත්පත් කලාවේදියාට, පක්ෂපාතීත්වය සඳහා ඇති ඉඩකඩ සම්බන්ධයෙන් අවධානය යොමුකොට ඔවුන්ගේ කතාවන්හි විවිධ මත ඉදිරිපත් වීම සහ ඒවා තේරුම් ගැනීම වළක්වාලන්නේ නැති බවට සහතික විය හැක.

## සංස්කාරක ස්වාධීනත්වය

ශ්‍රී ලංකා මාධ්‍යයේ වැඩි කොටසක්, ගුවන්විදුලි විකාශයන් හා විශාලත ම පුවත්පත් සමූහය ද පවතින්නේ ආණ්ඩුවේ පාලනය යටතේ ය. සීමිත සංස්කාරක ස්වාධීනත්වයක් එහි ඇති අතර ආණ්ඩුවේ බලපෑම සම්බන්ධව සැහෙන සාක්ෂි ඇත. (පාර්ක්, 2003) පුද්ගලික අයිතිය යටතේ ඇති මාධ්‍යවල ප්‍රවෘත්ති අන්තර්ගතය ද ඒවායේ අයිතිකාරයින්ගේ වාණිජමය හා දේශපාලනික උවමනා මත පාලනය වේ.




*මාධ්‍ය ආයතන ඒවායේ වැඩ කරන පුවත්පත් කලාවේදීන් ද ඇතුළු ව 'බලතල පංගු කිරීම' නම් වූ සිද්ධාන්තයේ නියම තේරුම වටහා නොගතහොත්, මාධ්‍යය ඉතා පහසුවෙන් ප්‍රචාරණය සඳහා යොදා ගැනෙනු ඇත.*

දේශපාලන හා වාණිජ බලපෑම්වලින් මිදුණු මාධ්‍යයට ප්‍රජාතන්ත්‍රවාදයේ පරිණාමයට සහ එහි ශක්තිමත් ක්‍රියාකාරීත්වයට වැදගත් දායකත්වයක් සැපයිය හැක. මාධ්‍ය ආයතන ඒවායේ වැඩ කරන පුවත්පත් කලාවේදීන් ද ඇතුළු ව 'බලතල පංගු කිරීම' නම් වූ සිද්ධාන්තයේ නියම තේරුම වටහා නො ගතහොත්, මාධ්‍යය ඉතා පහසුවෙන් ප්‍රචාරණය සඳහා යොදා ගැනෙනු ඇත.

ස්වාධීන මාධ්‍යයක් සහතික නොවන විට, අපගේ මානව අයිතිවාසිකම් ශක්තිමත් කරන 'දැන ගැනීම' සඳහා වන මහජන අයිතිය තර්ජනයට ලක් වේ.

මෙය මාධ්‍යවේදීන් මුහුණ දෙන අභියෝගයකි. ඔවුන්ගේ වෘත්තීයමය ආචාර ධර්මයන්ට එකඟ ව ස්වාධීන ව වැඩ කටයුතු කිරීමේ අයිතියට ගරු කරන ලෙස ඉල්ලා සිටීම සඳහා සිවිල් සමාජයේ අනිකුත් හවුල්කරුවන් සමග අත්වැල් බැඳගැනීමේ අවශ්‍යතාව අත්දැකීම් මගින් ජනමාධ්‍යවේදීන් ප්‍රත්‍යක්ෂ කොට ඇත.

## සිද්ධි අධ්‍යයනය : අගතිය පිබිදවීම

මෙහි පහත දැක්වෙන කරුණු අධ්‍යයනය මගින් ජනමාධ්‍ය ආචාර ධර්ම නො තකා සිටිය විට සිදු විය හැකි දේ සහ ජනමාධ්‍යවේදීන්ගේ වාර්තාකරණය මගින් ඇතිවන බලපෑම පෙන්වා දෙයි. මෙහිදී ආගමික හරවාගැනීම් ප්‍රධාන ගැටුම්කාරී සාධකයක් ව පවතින අවස්ථාවක, ජනවාර්ගිකත්වය බෙදා වෙන්කිරීමේ ආයුධයක් ලෙස භාවිතා කරමින් පාඨකයින්ට දුර්මත ඉදිරිපත් කොට ඔවුන්ගේ ආකල්ප එක් පැත්තකට නම්මා ගැනීමට යොදා ගෙන තිබේ.

පළපුරුදු ලාංකීය පුවත්පත් කලාවේදියෙකු දෛනික සිංහල පුවත්පතක 'මූලධර්ම වාදියකුගේ ග්‍රහණයෙන් අත්මිදුණු බෞද්ධයෙකුගේ පාපොච්චාරණය' යන මාතෘකාව යටතේ ලිපියක් පළකරන ලදී. මෙම ලිපිය ටික කාලයක් මූලධර්මවාදී ක්‍රිස්තියානි නිකායක සාමාජිකයෙකු ව සිටි බෞද්ධයෙකු පිළිබඳව ය. එමගින් එම ආගමික කණ්ඩායම තමන්ගේ ආගමික විශ්වාසයන් බලහත්කාරී ලෙස ඉගැන්වූ ආකාරය හෙළිදරව් කළ අතර, එම තොරතුරු බෞද්ධ ජනතාව ප්‍රකෝපකාරී වීමට හේතුභූත විය හැකි ඒවා ය.

මෙම ලිපිය ප්‍රකාශ කරන ලද්දේ ක්‍රිස්තියානි නිකායයන් - ලිපියේ අඩංගු නිකාය මෙන්ම ප්‍රධාන ක්‍රිස්තියානි සභාවන් ද ප්‍රහාරයන්ට ලක්වෙමින් තිබූ අවදියක ය. ජනාධිපතිනිය සහ අග්‍රාමාත්‍යවරයා මෙම ප්‍රහාර හෙළාදකිමින් ඒවා මූලධර්මවාදීන්ගේ ක්‍රියා ලෙස හඳුන්වමින් ඊට වගකිවයුත්තන් නීතිය හමුවට පමුණුවන ලෙස ඉල්ලා සිටිය හ.

කෙසේ වෙතත්, ලිපිය සමබරතාවයක් දැක්වීමට අපොහොසත් විය.

මූලධර්මවාදී නිකාය නායකයින් කිප දෙනෙකු ම ලිපියෙහි විදහා දැක්වුව ද, දෙමළ නායකයින්ගේ පමණක් ජනවාර්ගිකභාවය සඳහන් කොට තිබුණේ පාඨකයින්ගේ හැඟීම් ප්‍රකෝපකාරී වන පරිද්දෙනි. උදා: වශයෙන්, "මීසම භාර දෙමළ පූජකවරයා කෝපයෙන් කථා කරමින් .... අපේ ආගමට (ක්‍රිස්තියානි) බෞද්ධයන් 65,000 ක් බඳවා ගැනීමට බලාපොරොත්තු වෙනවා"

පූජකවරයාගේ ජනවාර්ගිකභාවය සඳහන් කිරීම අවශ්‍ය ව තිබුණේ ද? එයින් අදහස් වූයේ ඔහු ආගමික දේශනා කරන්නේ ඔහු දෙමළ නිසාද? වෙනත් නායකයින්ගේ ජනවාර්ගිකභාවය සඳහන් නො කළේ මන්ද?

යාඥා මන්දිර පිහිටා ඇති තැන් ද ලිපිය මගින් හෙළිකර තිබුණි. එමගින් ඒවාට එරෙහි ව ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය විය. ලිපියේ ප්‍රතිඵලයක් ලෙස, එයට කිසියම් ප්‍රහාරයක් එල්ල වූවානම්, ජනමාධ්‍යවේදියා වරදෙහි අනියම් හවුල්කරුවකු වියහැකි ව තිබුණි.

අවුරුදු ගණනාවක් මුළුල්ලේ අන්‍යෝන්‍ය බිය හා අවිශ්වාසය මත පදනම් වූ ශ්‍රී ලංකාව වැනි සමාජයක, ඕනෑම ප්‍රකාශයක් අතිශයෝක්තියෙන් හුවා දක්වා විකෘති කොට දැක්වීම සාමාන්‍ය දෙයකි. අවාසනාවකට මෙන්, මාධ්‍යය එම තත්ත්වය සමනය කිරීමේ හවුල්කරුවකු වනු වෙනුවට, විශේෂයෙන් ම සිංහල හා දෙමළ මාධ්‍ය එහි කොටස්කරුවකු වී තිබේ.

පහත දැක්වෙන මගපෙන්වීම් අනුගමනය කරන ලද්දේ නම් මෙම ලිපිය වැඩිදියුණු කළ හැකි ව තිබුණි.

මෙහි අඩංගු කරුණු සත්‍ය ද, අවංක ද? නිවැරදි ද?

ලිපියේ කර්තෘ ඇත්ත නැත්ත විමසා බලා මූලාශ්‍ර නිවැරදි දැ යි පරීක්ෂා කළේ ද? ලිපියේ සඳහන් වී ඇති සියලු දෙනා ම සාධාරණ ව හා සමාන ව සලකනු ලැබුවේ ද?

ජනවාර්ගික හා ආගමික පූර්ව විනිශ්චයන් මෙම ලිපිය මගින් වර්ධනය වේ ද? මෙම ලිපිය මගින් පාඨකයා නොමඟ යා ද?

# කතාව සම්පූර්ණ වන්නේ අදහස් ගණනාවකිනි.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය: ගැටුම් අවස්ථාවකදී

ගැටුම හා සාමය ස්ත්‍රී, පුරුෂ සමාජභාවය නොසලකා සැමට බලපානු ලබයි.

අප ස්ත්‍රීන් විස්තර කරන ආකාරයත් ඔවුන්ගේ කතා කියාපාන ආකාරයත්, සමාජය ස්ත්‍රිය දෙස බලන ආකාරය හා ඔවුන්ට සලකන ආකාරය කෙරෙහි මහත් බලපෑමක් ඇති කරයි. ස්ත්‍රීන් බොහෝ විට නිරූපණය වන්නේ යුද්ධයේ ගොදුරු ලෙස ය. එය සත්‍යයකි. ඔව්හු අවතැන් වෙති. වැන්දඹු වෙති. දිළින්දන් වෙති. එ මෙන් ම කායික ව හා ලිංගික ව අපචාරයට ලක්වෙති. එහෙත් පවුල් මට්ටමේ, ප්‍රජා මට්ටමේ සහ ජාතික මට්ටමේ වෙනස් කිරීම් අරභයා සටන් වැදී සිටින ක්‍රියාකාරී කොටසක් වුව ද, ඒ කෙරෙහි අවධානය දක්වා ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි.

යුද්ධය හේතුවෙන් ස්ත්‍රීන් පීඩාවට පත්වන්නේ පිරිමින්ට වෙනස් ආකාරයෙනි. ස්ත්‍රීන් කෙරෙහි අවධානය දක්වන වාර්තා අතර, වැන්දඹුවන් ලෙසින් ඔවුන්ගේ තත්වය පරීක්ෂා කිරීම, ස්ත්‍රී ගෘහ මූලික පවුල්, සාමය සඳහා ස්ත්‍රී මූලිකත්වයෙන් ආරම්භ වන ව්‍යාපාර, ස්ත්‍රීන් ආයුධ අතට ගන්නේ ඇයි සහ ඔවුන් මුහුණදෙන ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්න වේ.

ගැටුම්කාරී කලාප 18 ක ආයුධ සන්නද්ධ කණ්ඩායම්වලින් ජීනිවා හි රැස්වූ ස්ත්‍රී සටන්කාමීන් තිස් දෙදෙනෙකුගේ රැස්වීමකදී, ස්ත්‍රීන් ප්‍රචණ්ඩකාරීත්වයට අවතීර්ණවන්නේ පිරිමින්ට වඩා වෙනස් හේතු මත බවත් ආයුධ බිම තැබීමට ඔවුන් පෙළඹවිය හැක්කේත් වෙනස් කාරණා මත බවත් තීරණය කළ හ.

"ජිනීවා රැස්වීමේ නිරහංකාර නිගමන සලකා බැලීම වටී. බොහෝ ස්ත්‍රීන් කියා සිටියේ ඔවුන් සටන් වදින්නේ අන්තිම විකල්පය ලෙස බවයි. බලහත්කාර දූෂණයට ලක්වූ ස්ත්‍රීන් හෝ සැමියන් හෝ පවුලේ වෙනත් සාමාජිකයින් ඝාතනය කිරීම් ඇස් පනාපිට දුටු ස්ත්‍රීන් විශේෂයෙන් ම පෙළඹ වී ඇත." (විලියම්ස් 2005)

මෙ වැනි අභිප්‍රේරණාත්මක කරුණු සහ ඒවා සාම සාකච්ඡා කෙරෙහි කෙසේ බලපානු ඇත් ද යන කරුණු ජනමාධ්‍යවේදයේ ගවේශණයට ලක්විය යුතු ප්‍රවෘත්ති වැදගත්කමකින් යුත් පරාසයන් වේ.

සුනාමියෙන් විපතට පත්වූවන් ගැන වාර්තාකරණයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව නො තැකීමෙන් වාර්තාකරණයට හානි වූවා මෙන් ම ජනවාර්ගික ගැටුමින් විපතට පත් අය පිළිබඳ වාර්තාකරණය ද එයට සමාන වූ බව ගැටුම් සංවේදී ජනමාධ්‍ය සම්බන්ධ වැඩමුළුවකට සහභාගී වෙමින් කොළඹ විශ්ව විද්‍යාලයේ නිලූෆර් ද මෙල් මැතකදී කියා සිටියා ය.

ස්ත්‍රීන්ට පමණක් සීමා වූ ප්‍රශ්න කෙරෙහි මාධ්‍ය අවධානය යොමු කිරීමට අසමත් විය. ලිංගික අතවර කිරීම් හා ස්ත්‍රීන් බලහත්කාරයෙන් දූෂණය කිරීම් වාර්තා කිරීම් හැරුණු විට, කඳවුරුවල වෙසෙන කාන්තාවන්ට වඩා සුදුසු ආරක්ෂක විධිවිධාන සැලසීමත් එමගින් සිදු විය. කඳවුරු කොමිටි වල කාන්තා සහභාගිත්වය, ඔවුන්ගේ පුද්ගලිකත්වය, ආරක්ෂාව සහ අවශ්‍යතා (ස්නානය සඳහා වෙනම පහසුකම්, යට ඇඳුම් සහ සනීපාරක්ෂක තුවා) ගැන පුළුල් වාර්තාකරණයක් සිදු නො වීය. මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් දක්වන නිහඬතාවයෙන් පෙනී යන්නේ සහන සැලසීමේ ක්‍රියාවලියෙහි නිරත වන්නන් බොහෝ දෙනෙකුගේ ස්ත්‍රී, පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුම එතරම් ඉහළ තත්ත්වක නොතිබූ බවයි.

"එය වාර්තා කළ ආකාරය අනුව, කාන්තාවන් පීඩාවට පත් වූ ගොදුරු බවටත් පිරිමින් නියෝජිතයින් බවටත් පත් කළ තත්ත්වය ඉස්මතු කොට දක්වා තිබුණි. මෙහි ප්‍රතිඵලය වූයේ ස්ථාපිත ආදර්ශ ලෙස කාන්තාවන් අසරණ වූවන් ලෙස වාර්තා වීමත්, පිරිමින් ගැලවුම් කරුවන් ලෙස නිරූපණය කිරීමත් ය."(ද මෙල් 2005)

සම්පූර්ණ වාර්තාවක් සඳහා පුළුල් පරාසයක කාන්තාවන්ගේ යථා ස්වභාවයන් ඊට ඇතුළත් කිරීම ජනමාධ්‍යවේදීන්ට අවශ්‍ය වනු ඇත. විශේෂයෙන් ම බොහෝ විට හඬ නැගීම වළක්වා ඇති වාර්ගික සුළුතරයන්ට අයත් කාන්තාවන්ගේ යථා ස්වභාවය වැදගත් වේ.

## ප්‍රවෘත්ති කාමරයේ විවිධත්වය

විවිධත්ව වාර්තාකරණය සඳහා පුළුල් ජනවාර්ගික පරාසයක




ගැටුම් තත්ත්වයක දී ළමුන් ආරක්ෂා කිරීම සඳහා ජනමාධ්‍යය වැදගත් භූමිකාවක් ඉටු කරයි.

ජනමාධ්‍යවේදීන් බඳවා ගැනීම සහ වාර්ගික සුළුතර භාෂා භාවිතය වැදගත් ලිට්මස් පරීක්ෂණ වුවත්, ඒවා මගින් එය සහතික නොවේ.

එක් ප්‍රධාන කරුණක් නම් සමාජයේ පවතින විවිධත්වය ප්‍රතිබිම්බනය වන ආකාරයට පුවත් ආයතනයන්හි කාර්ය මණ්ඩලය පවත්වා ගැනීමයි. තමන්ට වඩා බෙහෙවින් වෙනස් දිවිපෙවෙතක් ගතකරන ජනයාගේ යථා දර්ශන තේරුම් ගැනීමට විශිෂ්ට ගණයේ පුවත්පත් කලාවේදියකුට වුවත් ඇති හැකියාවට සීමාවක් ඇත.

කාර්ය මණ්ඩලය තුළ විවිධත්වයක් මගින් වඩා විවෘත හා වඩා සුගම මාධ්‍යයක් ඇති වේ. අඩු තරමින් පුවත්පත් කලාවේදීන් කිහිප දෙනෙකු සමග හෝ අනන්‍ය වීමට පාඨකයින්ට හැකිවන අතර ඔවුන් ඉදිරිපත් කරන සන්දර්භය කෙරෙහි විශ්වාසය තැබීමට ද ඉඩ ඇත. පුවත්පත, ගුවන් විදුලිය හෝ රූපවාහිනී විකාශනය එක්තරා ජනවාර්ගික කොටසක් වෙනුවෙන් පෙනී සිටී ය යන අදහස ඇති වීම එවිට දුරස්ථ වනු ඇත. ජ්‍යෙෂ්ඨ නිලතල වල මෙන් ම කනිෂ්ඨ නිල වල ද සත්‍ය වශයෙන් මෙකී විවිධත්වය පිළිබිඹු වේ නම්, එවිට ප්‍රවෘත්ති වාර්තාකරණයේ සැබෑ වෙනසක් සිදුවනු ඇත.

මාධ්‍ය කළමනාකරණයට හා ජනමාධ්‍යවේදීන්ට ඔවුන්ගේ රැකියා, පුහුණු කිරීම් හා වාර්තාකරණ ශිල්පීය ක්‍රම පරීක්ෂා කිරීමට හා දියුණුවක් ලබාගත හැකි අන්දම සහ ප්‍රතිඵල මැන බැලීමටත් වගකීමක් තිබේ.

විවිධත්වය නොඉවසීම සමග කටයුතු කිරීමේදී හා මාධ්‍යයේ කර්තෘ මණ්ඩල කාර්ය ඵලයන් නිරීක්ෂණය කිරීමට ඇති කැමැත්ත හා බැඳෙන ආචාර ධර්මීය උභතෝකෝටිකයන් පිළිබඳව පුහුණු වැඩ සටහන්වලිදී සාකච්ඡා කිරීම ආදිය යි. මෙය, ප්‍රවෘත්ති එකතු කරන්නන්ගේ දැනුම පුළුල් කිරීම, වැරදි අවම කිරීම, නොදැනුවත් බව හා නොසලකා හැරීම තුළින් මතුවන පක්ෂපාත භාවයන් අවම කිරීම ආදිය පිළිබඳව දැනුවත් භාවයක් ඇති වීමට හේතු වේ.

ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍ය කළමනාකරණයට ප්‍රයෝජනවත් විය හැකි මාධ්‍යයේ විවිධත්වයේ අවශ්‍යතාවය සම්බන්ධව ඇති තර්ක ගණනාවකි:

- කර්තෘ මණ්ඩලයේ ජනවාර්ගික විවිධත්වය, වඩා පුළුල් පාඨක, ශ්‍රාවක හා නරඹන පරාසයක්
ආකර්ශනය කර ගැනීමට හේතු වේ. මාධ්‍ය ආවරණය ඉලක්ක කණ්ඩායමේ ජීවිත හා සමග සමීප
වන විට අලෙවිය හා නරඹන්නන් සංඛ්‍යාව වැඩි දියුණු වනු ඇත.
- ජනමාධ්‍යවේදය සාධාරණත්වය හා අපක්ෂපාතීත්වය සඳහා මහන්සි වන අතර, ප්‍රවෘත්ති කාමරය
තුළ විවිධ ජනවාර්ගික නියෝජනය මගින් සුළුජන කොටස්වලින් තොරතුරු ලබාගැනීමේ විවිධ

මූලාශ්‍රවලට ප්‍රවේශ වීමේ හැකියාව දියුණු කළ හැක.

- කාර්ය මණ්ඩලයේ වඩා යහපත් ජනවාර්ගික නියෝජනයක් සහ වඩාත් සමබර ප්‍රවෘත්ති ආවරණයක් මගින් විවිධ පසුබිම් ඇති පාඨක/ශ්‍රාවක පිරිස් කෙරෙහි ආකර්ෂණය වීමට හැකි වේ. විවිධ සංස්කෘතික පසුබිම්වලින් යුත් ජනයා ඉලක්ක කෙරෙන ප්‍රචාරක දැන්වීම් පළකරන්නන්, සියලු ම ජන කොට්ඨාශ වඩා ආකර්ෂණය වන මාධ්‍යයට කැමැත්තක් දක්වනු ලබයි.
- වෙනස් කණ්ඩායම් වල ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍යවලට එකට වැඩ කිරීමට උනන්දු කරවිය යුතු අතර, තොරතුරු හුවමාරු කර ගනිමින් එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට සැලැස්විය යුතු ය. මාධ්‍යය සහ පළල් ජනතාව අතර සංවාදය තරම්ම වැදගත් කරුණක් නම් මාධ්‍යය තුළ හා මාධ්‍යයන් අතර සංවාදයක් පැවතීම ය.

## ප්‍රවෘත්ති භාෂාව

ප්‍රවෘත්ති රැස් කිරීමේ දී විශේෂයෙන් ම වෙනත් සමාජ කණ්ඩායම් කෙරෙහි බලපාන ප්‍රශ්න හා සිද්ධි සම්බන්ධයෙන් වන විට, භාෂාව ප්‍රධාන බාධකයක් බව සමීක්ෂණය පෙන්වා දෙයි. බහු භාෂා දක්ෂතා ඇති පුවත්පත් කලාවේදීන් දිරිමත් කිරීම මගින් සහ විවිධ භාෂා නිපුණතා ඇති වාර්තාකරුවන් එක් කථාවක් කෙරෙහි කණ්ඩායම් ගත කිරීම තුළින් විශ්වාසය ගොඩනැගිය  හැකි අතර, වෙනත් භාෂා කථාකරන ජන සමූහයක් වෙත ප්‍රවිෂ්ඨ වීමට ඉඩ කඩ සැලසේ.

ජනමාධ්‍යවේදීන්ට උපරිම පාලනයක් ඇති ක්ෂේත්‍රය නම් සිද්ධීන්, ප්‍රශ්න විස්තර කිරීමට හා වාර්තාකරණය සඳහා ඔවුන් යොදා ගන්නා වචන හා වාක්‍යාංශයි.

පැහැදිලි ලෙස ම පුවත්පත් කලාවේදීන් කිසිම විටෙක ජනවර්ගයකට කැළලක් සිදු නො කළ යුතු අතර, වෙනත් ජනවාර්ගික හෝ ආගමික කොටසක් සම්බන්ධ ව අවිඥානික ව කිසියම් උප කල්පනයක් කළේ නම් එය පිළිගැනීමට ඉදිරිපත් විය යුතු ය.

උදාහරණයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ සටන් විරාම ගිවිසුමකින් පසුව සමාජ - දේශපාලන සන්දර්භයේ අංශයන් විස්තර කිරීමට මාධ්‍ය භාෂාව සමග පොරබදමින් සිටී. "ජාතිවාදී" වැනි වචන දෙමළ පුවත්පත් විසින් අවිචාරවත් ලෙස සිංහල ප්‍රජාව හැඳින්වීම සඳහා යොදා ගනු ලැබේ. බොහෝ විට සිංහල හා දෙමළ භාෂා පුවත්පත්හි පළවන වාර්තා අනුව ජාතිවාදී ආතතීන් ජනවාර්ගික වෛරයක් බවට පත්වන අතර, සුළු මතබේද මහා පරිමාණ ජනවාර්ගික ගැටුම් බවට පත් කරයි. මහ ජාතිය හා සුළු ජාතිය පිළිබඳ නිර්වචන කිසියම් තර්කයක් ගොඩනැගීම පිණිස බොහෝ විට විකෘති කරනු ලැබේ. සුළු ජාතිය යන්න සිංහල පුවත්පත් හි බොහෝ විට 'අනිකුත්' ජන කොට්ඨාශවල නීත්‍යානුකූලභාවයට හානිවන ලෙස අවමානාත්මක ව භාවිතා කෙරේ. ඊට ප්‍රතිවිරුද්ධ ලෙස දෙමළ මාධ්‍යයෙහි සිංහල ජන කොට්ඨාශය නියෝජනය කිරීම සඳහා භාවිතා කරන 'මහ ජාතිය' යන යෙදුම එම සමාජයෙහි දක්නට ඇති මත විවිධත්වය හෝ දේශපාලන මතවාද හෝ පිළිබිඹු නො කරයි.

ස්ථාපිත ආදර්ශ හා ජන කොට්ඨාශ යක්ෂ වෙස් ගැන්වීම දීර්ඝ කාලයක් තුළ පැවත එන ජනවාර්ගික ගැටුමේ අනිවාර්ය ප්‍රතිඵලයක් විය හැක. ඕනෑම අපරාධයකට සැක කෙරෙන දෙමළ පුද්ගලයෙකු ඉබේ ම ත්‍රස්තවාදියකු වන අතර, සිංහල පුද්ගලයෙකුට සැකයේ වාසිය හිමිවේ. සමාන වචන ලෙස භාවිතා කළ නො හැකි දෙමළ, එල්ටීටීඊ සහ ත්‍රස්තවාදී යන යෙදුම් එකම ප්‍රවෘත්ති වාර්තාවෙහි එකම තේරුම ඇති පද ලෙස භාවිතා කෙරේ.

කටවහර වචන ද මාධ්‍යයට ප්‍රශ්නයක් වේ. මුස්ලිම් හෝ දෙමළ ජන කොට්ඨාශයක සාමාජිකයකු හැඳින්වීමට භාවිතා වනුයේ පිළිවෙළින් තම්බියා හෝ මරක්කලයා සහ දෙමළා වශයෙනි. සම්පූර්ණ අනන්‍යතාවයක් ඇති ජන කොට්ඨාශයක් හැඳින්වීමට ඒකාකාර හා කුරිරු වදන් අසංවේදී ලෙස යොදා ගැනීම (දෙමළ ජන සමූහය සඳහා දෙමළු සහ මුස්ලිම් ජන සමූහය සඳහා මරක්කලයෝ) සහ ඔවුන්ගේ සහයෝගය සහ ඔවුන් පෙළඹවීමට විශේෂ උනන්දුවක් දක්වන අය දුබල කිරීමට දේශපාලන මතවාද අවමානාත්මක ලෙස භාවිතා කිරීම.

ජනමාධ්‍යවේදීන් විසින් ස්වාධීන හා වෘත්තීයමය ප්‍රවේශයන් මගින්, ෆෙඩරල්වාදය, බලය බෙදාහැරීම, ආණ්ඩුවේ නො වන සංවිධාන හා සාම ක්‍රියාකාරීන් සහ විදේශ ආධාර වැනි වාද විෂයයන් වාර්තාකරණය නැවත පරීක්ෂාවට භාජනය කළ යුතු ය. මේවා පිළිබඳව සඳහන් වන්නේ සෘණාත්මකව හා අවමන් සහගතව වේ. මෙම කරුණු ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයට, ස්ථාවරත්වයට හා එක්සත්භාවයට හානිදායක ලෙස නිරූපිත ප්‍රකෝපකාරී වාර්තා මගින් අපගේ ජන සමූහයන්ට ඔවුන්ගේ මතවාද සකස් කර ගැනීමට අවශ්‍ය කෙරෙන විශ්වාසදායක හා නිරවද්‍ය තොරතුරු ලබාදී තිබේ ද?

### යහපත් භාවිතය සඳහා ප්‍රශ්න

1. සියලු ම රැකියා ඇබෑර්තු ප්‍රසිද්ධ කරනවා ද?
2. නො සලකා හැර ඇති කණ්ඩායම් වලින් ඉල්ලුම් පත් ලබාගැනීම පෙළඹවීමට ක්‍රියාකොට තිබේ ද?
3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් දැක්වෙන ලියවිල්ල මත කෙනෙකුට සම්මුඛ පරීක්ෂණයක් සඳහා වාරයක් දීමට පෙර කෙනෙකු සම්බන්ධයෙන් යම් යම් උප කල්පනයන් කෙරෙන්නේ ද?
4. වෙනස් වූ ජනවාර්ගික/සංස්කෘතිය පසුබිම්වලින් සහ භාෂා දැනුම ඇති ජනමාධ්‍යවේදීන්ගෙන් කුමන අංශවල වැඩ කටයුතු සඳහා ප්‍රයෝජනයක් වේ දැ යි ඔබ සලකා බලා තිබේ ද?
5. කිසියම් වෘත්තාන්තයක් කාන්තාවන් කෙරෙහි කෙසේ බලපානු ඇත් දැ යි ඔබ සලකා බැලුවේ ද? ඔවුන්ගේ අදහස් එයට ඇතුළු කළේ ද?

## ළමයින්ගේ හඬට කන්දීම

විශේෂයෙන් ම ගැටුම්කාරී තත්ත්වයන් තුළ, ළමයින් වැඩියෙන් සූරාකෑමට භාජනය වන අතර, ඔවුන් ව ආරක්ෂා කිරීමට වැඩිහිටියන් අවශ්‍ය වේ. බොහෝ දෙනෙකු ළමා සොල්දාදුවන් ලෙස බලහත්කාරයෙන් බඳවා ගැනෙන අතර තවත් කොටසක් රට තුළට හා පිට රටවලට නීති විරෝධී ලෙස ප්‍රවාහනය කොට ලිංගික වහල් භාවය ද ඇතුළත් වන වාණිජ්‍ය ශ්‍රමිකයින් ලෙස විකුණනු ලැබේ.

මාධ්‍ය ක්ෂෙත්‍රයෙහි වැඩ කරන පිරිස් ලෙස, එමගින් ළමුන් විෂයයෙහි වැඩිහිටි චර්යාවන් හැඩ ගැන්වීමේ බලවත් පිරිසක් ලෙස, ගැටුම්කාරී තත්ත්වයන් යටතේ ළමුන්ගේ ආරක්ෂාව සැලසීමට අප විසින් මහත් වූ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනය මගින් ලෝකය වටා සිටින ජනමාධ්‍යවේදීන් ළමුන් පිළිබඳ වාර්තාකරණයේ දී අනුගමනය කළ යුතු මගපෙන්වීම් පිළිබඳ එකඟත්වයකට පැමිණ ඇත. ඔවුන් සූරාකෑමට පාත්‍රවීමට ඉඩ නො තබා, ඔවුන් පහසුවෙන් ගොදුරු බවට පත් කර ගැනීමේ හැකියාව ඇති පින්පියන්ට, නීති විරෝධී වෙළෙඳුන්ට, බඳවා ගන්නන්ට සහ අපයෝජනය කෙරෙන දෙමාපියන්ට, අනාවරණය වීමට ඉඩ නො තබා, ඔවුනගේ අදහස් ඇතුළත් කර ගැනීමේ වැදගත්කම ජනමාධ්‍යවේදීන් විසින් පිළිගනු ලැබ තිබේ.

ඉතාමත් අසීරු ආචාරධර්ම ප්‍රශ්නයක් නම්, ළමුන්ගේ නම් ඇතුළත් කරන්නේ ද යන්න හා ඔවුන්ගේ මුහුණු ඡායාරූප මගින් හෝ චිත්‍රපට තුළින් පෙන්වන්නේ ද යන්නයි. ජනමාධ්‍යවේදය, මහජන සුභසිද්ධිය සඳහා පැහැදිලිව ම අවශ්‍ය ය යි හැඟුන විටකදී හැර, දෘශ්‍ය හෝ වෙනත් ආකාරයකට ළමුන් හඳුනා ගැනීමට ඉඩ නොතැබීමට වග බලා ගත යුතු බව ජ. ජා. ස. මග පෙන්වීම් ප්‍රකාශ කරයි. මාධ්‍යයේ මූලික ම යුතුකම වන්නේ දරුවකුට තවදුරටත් හානි පැමිණවීමෙන් වැළකී සිටීමයි. ළමා සොල්දාදුවන් හෝ ලිංගික අපයෝජනයට ගොදුරු වූ දරුවන් සම්බන්ධයෙන් ප්‍රචාරය කොට එම දරුවන් හඳුනා ගැනීමට සැලැස්වීම මගින් තව තවත් හානි පැමිණෙනවා ඇත.

අපයෝජනය නිසා හෝ කම්පනය නිසා හෝ වේදනා විඳින ළමුන් හා සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ජනමාධ්‍යවේදීන්ට විශේෂ අභියෝගයක් වන අතර එය ඉතා ප්‍රවේශමෙන් කළ යුත්තකි. පැහැදිලි විස්තර ලබා ගැනීමට තැත් කිරීමේදී ළමයා එම සිදුවීම නැවත මවාගැනීමට හෝ එම අත්දැකීම නැවත විඳීමට ඉඩ ඇත. අප සෑම විට ම ඇසිය යුතු ප්‍රශ්නය නම් දරුවා සමග සම්මුඛ සාකච්ඡාව පැවැත්වීම තේරුමක් ඇත් ද යනු හා මෙම වෘත්තාන්තය ගොනු කර ගැනීමට විකල්ප මාර්ගයක් නො තිබේ ද යන්න ය.

## යහපත් භාවිතය සඳහා ප්‍රශ්න

1. කර්තෘ මණ්ඩල රැස්වීමක් පවත්වා මෑත වාර්තා කීපයක් ගැන සාකච්ඡා කරන්න. එසේ කිරීමේ දී ලිංගිකත්වය, වයස සහ ජනවාර්ගිකභාවය යන දෘෂ්ටි කෝණයකින් ඒවා දෙස බලන්න.
2. ප්‍රවෘත්ති වල සහ විශේෂාංග ලිපිවල ජනවාර්ගිකත්වය හසුරුවා ඇත්තේ කෙසේද?
3. ජනවාර්ගිකත්වය 'ප්‍රශ්නයක්' ලෙස නිතර ම පාහේ දක්වනු ලැබේද?
4. අපරාධ පිළිබඳ කථාන්තර, ස්ථාපිත ආදර්ශ මගින් ශක්තිමත් කරන්නේද? (වාර්තාකරුවන් විසින් සතියකට කී වාරයක් පොලිසියට දුරකථන ඇමතුම් ලබා දුන්නේ ද යන්න ජන කොට්ඨාශ හමුවට ගිය අවස්ථා ගණන හා සංසන්දනය කරන්න.)
5. ජන කොට්ඨාශය සමග සම්බන්ධතා ඇති කර ගැනීමට අධිෂ්ඨානශීලී උත්සාහයක් දරන්න.
6. වාර්තාකරුවන් ජන කොට්ඨාශ හමුවීමට යෑම උනන්දු කරවන්න.
7. ඉලක්ක කරගත් ප්‍රජාවක උපදේශක කණ්ඩායමක් ගොඩනැගීමේ හැකියාව සොයා බලන්න.
8. කෙනෙකුට ආරාධිත කොලමක් ලබා දෙන්න.
9. රූපවාහිනියේ හෝ පුවත්පත්හි ඔබ භාවිතා කරන පින්තූර දෙස බලන්න. ඒවා ඔබේ ජන කොට්ඨාශයේ සමබරතාවය පිළිබිඹු කරන්නේද? එක් ප්‍රකාශනයක හෝ නිවේදනයක පෙනී සිටින පුද්ගලයින් ගණන් කරන්න. එය ජනකොට්ඨාශයේ නියම පිළිබිඹුවක් ද?
10. නොසලකා හරිනු ලැබූ ජන කොට්ඨාශ තුළ ඔබගේ සම්බන්ධකම් වැඩි දියුණු කරගන්න. ඔවුන්ගේ සම්බන්ධතා එක ගොන්නකට ගෙන එන ලෙස ඔබේ වාර්තාකරුවන්ට උපදෙස් දෙන්න. අදහස වැඩියෙන් ලබා ගැනීම සඳහා බුද්ධි කලම්බනයක් කරන්න.

## විවිධත්ව පිරික්සුම් ලැයිස්තුව

වාර්තාකරුවන් හා සංස්කාරකවරුන් සඳහා සියැට්ල් ටයිම්ස් පුවත්පත විවිධත්ව පිරික්සුම් ලේඛනයක් සකස් කරන ලදී. මෙම ප්‍රශ්න එය අනුසාරයෙන් සකස් කොට ඇත.

## සංස්කාරකවරුන් සඳහා ප්‍රශ්න

1. පැවරීම් කිරීමේදී හා පළ කිරීමේදී මා විසින් විවිධත්වයට ප්‍රමුඛත්වයක් දෙනු ලබන්නේද?
2. විවිධ මූලාශ්‍ර හා ප්‍රවාදයන් හඹායෑම සඳහා මා විසින් වාර්තාකරුවන්ට අවශ්‍ය කාලය ලබා දෙන්නේ ද?
3. විවිධ ජන කොට්ඨාශවල මූලාශ්‍ර හා සම්බන්ධකම් පැවැත්විය හැකි පුද්ගලයින් වර්ධනය කර ගැනීම සඳහා මා කාර්යාලයෙන් බැහැර යන්නේද?

## වාර්තාකරුවන් සඳහා

1. මා විසින් ආවරණය කෙරෙන සංවිධානයන්හි ක්‍රියාකාරකම් විවිධ ජනගහන කොට්ඨාශවල පුද්ගලයින් කෙරෙහි කෙසේ බලපාන්නේ දැ යි සොයා බැලීමට මා උත්සුක වූයේ ද?
2. එම සංවිධානයේ බලපෑමට හසු වූ ප්‍රජාවේ ප්‍රශ්න මා විසින් සොයනු ලැබුවේ ද?
3. කතා මාතෘකාවන් හා කෝණයන් සකස් කිරීමේදී සංවිධාන, පුද්ගලයින් හා ස්ථානයන් හෝ විවිධ මාදිලීන් පුළුල් කරන්නේ කෙසේ ද?
4. මගේ සම්බන්ධකම් හා මූලාශ්‍ර පුළුල් කර ගන්නේ කෙසේද?

## කතාවක් පිළිබඳව

1. මෙම ප්‍රවාදයට මා විවිධ මූලාශ්‍ර යොදා ගනු ලැබුවේද?
2. විවිධත්වය ඇතුළත් කිරීම සඳහා මාගේ උත්සාහය කලින් ඇති කරගත් අදහස් මගින් සීමා වීමට මා විසින් ඉඩ දී තිබේද?
3. මා ජන සමූහයක් නියෝජන කිරීමට එක් පුද්ගලයෙකු සංකේතයක් ලෙස යොදා ගන්නේ ද, එසේත් නැත්නම් නියම විවිධත්වය සොයන්නේද?
4. විවිධත්වය සොයා යෑමේ දී මා ස්ථාපිත ආදර්ශ ශක්තිමත් කරන්නේද, එසේත් නැත්නම් ඊට එරෙහිව ක්‍රියා කරන්නේ ද?
5. මා එය දකින ආකාරයටම සත්‍ය ප්‍රකාශ කරන්නේ ද?
6. මෙම ප්‍රකාශනයේ ප්‍රතිඵල කෙසේ විය හැකි ද? ඉන් වේදනාවට පත් වන්නේ කවුරුන්ද, ඉන් වාසි ලබන්නේ කවුරුන් ද?
7. මගේ තීන්දුව එය අභියෝගයට ලක් කරන ඕනෑම කෙනෙකුට සාධාරණීකරණයකින් තොරව පැහැදිලිව හා අවංක ව තේරුම් කරදීමට, මට හැකියවක් තිබේද?

# මූලයෙන් ම ලබාගැනීම



**ගැහැණුන් යුද්ධයේ ගොදුරු ය.... නමුත් ඔවුන් සටන්කාරියන් මෙන් ම වෙනසට වෙනසකට කැමති අය ද වේ.**

විශිෂ්ට ජනමාධ්‍යවේදය අත්දැකීම්වල පොහොසත් බවේ ප්‍රතිබිම්භයකි. එය කළ හැක්කේ, සාමාන්‍ය මිනිසුන් ජීවත් වන සැටි, ඔවුන්ගේ බිය, බලාපොරොත්තු, ජයග්‍රහණයන් හා විපත්ති ගැන වාර්තා කිරීමට උදව් උපකාර කළ හැකි ප්‍රාථමික මූලාශ්‍ර ජාලයක් ගොඩනගා ගැනීමෙන් පමණකි. තමන්ගේ ප්‍රවෘත්ති කාමර තුළට වී ආණ්ඩුවේ පුවත්පත් නිවේදන මගින් නිල ප්‍රවෘත්ති ලැබෙන තෙක් බලා සිටින ජනමාධ්‍යවේදීන්ට මෙම සාරවත්භාවය අවබෝධ නො වනු ඇත.

මහජනයාගේ අත්දැකීම් ගැන උනන්දු වීම, ඒවාට සවන්දීම හා ඒවා වාර්තාකරණය බොහෝ ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍ය සංවිධානවලට මූලික පරිවර්තනයක් වනු ඇත. මෙයින් අදහස් වන්නේ මාධ්‍ය ආයතන ඔවුන්ගේ සම්පත්, ජනමාධ්‍යවේදීන් ප්‍රවෘත්ති මැවෙන ක්ෂේත්‍රයට මෙහෙයවා ගත යුතු බව යි.

මිනිස්සු වඩා හොඳ දිවි පෙවෙතක් අපේක්ෂා කරති. සම්පත් වඩා සාධාරණ ලෙස බෙදීයාමක් අපේක්ෂා කරති. ඔවුන්ගේ පැවැත්මට වඩා යෝග්‍ය ව්‍යුහයන් අපේක්ෂා කරති. ජනමාධ්‍යවේදීන් ඔවුන්ගේ වාර්තාකරණය මගින් ප්‍රශ්න නිරාවරණය කිරීමෙන්, ජනයාගේ අත්දැකීම් සහ ඔවුන්ගේ අපේක්ෂා කුළුගැන්වීම තුළින් මෙම ව්‍යුහය එළිදරව් කර ගැනීමට උපකාරී වනු ඇත.

තමන්ගේ කතාවන් තුළින් විවිධ මත හා අදහස් නියෝජනයට උනන්දු වන්නේ නම් තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර බැංකුවක් වර්ධනය කරගත යුතු ය. ඇලුම් සහගත පුද්ගලයෙක් හා සමග ඇතිවන සෑම සම්බන්ධතාවයක් මඟින් ම ඔබේ මූලාශ්‍ර ලැයිස්තුව, දශක ගණනාවක් තුළ ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගේ ප්‍රධාන මූලාශ්‍රය වූ ආණ්ඩුවේ පුවත් නිවේදනවලට වඩා පුළුල් කර ගැනීමට හේතු වේ. පුරුදු පිළිවෙළට වඩා වෙනස් යථා දර්ශනයක් සැලසීමට හැකි දොස්තරවරුන්, නීතිඥයින්, උගතුන් සහ ජන නායකයින් මේ සඳහා උපයෝගී කොට ගත හැක.

බහු භාෂා බහු ජනවාර්ගික ජන සමාජයක අනිකුත් ජන කොට්ඨාශ වල විශ්වසනීය මූලාශ්‍ර ඉතා වැදගත් වේ. විශිෂ්ට වාර්තාකරුවන්ට පුළුල් වූත් විවිධ වූත් මූලාශ්‍ර ජාලයක් තිබිය යුතු ය. පුළුල් මූලාශ්‍ර පද්ධතියක් තිබීමේ තවත් වාසියක් නම් තොරතුරුවල නිරවද්‍යතාවය දැනගැනීම සඳහා විකල්ප මගකින් තහවුරු කරගැනීමට හැකි වීම ය. කිසියම් සිද්ධියකදී සත්‍ය වශයෙන් ඒ අවස්ථාවේ එහි සිටි පුද්ගලයින්ගෙන් ලබාගත හැකි තොරතුරු සෑම විට ම වඩා යෝග්‍ය වේ. ඕපාදූප මගින් හා ද්විතීයික මූලාශ්‍ර මගින් ලබා ගන්නා තොරතුරු සාවද්‍ය වීමට ඉඩකඩ ඇත.

## යහපත් අභ්‍යාස කරුණු

- ඔබගේ මූලාශ්‍ර ලැයිස්තුගත කොට, එය ඔබේ සගයින් හා සමග බෙදාගන්න. වාර්තාකරුවකු වශයෙන් ඔබගේ කටයුතු ඉදිරියට ඇදී යන විට ඊට තවත් මූලාශ්‍ර එකතු කරගන්න.
- විෂයයන් ගණනාවක් කෙරෙහි විශ්වාසය තැබිය හැකි, මතයක් සැපයිය හැකි වෙනත් ආගම්වල හා ජනවාර්ගික කොටස්වල පිරිමි සහ ගැහැනු සමග සම්බන්ධතා ගොඩනැගීමට අවධානය යොමු කරන්න.

## වෙනත් කණ්ඩායම්වල ජනයා හා සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.

මාධ්‍ය විවිධත්ව ආයතනය, ජ. ජා. ස. සමග එක්ව, ජනමාධ්‍යවේදීන් සඳහා මෙම ඉඟි පිළියෙල කරන ලදී.

- සංවේදීව හා හොඳින් සිතා මතා කටයුතු කරන්න. ජනමාධ්‍යවේදියකු සමග කථා කිරීමට ජනයා බියක් දක්වන බව තේරුම් ගන්න. මුලින් ම ඔවුන් සන්සුන් කරවන්න.
- සම්මුඛ සාකච්ඡාව සම්බන්ධයෙන් ඔවුන් පනවනු ලබන කොන්දේසි තේරුම්ගෙන ඒවාට ගරු කරන්න. ඔවුන්ගේ නම් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් තිබේද නැද්ද යන්න ගැන පැහැදිළි කරගන්න.
- සම්මුඛ සාකච්ඡාව පවත්වන ස්ථානය තෝරා ගන්නේ ඔබ නම්, ඔවුන්ට සුව පහසුව දැනෙන ස්ථානයක් තෝරාගන්න.
- ඔවුන් කැමති ලෙස ඔවුන්ගේ කථාව කීමට ඉඩ හරින්න. ඔවුන්ට අවශ්‍ය අවුරුදු 5 කට හෝ 10 කට පෙර සිදු වූ දෙයකින් කථාව ආරම්භ කිරීමට නම්, ඔබට දැන ගැනීමට උවමනා දෙයට එය සම්බන්ධ නැති වුවත්, ඊට ඉඩ දෙන්න.
- නම්‍යශීලී වන්න. සාකච්ඡාවට පෙර ඇසිය යුතු ප්‍රශ්න ලැයිස්තුවක් සූදානම්ව තබා ගන්න. එහෙත් එය පොදු මගපෙන්වීමක් ලෙස පාවිච්චි කරන්න. ඔබේ ප්‍රශ්නය යොමු කිරීමෙන් පසු පරීක්ෂාකාරී ව ඔවුන් කියන දේ ට ඇහුම්කන් දෙන්න. වෙනත් ප්‍රවිෂ්ඨවීමකට ද ඉඩ පැදෙනු ඇත.
- ඔවුන්ගේ ජීවිත ගතකළයුතු ආකාරය ගැන බණ දේශනා නො කරන්න. ඔබ ඔවුන් සමඟ සාකච්ඡා කරන්නේ ඔබට වඩා හොඳින් ඔවුන් ඔවුන්ගේ තත්වය තේරුම් ගෙන සිටින බැවිනි.
- ඔවුන් අයත්වන සුළු ජන කොට්ඨාශය කෙරෙහි ඔබගේ ඇති පූර්ව නිගමනයන් ගැන ඔබට ම හඳුන්වා දෙන්න.
- ඔබට තොරතුරු සපයන්නන් විශේෂඥයින් බව අමතක නො කරන්න. විශේෂඥයකු වීමට දොස්තර කෙනෙකු හෝ විද්‍යාඥයකු වීම අවශ්‍ය නොවේ. ඔබගේ තොරතුරු සපයන්නන් ඔවුන්ගේ ජීවිත පිළිබඳ විශේෂඥයෝ ය. ඔබට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ ජීවිත හා අත්දැකීම් ඔවුන් ලවා විස්තර කර ගැනීමයි. ඔබගේ කාර්යය වනුයේ ඒවා ඔබගේ පාඨකයින් වෙත දැන්වීමයි.
- සාකච්ඡාව අවසානයේ දී, සම්මුඛ සාකච්ඡාවන් පැවැත්විය හැකි වෙනත් අය සිටිනවාදැ යි ඔවුන්ගෙන් විමසන්න. එය මෙම ලිපියට මෙන් ම අනාගතයේ ලියන ලිපි වලට ද අවශ්‍ය වන වෙනත් මූලාශ්‍ර සොයා ගැනීමේ වැදගත් ක්‍රමයකි.
- සියල්ලට ම වඩා මෙම තොරතුරු භාවිතා කරන ආකාරය ගැන ප්‍රවේසම් වන්න. ඔවුන් ගැන ලියන විට සැලකිලිමත් ව හා දයානුභරිත ව එය කරන්න.

# ජ. ජා. ස. ගැටුම් වාර්තාකරණ මඟපෙන්වීම්

ගැටුමේ තියුණු බව අඩුකිරීමට, දේශපාලන ස්ථාවරභාවය සහ මිනිස් අයිතිවාසිකම්වලට ඇති ගෞරවය වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාවේ මාධ්‍යයට හැකියාවක් ඇත. අවුරුදු ගණනාවක් තුළ පැවති දේශපාලන හා සමාජ අස්ථිරභාවය සමග 2004 සුනාමි ව්‍යසනයේ බලපෑම හේතුවෙන් මීට කලින් කිසිදා නො වූ තරම් වැදගත් කාර්යභාරයක් මාධ්‍යයට දැන් පැවරී තිබේ. ලොව වටා ගැටුම් අවස්ථාවන් සමඟ වැඩ කරන ජනමාධ්‍යවේදීන් විසින් සකස් කරන ලද මඟපෙන්වීම් සමඟ මෙම උපදෙස් ඒකාබද්ධ කොට ඇත. මෙම උපදෙස් මෙහි දක්වා ඇත්තේ සලකා බැලීම සඳහා වන අතර ඒවා කිසිසේත් ම පරිපූර්ණ නො වේ.

## කරුණුවල නිරවද්‍යතාව

විවිධ වූ සහ විශ්වසනීය වූ තොරතුරු මූලාශ්‍ර බැංකුවක් ගොඩනගා ගැනීම මගින් ජනමාධ්‍යවේදීන්ට ඉක්මණින් තොරතුරු ලබාගත හැකි අතර ඒවායේ නිරවද්‍යතාව ද සහතික කර ගත හැක. ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේදීන්ගේ අත්දැකීම් හා ආකල්ප සම්බන්ධයෙන් ජ. ජා. ස. විසින් කරන ලද සමීක්ෂණයෙන්, නිරවද්‍යතාව සඳහා විකල්ප මගකින් නිවැරදිතාව තහවුරු කර ගැනීමේ වැදගත්කම පෙන්වා දෙන ලදී. කිසිදු මූලාශ්‍රයකින් නිකුත්වන නිවේදනයක් එහි මුහුණත අගය මත පිළිගත යුතු නො වන්නේ, 'නිල' මූලාශ්‍ර වුව ද සාවද්‍ය විය හැකි බැවිනි.

කිසියම් වරදක් සිදුවූ විට හැකිතාක් ඉක්මණින් වරද පිළිගෙන එය නිවැරදි කළ යුතු වේ.

## සමබරතාව

ගැටුම් අවස්ථා කිසි ම විටක සුදු - කළු නොවේ. එබැවින් සියලු ම පාර්ශවයන්ගේ අදහස් පරීක්ෂා කර බලා ඔවුන්ගේ යථා දර්ශන ඇතුළත් කළ යුතු ය.

නිල ප්‍රකාශ සහ මතුපිටින් පෙනෙන දේ ඉක්මවා යෑම ජනමාධ්‍යවේදියකුට වැදගත් කාර්යයක් වේ.

## සංවේදීතාව

අනවශ්‍ය ලෙස ජාතිය, ආගම හෝ ජනවාර්ගිකභාවය සඳහන් කිරීම සමහරු නුරුස්නා අතර එමගින් එක්කෝ ඒකාකාරී පුද්ගලයින් අවුළුවාලීමට හෝ අන් අයට උපකල්පන නිර්මාණය කරවීමට හෝ පුළුවන. ඒ මෙන් ම, අපක්ෂපාතී ලෙස පෙනෙන වචන හෝ වාක්‍යාංශ ඇතැම් කණ්ඩායම්වලට සෘණාත්මක ඇඟවීමක් විය හැක. මෙය වළක්වාගැනීමට ආකාර කීපයක් වේ. ප්‍රථමයෙන් ම ඔබ තුළ ඇති පූර්ව විනිශ්චයන් තේරුම් ගැනීමට අවශ්‍ය වේ. දෙවනුව, කියනු ලබන දෙයට මහජනයා ප්‍රතික්‍රියා දක්වන ආකාරය ගැන සිත් හි තබාගෙන වාර්තාවෙහි අඩංගු කිරීමට ඔබ තෝරා ගන්නා දේ කෙරෙහි එය බලපැවැත්වීමට ඉඩ හරින්න. තුන්වෙනු ව, හැකි අවස්ථාවලදී වචනයෙන් විස්තර කිරීමට යන්ත දැරීමේදී ව්‍යාකූලත්වයක් හෝ වැරදි වැටහීමක් ඇතිවිය හැකි දේවල් සන්නිවේදනය කිරීම සඳහා ඡායාරූප භාවිතා කරන්න.

## සන්දර්භය

සිද්ධීන් ඒවායේ ඓතිහාසික සන්දර්භයක් තුළ පිහිටුවීමෙන් පාඨකයින්ට වර්තමාන වර්ධනයන් වඩා හොඳින් වටහා ගැනීමට හැකියාවක් ලැබේ. සන්දර්භයෙන් පරිබාහිර වූ විට පළල් චිත්‍රය නො පෙනී ගොස් වෙනසකට හෝ සංශෝධනයට ඇති ඉඩ ප්‍රස්ථා ද අසුරනු ලැබේ. කෙසේ වෙතත්, විවිධ කණ්ඩායම්වලට සිද්ධිය බලපෑ ආකාරය තෙවෙනි පාර්ශවයකින් විමසීමට හෝ උපකල්පනය කිරීමට හෝ වඩා එයින් සෘජු ව බලපෑමට ගොදුරු වූ අයගෙන් විමසීම වඩා යෝග්‍ය වේ. සන්දර්භය, ගැටුම් වාර්තාකරණයේ වැදගත් අංගයක් නියෝජනය කරන අතර, එමගින් අදාළ ප්‍රශ්න පාඨකයන් තේරුම් ගත් බව සහතික වන අතර, ඔවුන් මංමුළා වීමෙන් වළක්වාලයි. ඊටත් වඩා නරක ප්‍රතිඵලයක් වන උදාසීන වීමෙන් ද වළක්වාලනු ලබයි.

## වගකීම

ඉහළ මට්ටමේ අවධානයක් සහ වගකීමක් නොමැති තත්ත්වයක් යටතේ, ගැටුම් වාර්තාකරණය මගින් පවතින ආතතීන් වැඩිවිය හැකි අතර, ආණ්ඩු විසින් කරනු ලබන දේශපාලන හැසිරවීම් සඳහා මාවත විවෘත වනු ඇත. ගැටුම් වාර්තාකරණය මනා වැටහීමකින් හා වගකීමකින් කළ යුතු කාර්යයකි. ඇතැම් නිවේදන, සිරස්තල, ඡායාරූප හෝ ප්‍රවෘත්ති අන්තර්ගතය ජනතාවට, විශේෂයෙන් ම සුළු ජන කණ්ඩායම්වලට අහිතකර ලෙස බලපෑම වැළැක්වීම සඳහා කල්පනාකාරී ව සිටිය යුතු ය.

## යහපත් ව්‍යවහාරය සඳහා ප්‍රශ්න

1. ඔබ ඔබගේ වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර, ගැටුමට පාදක වූ සත්‍ය හේතූන් ඔබ ඇත්ත වශයෙන් ම දන්නේ දැ යි ඔබ ඔබෙන් ම විමසා බලන්නේ ද?
2. ඔබගේ මාධ්‍ය ආයතනය නිරන්තර ව ප්‍රවෘතියක සියලු පැතිකඩ ගැන වාර්තා කරන්නේ ද? එසේ නැත්නම් විශ්වාසය තබන්නේ ආණ්ඩුවේ නිල ස්ථාවරයන් කෙරෙහිද?
3. කෙනෙකුගේ ජනවාර්ගිකත්වය සඳහන් කිරීම උචිතයැ යි ඔබ තීන්දු කරන්නේ කෙසේද?
4. අපරාධ සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ අයගේ හෝ සැකකරුවන්ගේ ජනවාර්ගික ප්‍රභවය සඳහන් කිරීම පිළිබඳ ව ඔබේ ප්‍රකාශනයේ හෝ විකාශන නාලිකාවේ ප්‍රතිපත්තිය කුමක්ද?
5. අපරාධයක් හෝ නොසන්සුන්කමක් අදාල අනිකුත් කරුණු පිළිබඳ නිසි පරීක්ෂණයකින් තොර ව ජනවාර්ගික නොසන්සුන් බව මත පැටවීම නිතර සිදුවේද?
6. වෙනත් ජනවාර්ගික ප්‍රජාවක් අතර ප්‍රාථමික තොරතුරු සපයන්නන් වර්ධනය කර ගන්නේ කෙසේද?
7. අපරාධ, ප්‍රචණ්ඩත්වය ආදී ඇතැම් ප්‍රශ්න හා සම්බන්ධ කරමින් ජනවාර්ගික හෝ වෙනත් සුළු ජන කොටස් පිළිබඳව සෑම විට ම සඳහන් වන්නේද? ඔබ විසින් ඔවුන්ට පිළිතුරු දීමට කවර විටකදී හෝ අවස්ථාවක් දී තිබේද?
8. ඔබගේ ප්‍රකාශනයේ, රූපවාහිනියේ හෝ ගුවන් විදුලි විකාශනාගාරයේ වාර්තා ඔබගේ ප්‍රකාශකයාගේ, සංස්කාරකවරුන්ගේ හෝ වාර්තාකරුවන්ගේ ජනවාර්ගිකත්වය හෝ ආගම මගින් බලපෑමකට ලක් වන්නේ ද?
9. ගැටුම්වල යෙදෙන පුද්ගලයින් ඔවුන්ගේ ආගම හෝ ජනවාර්ගිකභාවය හේතුකොටගෙන ඔවුන් ව එක්තරා ආකෘතියකට හිර කිරීම හෝ ලේබලයක් ඇලවීම ඔබගේ මාධ්‍ය ආයතනය කරන්නේ යයි ඔබ සිතන්නේ ද?

# ආරක්ෂා සහිත ජනමාධ්‍යවේදයක් සඳහා වන ජ. ජා. ස. ජාත්‍යන්තර ක්‍රියාමාර්ග පද්ධතිය

අන්තරායකාරී තත්ත්වයන් යටතේ සහ ගැටුම් කලාපවල සේවයේ නියුතු ජනමාධ්‍යවේදීන් හා මාධ්‍ය කාර්යමණ්ඩල මුහුණපාන අනතුරු විස්තරාත්මක වාර්තාවක විෂය පථය වේ. පසුගිය අවුරුද්ද තුළ පමණක් පුවත්පත් කලාවේදීන් හා මාධ්‍ය කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ මරණ 124 ක් ජ. ජා. ස. විසින් වාර්තාගත කොට ඇත.

බොහෝ ජනමාධ්‍යවේදීන් යුද කලාප තුළ මරණයට පත්වූයේත්, තුවාල ලැබුවේත්, අඩන්තේට්ටම්වලට ලක්වූයේත් එක් පාර්ශවයක හෝ අනික් පාර්ශවයේ ප්‍රචණ්ඩ වෙඩි ප්‍රහාරයකට ලක්වීමෙනි. අනෙක් අය කල්තබා සැලසුම් කළ අපරාධකරුවන්ගේ, ත්‍රස්තවාදීන්ගේ හෝ රජයේ නියෝජන ආයතන වන පොලිසිය, හෝ ආරක්ෂක හමුදා රහසේ හෝ නීති විරෝධී ලෙස කරන ලද පහරදීම් හා බියවැද්දීම් හේතුවෙනි.

බොහෝවිට ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍ය සංවිධානවලට අනතුරුවලින් බේරීමට කළ හැකි දේ ඉතා අල්ප ය. ආරක්ෂාව සැලසීමට කොතරම් අවධානය යොමු කරනු ලැබුව ද අනිවාර්යයෙන් ම අනතුරු සිදුවේ.

කෙසේ වෙතත් තම කාර්යමණ්ඩලයට ඇති අවදානම අවම කරගැනීම සඳහා ජනමාධ්‍යවේදීන් හා මාධ්‍ය සංවිධාන විසින් ගතයුතු පියවරයන් කීපයක් වේ. විශේෂයෙන්, මෙහි පහත දැක්වෙන කරුණු ආරක්ෂාව සැලසීම සම්බන්ධයෙන් වැදගත් වේ.

ප්‍රමාණවත් සූදානම, පුහුණුව හා සමාජ ආරක්ෂණය අසීරු අවස්ථා පැන නැගුණ විට ජනමාධ්‍යවේදීන් හා මාධ්‍ය කාර්යමණ්ඩල සූදානම් තත්ත්වයක සිටීම අත්‍යවශ්‍ය ය. පුද්ගලයින් ට සෞඛ්‍ය පහසුකම් හා සමාජ ආරක්ෂණය සපයන වැඩ පිළිවෙළක් තිබිය යුතු ය.

මාධ්‍ය වෘත්තිකයින් දැනුවත් වී සිටිය යුතු අතර, කාර්ය සාධනයේ නිරත වී සිටින දේශපාලන, භෞතික හා සමාජ පරිසරය කෙරෙහි දැනුමක් ලබා ගත යුතු ය. නො දැනුවත්කමින් හෝ නො සැලකිලිමත්කමින් ඔවුන් අවිනිශ්චිත හා අවදානම් තත්වයට දායක විය යුතු නැත.

වාණිජ්‍ය වාසි තකා අවදානම් දැරීමෙන් මාධ්‍ය ආයතන ආරක්ෂා විය යුතු ය. අන්තරායකාරී විය හැකි තත්ත්වයක් පවතින විට ජනමාධ්‍යවේදීන් අතර සහයෝගය වර්ධනය කළ යුතු ය.

ජනමාධ්‍යවේදයට ඇති බාධකයන් ආණ්ඩු විසින් ඉවත් කළ යුතු ය. අනවශ්‍ය ලෙස ජනමාධ්‍යවේදීන්ගේ නිදහස් සංචලනයට ඔවුන් විසින් සීමා පැනවිය යුතු නොවේ. එමෙන් ම, තොරතුරු එකතු කිරීම, නිෂ්පාදනය කිරීම හා බෙදාහැරීම ආරක්ෂිත හා නිරුපද්‍රිත තත්ත්වයන් යටතේ කිරීම සඳහා ප්‍රවෘත්ති මාධ්‍යයට ඇති අයිතියට බාධා පැමිණවිය යුතු නොවේ.

මහජනයා මාධ්‍යයට ඇඟිලි ගැසිය යුතු නැත. රූප පටිගත කිරීමක් හෝ වෙනත් ජනමාධ්‍යයට අදාළ කටයුතු වලට අවහිර කිරීම් තහනම් කළ යුතු ය.

මේවා සිත් හි දරාගෙන, ජනමාධ්‍යවේදීන්ගේ කණ්ඩායම්වලට, මාධ්‍ය සංවිධානවලට හා අදාළ සියලු ම මහජන බලධාරීන්ට පහත දැක්වෙන කරුණු කෙරෙහි ගරු කරන ලෙස ජ. ජා. ස. ආරාධනා කරයි.

1 ජනමාධ්‍යවේදීන් සහ අනිකුත් මාධ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා, ඔවුන්ට පැවරෙන සියලු කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය දේ ලබාදිය යුතු ය. මෙයට ප්‍රථමාධාර ද්‍රව්‍ය, සන්නිවේදන මෙවලම්, අවශ්‍ය පරිදි ප්‍රවාහන පහසුකම් සහ අවශ්‍ය අවස්ථාවලදී ආරක්ෂිත ඇඳුම් පැළඳුම් අයත් වේ.

2 භයානක තත්ත්වයන් පවතින හෝ එවැනි තත්ත්වයන් ඇති වේ යයි සාධාරණව උපකල්පනය කළ හැකි ප්‍රදේශවල කාර්ය පැවරීමක් පැනවීමට ඉඩ ඇති ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මාධ්‍ය සංවිධාන විසින් හෝ සුදුසුයයි හැඟෙන අවස්ථාවලදී රාජ්‍ය බලධාරීන් විසින් හෝ අවදානම් අවස්ථාවල දැනුවත් වීමේ පුහුණුවක් ලබා දිය යුතු ය.

3 මහජන බලධාරීන් ඔවුන්ගේ සේවක පිරිසට පුවත්පත් කලාවේදීන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන ලෙස දැන්විය යුතු අතර, ජනමාධ්‍යවේදීන් හෝ මාධ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් හෝ ඔවුන්ගේ කාර්යසාධන කටයුතුවල නියැලෙමින් සිටියදී ඔවුන්ගේ ශාරීරික පූර්ණත්වය (Physical Integrity) ගරු කරන ලෙස උපදෙස් දිය යුතු ය.

4 සාමාන්‍යයෙන් සේවය කරන ස්ථානයෙන් බාහිරව රාජකාරියේ නිරත වන සියලුම දෙනා හට මාධ්‍ය සංවිධාන විසින් ජීවිත රක්ෂණය ඇතුළු සමාජ ආරක්ෂාව සැලකිය යුතු ය.

5 සාමාන්‍යයෙන් සේවය කරන ස්ථානයෙන් බාහිරව වැඩ කටයුතු කරන අතරතුර තුවාලවීම් හා අසනීප වීම් වලට ගොදුරු වූ පුවත්පත් කලාවේදීන්ට සහ මාධ්‍ය සේවකයින්ට, උප සටහන් හා සම්පූර්ණ පුවත් ලබන කාලයේ පිරිවැය ද ඇතුළුව වෛද්‍ය ප්‍රතිකාර සහ ශාරීරතා සෞඛ්‍යය නොමිලේ මාධ්‍ය ආයතන විසින් ලබා දිය යුතු ය.

6 මාධ්‍ය ආයතන විසින් නිදහස් මාධ්‍යවේදීන් සහ අර්ධ කාලීන සේවකයින් ආරක්ෂා කළ යුතු ය. සමාන පදනමක් යටතේ, පූර්ණ කාලීන සේවයේ යෙදෙන සේවක මණ්ඩලයට ලබා දෙන සමාජ ආරක්ෂණය, පුහුණුවට ඇති අවස්ථා සහ මෙවලම් ඔවුන්ටද ලබා දිය යුතු ය.

## ප්‍රයෝජනවත් මූලාශ්‍ර සහ ආශ්‍රිත ග්‍රන්ථ ලේඛනය

ක්‍රිස් හෙජස්, නිව්යෝර්ක් ග්‍රන්ථ සමාලෝචනය : යුද්ධය ගැන

ක්‍රිස් හෙජස් : යුද්ධය යනු අපට අර්ථයක් ගෙන දෙන බලවේගයකි. ඇන්කර් පොත් 2002

නිලුෆර් ද මෙල් : ප්‍රසිද්ධ නොකළ ලිපිය - 2005

බ්‍රෙන්ට් කනිංහම් : කොලම්බියා, පුවත්පත් කලා සමාලෝචනය

ගැටුම්කරණය සම්බන්ධයෙන් වාර්තා කරන පුවත් පත් කලාවේදීන්ට ප්‍රයෝජනවත් විය හැකි සම්පත් ඇති සංවිධාන රාශියකි. ඒවා අතර,

මාධ්‍ය විවිධත්ව ආයතනය ලන්ඩනයේ පිහිටා ඇති අතර, ආර්මේනියා, අසර්බයිජාන් සහ ජෝර්ජියාහි කාර්යාල පිහිටුවා තිබේ. මා. වි. ආ. මාධ්‍ය සංවිධාන, පුවත්පත් කලාවේදීන්, පුවත් කලාව උගන්වන්නන්, ආණ්ඩුවේ නොවන සංවිධාන සහ ආණ්ඩු සමග විවිධත්ව සම්බන්ධ ප්‍රශ්න කෙරෙහි සාධාරණ, සංවේදී හා නිරවද්‍ය ආවරණයන් සඳහා කටයුතු කරයි. www.media.diversity.org

යුද්ධය හා සාමය වාර්තාකරණ ආයතනය ලන්ඩන්හි පිහිටා ඇති අතර, ගිනිකොණ යුරෝපයේ සහ ආසියාවේ කාර්යාල පවත්වාගෙන යනු ලබයි. සමබර හා නිරවද්‍ය වාර්තාකරණය සඳහා දේශීය පුවත් පත් කලාවේදීන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් ගැටුම්වලින් විපතට පත් ප්‍රදේශවල දේශීය පුවත් පත් කලාව ශක්තිමත් කිරීම මෙම සංවිධානයේ අරමුණයි. www.iwpr.net

එක්සත් ජනපදයෙහි පවත්වාගෙන යනු ලබන පොයින්ටර් ආයතනය පුහුණුව මගින් ස්වාධීන පුවත් පත් කලාවේ අගය ඉහළ නැංවීමට කටයුතු කරයි. එහි සම්පත් ගහණ වෙබ් අඩවිය. www.pointer.org

එක්සත් රාජධානියේ පිහිටා ඇති 'රිපෝර්ටිං ද වර්ල්ඩ්' ආයතනය ගැටුම් හා ජාත්‍යන්තර පුවත් සම්බන්ධයෙන් මතුවන නියෝජන හා වගකීම පිළිබඳ ගැටලු ගැන පුවත්පත් කලාවේදීන් සහ අනිකුත් අය අතර නොනවතින සංවාදයක් පවත්වාගෙන යෑමට උත්සාහ දරයි. www. reportingtheworld.org.uk

ඩෙන්මාර්ක් හි පිහිටා ඇති ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිත්වය ගැටුම් පවතින හා ඇතිවීමට ඉඩ ඇති ප්‍රදේශවල ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීම සඳහා ආධාර සහ අනුබල දීමට කැප වූ සංවිධානයකි. www. i-m-s.dk

කැනඩාවේ පිහිටුවා ඇති මාධ්‍යය, ප්‍රතිපත්ති සහ සිවිල් සමාජය සඳහා වන ආයතනය, පුණ්‍ය ආයතනයක් වන අතර වගකීමකින් යුත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාධ්‍යයනට සහ ප්‍රජාතන්ත්‍රවාදය වැඩි දියුණු කරන්නා වූ ආණ්ඩු ප්‍රතිපත්තිවලට ආධාර කරනු ලැබේ. www. impacs.org

කොළඹ පිහිටා ඇති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, එහි ප්‍රධාන අරමුණ ලෙස දක්වෙන්නේ ගැටුම් නිරාකරණය සඳහා ප්‍රචණ්ඩකාරී නොවන විකල්ප ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටින සහ එම ප්‍රතිපත්ති ව්‍යාප්ත කිරීමෙහි නිරත වීම යි. ප්‍රධාන සමීක්ෂණ වැඩ කොටසක් ඉටු කරන මෙම සංවිධානය නිරවද්‍ය, විශ්වසනීය හා පූර්ව විනිශ්චයන්ගෙන් තොර වාර්තාකරණය දිරිගන්වයි. www. cpalanka. org

International Federation
of Journalists
President: Christopher Warren
General Secretary: Aidan White

IFJ Headquarters
International Federation of Journalists
Residence Palace, Block C
155 Rue de la Loi
B-1040 Brussels
Belgium
Telephone: +32 2 235 22 00
Telefax: +32 2 235 22 19
E-Mail: ifj@ifj.org
Website: www.ifj.org

IFJ Asia-Pacific
245 Chalmers Street
Redfern NSW 2016 Australia
Telephone: +61 2 9333 0999
Fax: +61 2 9333 0933
Email: ifj@ifj-asia.org
Website: www.ifj-asia.org

IFJ South Asia Office
Mobile: +91 9818 383 669
Email: ifjsouthasia@hotmail.com

IFJ South East Asia Office
c/- Aliansi Jurnalis Independen (AJI)
Jl. Danau Poso No. 29
Blok D.1
Bendungan Hilir
Jakarta Pusat 10210
Indonesia
Telephone: +62 21 579 00 489
Fax: +62 21 571 10 63
E-mail: ajioffice@aji-indonesia.or.id
sekretariat_aji@yahoo.com

IFJ Sri Lanka Office
c/- CPA
24/2, 28th Lane, Off Flower Road
Colombo 07 Sri Lanka.
Telephone: +94 11 4714460
Fax: +94 11 2565304/6
Email: ifjsrilanka@cpalanka.org

IFJ Tokyo
Itoh Building 203
Kudan Minami 4-2-12
Chiyoda-Ku, Tokyo
Japan T102-0074
Telephone/Telefax: +81 3 3239 4055
Email: ifj-tokyo@triton.ocn.ne.jp

IFJ Africa
17, Boulevard de la République,
BP 21 722
Dakar Sénégal
Telephone: +221 842 01 42/ 842 01 41
Fax: +221 842 02 69
Email: fijafrica@sentoo.sn
Website: http://www.ifjafrique.org

IFJ Europe (EFJ/IFJ)
Residence Palace
Rue de la Loi 155
B-1040 Brussels
Belgium
Telephone: +32 2 235 22 02
Telefax: +32 2 235 22 19
E-Mail: efj@ifj.org

IFJ Latin America
c/- SNTP
Casa Nacional de Periodistas
Oficina 3, piso 2, Ala B
Avenida Andres Bello,
entre Las Palmas y La Salle
Caracas Venezuela
Telephone: +58 212 793 19 96
Telefax: +58 212 793 28 83
E-Mail: sntp@reacciun.ve